දෘෂ්ටිය

පුවත් සඟරාව
2026 ජූලි



සුව විදු පියසේ සියවස්
සම්ප්‍රාප්තිය

1926 - 2026
NIHS
Anniversary

එන්නත් ලොව විප්ලවයක්

ලොව වෛද්‍ය ඉතිහාසයේ නව යුගයක් සනිටුහන් කරමින් කෘත්‍රිම බුද්ධි (AI) තාක්ෂණය මුළුමනින් ම භාවිත කරමින් නිර්මාණය කළ ලොව ප්‍රථම එන්නත මිනිස් සායනික පරීක්ෂණ (Clinical Trials) සඳහා යොමු කර තිබෙනවා. මේ සුවිශේෂ තාක්ෂණික ජයග්‍රහණය අත්කරගෙන ඇත්තේ ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්හි පිහිටි ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයේ (Flinders University) වෛද්‍ය පර්යේෂකයන් කණ්ඩායමක්.

නව එන්නතක් හෝ ඖෂධයක් හෝ පර්යේෂණාගාර මට්ටමේ සිට වෙළෙඳපොළ දක්වා සංවර්ධනය කිරීමට වසර ගණනාවක් සහ ඩොලර් මිලියන ගණනක පිරිවැයක් දැරීමට සිදු වෙනවා. එහෙත් මේ කෘත්‍රිම බුද්ධි තාක්ෂණයේ මැදිහත්වීමත් සමඟ එම බාධක සියල්ල බිඳ වැටී ඇති අතර ඉතා කෙටි කාලසීමාවකදී අවම පිරිවැයකින් ඖෂධ සංවර්ධනය කිරීමේ හැකියාව විද්‍යාඥයන් සතු වී තිබෙනවා. මෙහි සායනික පරීක්ෂණ සිදු කරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික සෞඛ්‍ය ආයතනයේ (NIH) මූල්‍ය දායකත්වය ඇති ව. මෙය ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සිදු වූ දැවැන්ත විප්ලවයක්.

මේ නව එන්නත ස්වාධීන ව සැලසුම් කිරීමට භාවිත කර තිබෙන්නේ 'SAM' (Search Algorithm for Ligands) ලෙස හැඳින්වෙන විශේෂිත කෘත්‍රිම බුද්ධි වැඩසටහනක්. ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නිකොලායි පෙට්‍රොව්ස්කිගේ (Nikolai Petrovsky) මෙහෙයවීමෙන් නිපද වූ මේ AI පද්ධතියට, මිනිස් ප්‍රතිශක්තිකරණ පද්ධතිය උත්තේජනය කළ හැකි රසායනික සංයෝග සහ අසාර්ථක සංයෝග පිළිබඳ දත්ත මුලින් ම ලබා දී පුහුණු කර තිබෙනවා. ඉන්පසු එම AI පද්ධතිය ම ස්වයංක්‍රීය ව රසායනික සංයෝග ට්‍රිලියන ගණනක් විශ්ලේෂණය කර, දැනට පවතින සංයෝගවලට වඩා ප්‍රබල මිනිස් ප්‍රතිශක්තිය උපරිමයෙන් ඉහළ නැංවිය හැකි නවතම සංයෝගයක් (Adjuvant) සොයා ගැනීමට සමත් වුණා.

මේ එන්නත ලොව පවතින ප්‍රධාන ගෝලීය සෞඛ්‍ය ගැටලුවක් වන උණ රෝග (Influenza) සඳහා වන එන්නත්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අතිරේක උත්තේජකයක් ලෙස ක්‍රියා කරන අතර සතුන් යොදාගෙන කළ පරීක්ෂණවලදී තහවුරු වී ඇත්තේ දැනට පවතින එන්නත්වලට වඩා ඉහළ ආරක්ෂාවක් සහ සාර්ථකත්වයක් මෙයින් පෙන්නුම් කරන බව.

එම්. එම්. මදුසංක කුමාර



ප්‍රධාන විද්‍යාඥයා එන්නත් මූලාකෘතිය සමඟ

දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 48, කලාපය 07,
2026 ජූලි

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

සංස්කරණ මණ්ඩලය
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
එච්. එස්. කේ. ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
ඩබ්. එම්. ශාන්තප්‍රිය

සංස්කාරක
මාලා මල්කාන්ති පරණගමගේ

රූ රටා සංස්කාරක
සංජීව පෙත්තාවඩු

විශේෂාංග ලේඛක
රංගිකා අබේසේකර

ඡායාරූප
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය

මුද්‍රණය
ආර්. එස්. ප්‍රින්ටෙක් (පුද්) සමාගම
නො. 765/2, වඩුවේගම පාර, මල්වාන

ප්‍රකාශනය හා බෙදාහැරීම
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

හිතවත් පාඨකයිනි,

48 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

සංස්කාරක

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

කවරයේ කතාව



25

සුව විදු පියසේ සියවස්
සම්ප්‍රාප්තිය



03
දහසක දහසක්



10
83 ජූලි පැල්ලම



20
ප්‍රංශ විප්ලවයේ ගිනි පුපුර



36
කියවීමක් 'ස්පයින් ස්ටාර්ස්'



40
රෝම වික්‍රමය

දෙසතිය

පුවත් සඟරාව

දෙසතිය

සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1920.00

අර්ධ වාර්ෂික දායකත්වය රු. 960.00

මාර්ගගත මුම්මෙදිය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරුපත හා සඟරා දායකත්ව කුපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

මුදල් අණුවුම් එවීමේදී

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට' ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත වෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name .....

Address .....

.....

.....

.....

.....

.....Tel / Mobile .....

ID Number .....

Signature .....Date.....

මහජන යුතුකම

මේ දිනවල රටේ ශීඝ්‍රයෙන් පැතිර යන බෝ වන රෝග කෙරෙහි සෞඛ්‍ය අංශවල මෙන් ම පොදුවේ සාමාන්‍ය ජනතාවගේ ද අවධානය යොමු වී තිබෙනවා. එලෙස ව්‍යාප්ත වෙමින් තිබෙන්නේ ඩෙංගු උණ, මී උණ, වෛරස උණ, ඉන්ෆ්ලුවෙන්සා, මෙනින්ජිටිස් (Enteroviral Meningitis) වැනි උණ වර්ග කිහිපයක්.

ඩෙංගු රෝගය වසංගතයක් මෙන් පැතිර යද්දී එහි ඇති අවදානම සැලකිල්ලට ගනිමින් ජාතික මට්ටමින් ඩෙංගු මර්දන වැඩසටහන් සංවිධාන කෙරුණා. ඒ අනුව ජූනි මස 08-10 දක්වා ඩෙංගු මර්දන වැඩසටහනක් ද ජූනි 15-20 දක්වා ජාතික ඩෙංගු මර්දන සතියක් ද ඩෙංගු පැතිරීම ශීඝ්‍රයෙන් සිදුවන කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, රත්නපුර, කෑගල්ල, නුවර, මාතලේ, මඩකළපුව සහ බදුල්ල යන දිස්ත්‍රික්ක 14ක ක්‍රියාත්මක වුණා. ඉදිරියටත් එවැනි ඩෙංගු මර්දන වැඩසටහන් රට පුරා ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගනිමින් සිටින්නේ ඉහළ යන රෝග ව්‍යාප්තිය පාලනයට.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඩෙංගු මර්දන ඒකකය දිස්ත්‍රික්ක 14ක වෛද්‍ය නිලධාරී කොට්ඨාස 72ක කළ තෙදින ඩෙංගු මර්දන වැඩසටහන සිදු කළේ නිවාස, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ආගමික ස්ථාන, කර්මාන්ත පරිශ්‍ර, වැඩබිම්, පාසල්, වෙළෙඳසල්, හිමිකරුවන් නොමැති පෞද්ගලික ඉඩම් හා ගොඩනැගිලි, රජයේ ඉඩම් හා ගොඩනැගිලි, හිස් ඉඩම් සහ අනෙකුත් ස්ථාන ඇතුළු ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ මහජන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හඳුනාගත් අධි අවදානම් ප්‍රදේශ ද ඉලක්ක කර ගනිමින්.

තෙදින ඩෙංගු මර්දන වැඩසටහනේදී පරීක්ෂාවට ලක් කළ සමස්ත පරිශ්‍ර 97,871ක් අතුරින් ඩෙංගු මදුරු කීටයන් සහිත පරිශ්‍ර 6,268ක් හමු වී තිබෙනවා. එහිදී ඩෙංගු මදුරුවන් බෝ විය හැකි අවදානම් පරිශ්‍ර 25,626ක් තිබී ඇති අතර වැඩි ම මදුරු කීට ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ කර්මාන්තශාලා සහ ඉදිකිරීම් බිම්වල. එසේ ම පසුව කළ පරීක්ෂා කිරීම්වලදී පාසල් පරිශ්‍ර දැඩි ලෙස ඩෙංගු අවදානමට ලක් වී තිබෙන බව අනාවරණය වී තිබෙනවා. මෙයින් පෙනී යන්නේ රටේ සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් පවත්වාගෙන යාමට ජනතාව උනන්දුවක් නොදක්වන අතර ම ඔවුන්ට එහි පවතින අවදානම පිළිබඳ තවමත් වැටහී නොමැති බවක්. අනෙකුත් පළාත්වලට වඩා බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වලින් වැඩි වශයෙන් ඩෙංගු රෝගීන් වාර්තා වෙමින් තිබෙන අතර ජූනි 23 දින වනවිට 50,000කට ආසන්න ව වාර්තා වන ඩෙංගු රෝගීන්ගෙන් රෝහල් ද පිරී ගොස් ඇති බවයි අනාවරණය වන්නේ. ඒ අතර සැලකිය යුතු ලෙස පුද්ගල මරණ ද වාර්තා වෙමින් තිබෙනවා. දිස්ත්‍රික්ක 14කට අයත් ග්‍රාම නිලධාරී වසම් 538ක් අධි අවධානම් කලාප ලෙස ප්‍රකාශයට පත් කර තිබෙන්නේ මෙවැනි පසුබිමක.

එසේ වුවත් ඇතැම් පිරිස් වගකීම් විරහිත ව ක්‍රියා කරන සෙයක් දක්නට ලැබෙනවා. ඔවුන් තම අවට පරිසරය පිරිසිදු කර ගැනීමට පෙළඹෙන්නේ විශේෂයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු පැමිණ මදුරුවන් බෝ වන ස්ථාන පරීක්ෂාවට ලක් කර නීතිය ක්‍රියාත්මක කිරීමට සූදානම් වන පසුබිමක විනා නිරන්තර යහපත් සෞඛ්‍ය පරිසරයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව ඉටු කර ගැනීමට නොවෙයි. පළාත් පාලන ආයතන මට්ටමින් ධූමායනය, කැළි කසළ ඉවත් කිරීම්, කානු පද්ධති පරිසිදු කිරීම් ආදී මදුරු මර්දන වැඩසටහන් දියත් කළ පමණින් මේ වසංගතයට පිළියම් ලැබෙන්නේ නැහැ. මේ නිසා රටේ සෑම පුද්ගලයකු ම ආකල්පමය වශයෙන් වෙනස් වී ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ නීතියට බියෙන් නොව ස්වයං අවබෝධයකින් හා නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමෙන්. ඩෙංගු මාරයා පැරදවිය හැකි වනු ඇත්තේ එවැනි අඛණ්ඩ ව ක්‍රියාත්මක වන සාමූහික ප්‍රයත්නයකින් පමණයි.

මාලා මල්ලිකාරච්චි ගරණාගමගේ

- සංස්කාරක -

දහසක දහසක්





නුවන් කුමාර කටුගම්පල

නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක් ම දිළිඳුකම නැති කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගත්තත් අපේක්ෂිත අරමුණ ඉටු වී නැහැ. 90 දශකයෙන් මෙපිටට ක්‍රියාත්මක වූ ජනසවිය, සමෘද්ධි, අස්වැසුම වැනි දරිද්‍රතාවට එරෙහි වැඩසටහන් ක්‍රියාවට නැංවුණේ සුභ සාධන ප්‍රවේශයෙන්, ආධාර ලබා දීම මූලික ක්‍රමවේදය ලෙස ගෙන. එයින් සිදු වුණේ, දිළිඳු පවුල් දිළිඳුකමේ ම රඳවා තබාගෙන නඩත්තු කිරීමට උත්සාහ දැරීම නිසා යැපුම් මානසිකත්වයෙන් යුත් දිළින්දන්ගේ ප්‍රතිශතය ඉහළ යාම.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) නිකුත් කළ Poverty Indicators (HIES) – 2019 වාර්තාව අනුව ග්‍රාමීය දරිද්‍රතා අනුපාතය 15.0%ක්. නාගරික 6.0%ක් ද වතු ආශ්‍රිත 33.8%ක් වන අතර එහි සමස්ත ජාතික අනුපාතය 14.3%ක්. එම දෙපාර්තමේන්තුවේ ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණ වාර්තා දත්ත අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 16.6%ක් හෙවත් සෑම පුද්ගලයන් හය දෙනකුගෙන් එක් අයකු ම බහුමාන දරිද්‍රතාවෙන් යුක්ත වනවා. එම ප්‍රමාණයෙන් 95.3%ක් ග්‍රාමීය හා වතු ආශ්‍රිතවයි ජීවත් වන්නේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 78.3%කට ආසන්න සංඛ්‍යාවක් ග්‍රාමීය ජනතාව. 15.0%ක් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන්නන්. DCS HIES - 2019 අනුව ග්‍රාමීය දිළිඳු ජනගහනය ආසන්න වශයෙන් මිලියන 2.5ක්. ලෝක බැංකුව (World Bank Poverty and Inequality Platform) දක්වා ඇති පරිදි අන්ත දරිද්‍රතාවෙන් (Extreem Poverty) පෙළෙන එනම් ඇ.ඩො. 2.15ට අඩු දෛනික ආදායමක් ලබන ජනගහනය 1.3%ක්. එනම් පුද්ගලයන් 280,000ක් පමණ. 2022 ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතා මට්ටමේ ඉහළ යාමක් සිදු ව ඇත්තේ 2019 සිට 2024 වන විට සමස්ත දරිද්‍රතා අනුපාතය 10.2%කින් පමණ එනම් 24.5% දක්වා ඉහළ නැංවෙමින්.

මේ දැවැන්ත ගැටලුවට ප්‍රායෝගික විසඳුමක් යෝජනා කරමින් වර්තමාන රජය හඳුන්වා දී ඇති දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන සුභ සාධන ප්‍රවේශයෙන් පරිබාහිර ව නුදු සංවර්ධන ක්‍රියාවලියක් පමණක් නොවන ආකාරයට ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයෙන් නැතහොත් සහභාගිත්ව ප්‍රවේශයෙනුයි ක්‍රියාත්මක කරන්නේ. පසුගිය වසරේ ජූනි මාසයේ සිට 'ප්‍රජාශක්ති' නමින් අරඹා ඇති එම වැඩපිළිවෙළෙහි ප්‍රමුඛ අරමුණ 'ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම'. මේ රජය බලයට පත් වූවාට පසු 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ප්‍රමුඛතා ලැයිස්තුවට ඇතුළත් කළ ප්‍රධාන වැඩසටහනක් වන 'ප්‍රජාශක්ති' වැඩසටහන යටතේ ක්‍රියාවට නැංවෙන මෙය හඳුන්වන්නේ 'දිළිඳුකම පිටුදැකීමේ ජාතික ව්‍යාපාරය' යනුවෙන්. ජන සහභාගිත්වය මූලික කොට ගෙන ක්‍රියාත්මක කෙරෙන රජයේ වැඩපිළිවෙළක් වන මෙය මෙහෙයවනු ලබන්නේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින්.

ප්‍රජාශක්ති වැඩසටහන වෙනුවෙන් සකස් කළ සැලසුම් ක්‍රියාවට නැංවීමේ අදියර එනම්, 'ගම් දහසක - වැඩ දහසක්' වැඩසටහනේ සමාරම්භය සිදු වුණේ 2026 ජූනි මස 02 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඹගස්පිටිය ග්‍රාමයෙන්. ඊට සමගාමී ව දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි

341ක් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙනුත් සමාරම්භක වැඩසටහන් පැවැත්වුණා. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අවම වශයෙන් තුනක්වත් වන පරිදි අනුමැතිය ලද ව්‍යාපෘති පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාසවලයි, එලෙස වැඩසටහන් පැවැත්වුණේ.

මෙය ක්‍රියාත්මක කිරීමේ පහසුව තකා රටේ සක්‍රිය ග්‍රාම නිලධාරී වසම් 14008ක ග්‍රාමීය ජනතා නියෝජනය සහිත ව පිහිටුවා ඇති 'ප්‍රජා සංවර්ධන සභා' මැදිහත් වනවා. මේ සභා ගමේ ජනතාව, ගමට අනුයුක්ත කර ඇති රාජ්‍ය නිලධාරීන්, ගමේ සංවර්ධනයට උනන්දුවක් සහ දායකත්වයක් දක්වන ව්‍යවසායකයන්, ගම්වැසි උගතුන්, ප්‍රභූවරුන් සහ ගමේ වෙසෙන විශ්‍රාමික රාජ්‍ය සේවකයන් යන අයගේ නියෝජනයෙන් සමන්විතයි. එහි කාර්යභාරය වන්නේ ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීම, ඒ සැලසුම් ප්‍රමුඛතාගත පිළිවෙළට ඇතුළත් කිරීම, ඒවා අනුමත වී මුදල් වෙන් කොට ක්‍රියාවට නැංවූ පසු එම ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම යනාදිය. ක්‍රියාත්මක කෙරෙන සියලු ම ව්‍යාපෘති අතීතයේ සිදු වූ ආකාරයට රජය හෝ රජයේ නිලධාරීන් හෝ ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයන් හෝ විසින් හඳුනාගෙන, යෝජනා කරන ලද ව්‍යාපෘති නොවෙයි. ඒවා හඳුනාගෙන ඇත්තේ ප්‍රජා සංවර්ධන සභාව. මෙහිදී සිදු වන්නේ ගමට අවශ්‍ය දේ ගමෙන් තීරණය කර ඉහළට දැන්වීම. ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරී යාන්ත්‍රණය විසින් සිදු කරනු ලබන්නේ ඒ යෝජනා තවදුරටත් වැඩිදියුණු කර ක්‍රියාත්මක කිරීම.

'ගම් දහසක - වැඩ දහසක්' වැඩසටහන යටතේ නිෂ්පාදන ආර්ථිකය, ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධනයට සෘජු ව ම දායක වන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 25,000ක් වෙන් කර දෙන ලද්දේ 2026 අය වැයෙන්. මෙය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සහසම්බන්ධ වනවා. මේ වනවිට අනුමත ව්‍යාපෘතිවලට අවශ්‍ය රුපියල් මිලියන 23,000ක ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර අවසන්.

ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම් කපිල ගුණරත්න පවසන්නේ ප්‍රජාශක්ති ව්‍යාපාරයේ

ප්‍රතිපාදන ප්‍රදානය සංකේතවත් කරමින්



ගම් දහසක - වැඩ දහසක්' ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදන ආර්ථිකය, ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධනයට සෘජු ව ම දායක වන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 25,000ක් වෙන් කර දෙන ලද්දේ 2026 අය වැයෙන්. මෙය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සහසම්බන්ධ වනවා. අනුමත ව්‍යාපෘතිවලට අවශ්‍ය රුපියල් මිලියන 23,000ක ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර අවසන්.

ක්‍රියාත්මක උපායමාර්ග 3/5ක් සෘජු ව ම ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ සංවර්ධන ප්‍රවේශයට අදාළ බව. එහි පළමු වැන්න ග්‍රාමීය ආර්ථිකය ප්‍රසාරණය හෙවත් අවස්ථා පුළුල් කිරීම. මේ යටතේ සිදු කෙරෙන්නේ ප්‍රවේශ මාර්ග, ආර්ථික මධ්‍යස්ථාන, ආර්ථික කලාප වැනි යටිතලපහසුකම් මහා පරිමාණ, දිගුකාලීන සැලසුම් ඔස්සේ පුද්ගලික අංශයේ ද සහයෝගය ඇති ව සංවර්ධනය කිරීමෙන් ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට දායක වීම. දෙවැන්න රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සහිත ව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම. මෙහිදී සිදු කෙරෙන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සවිබල ගන්වමින් ඒවා සංවර්ධනය කර ව්‍යවසායකයන්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම. තෙවැන්න දැනුම, කුසලතා සහ ආකල්ප දියුණු කිරීමෙන් මානව සංවර්ධනය. මෙහිදී සිදු වන්නේ අධ්‍යාපනය ලබා දීම, වෘත්තීය පුහුණුවට යොමු කිරීම, ශ්‍රම බලකාය නිරෝගී සහ ශක්තිමත් කිරීමෙන් ග්‍රාමීය ජනයාගේ ආර්ථික සංවර්ධනයට දායක වීම. 'රැකවරණය' සංවර්ධන ප්‍රවේශයට සම්බන්ධ මූලික අනෙක් උපායමාර්ග දෙක වන්නේ ජීවන චක්‍ර ප්‍රවේශය (සමාජ ආරක්ෂණ, සුරක්ෂිතතා සහ සුභ සාධන වැඩසටහන් ඔස්සේ අවදානම් සහගත කණ්ඩායම්වල සාර්වත්‍රික රැකවරණය තහවුරු කිරීම) සහ ආර්ථික ආරක්ෂණ රැකවරණය (හදිසි ආර්ථික කඩාවැටීම්වලදී පිළියම් යෙදීම). මේ උපායමාර්ගික ප්‍රවේශ හඳුන්වා දී ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලය 2025.08.22 දිනැති ව නිකුත් කළ අංක PS/DASA/Circular/7/2025 දරන චක්‍රලේඛයෙන්.

ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන, ආර්ථික අවස්ථා අපේක්ෂා කරන පිරිස්වලට 'ගම් දහසක - වැඩ දහසක්' සමඟ සම්බන්ධ වීමට සෘජු අවස්ථා සපයා දී තිබෙනවා. ඔවුන් වඩාත් සංවිධිත ව ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම සඳහා රජයේ සේවයේ යෙදී සිටින උපාධිධාරීන් 'ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරීන්' ලෙස පුහුණු කර අනුයුක්ත කිරීමත් ඔවුන් ප්‍රජා සංවර්ධන සභාවල ලේකම් ධුරවලට පත් කිරීමත් මේ සමඟ ම සිදු වනවා.

ලක්ෂයකට අධික ව අමාත්‍යාංශය වෙත ලැබී ඇති ව්‍යාපෘති යෝජනා නියමිත උපමාන ඔස්සේ නිරීක්ෂණය

කර, ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට හඳුනා ගත් ව්‍යාපෘති 26000ක් , ප්‍රමුඛතා ලැයිස්තුගත කර ඒ අතරින් ව්‍යාපෘති 1037ක් ක්‍රියාත්මක වෙමිනුයි පවතින්නේ. එහිදී අමුණු, ඇළවේලි සංවර්ධනය වැනි ආහාර සුරක්ෂිතතාව කෙරෙහි සෘජු ව වැදගත් වන කාර්යවලට වැඩි ප්‍රමුඛතාවක් දී තිබීම විශේෂත්වයක්. මේ වැඩසටහනේ සමස්ත ව්‍යාපෘති වෙනුවෙන් 2026 වර්ෂය සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 25,000ක සම්පූර්ණ ප්‍රතිපාදනය වර්ෂය අවසානයට පෙර අනුමත ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඔස්සේ නිදහස් කර අවසන් කිරීමයි ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ඉලක්කය. ඒවා නිසි පරිදි කළමනාකරණය කරමින් එක් එක් ව්‍යාපෘති මෙහෙයවීමත් අමාත්‍යාංශයට අයත් කාර්යයක්. ග්‍රාමීය සංවර්ධනයට සෘජු ව ම සම්බන්ධ තවත් අමාත්‍යාංශ 09ක දායකත්වය සහිත ඒකාබද්ධ යාන්ත්‍රණයකින් සහ ප්‍රජා සහයෝගය සහිත සහභාගිත්ව ප්‍රවේශයකින් මෙන් ම පක්ෂ දේශපාලනයෙන් තොර ව සාමාන්‍ය ජනතාව, නිලධාරීන් සහ වියතුන්ගේ එකතුවෙනුයි 'ගම් දහසක - වැඩ දහසක්' වැඩපිළිවෙළ සංවිධාන වී ඇත්තේ. ආර්ථික සවිබලගැන්වීම පමණක් නොව මානසික සහ සමාජීය වශයෙන් සවිබල ගැන්වීමෙන් ජනතාව යැපුම් මානසිකත්වයෙන් මුදාගෙන උත්සාහවන්ත සාමාන්‍ය පුද්ගලයන් බවට පත්වීමට ශක්තිය ලබා දීම මේ වැඩසටහනෙන් රජය අපේක්ෂා කරන බව ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මේනක හේරත් ප්‍රකාශ කරනවා.

පසුගිය පාලන කාලවල ආයතන අතර සම්බන්ධීකරණ ක්‍රියාවලිය අඩපණ ව පැවැති නිසා විවිධ ගැටලු පැන නැඟී තිබුණා. එබැවින් මේ වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී රජයේ ආයතනවල විධිමත් අන්තර් සම්බන්ධීකරණ ක්‍රියාවලියක අවශ්‍යතාව ද මතු වූ අතර බහු ආයතනික ව්‍යුහයක තීරණ ගැනීමේ සහ එකඟතාවට පැමිණීමේ ප්‍රමාද පැවැතීම වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී අමාත්‍යාංශය හඳුනා ගත් අභියෝග අතර වනවා. ගම් මට්ටමේ සැලසුම් සහ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් අතර එකිනෙක නොගැළපෙන පරතරයක් පැවැතීම සහ සැබෑ ප්‍රජා අවශ්‍යතා, පවතින මූල්‍ය තත්ත්වවලට ගැළපීමට සිදු වීම වැනි බාධා ද මෙහි ප්‍රමුඛතා හඳුනා ගැනීමේදී මතු ව තිබෙනවා. සැලසුම්කරණය සඳහා ජනතා නියෝජනය සහ ප්‍රජා දායකත්වය ලබා ගැනීමත් ඔවුන්ගේ

> ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන, ආර්ථික අවස්ථා අපේක්ෂා කරන පිරිස්වලට 'ගම් දහසක - වැඩ දහසක්' සමඟ සම්බන්ධ වීමට ඍජු අවස්ථා සපයා දී තිබෙනවා. ඔවුන් වඩාත් සංවිධිත ව ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම සඳහා රජයේ සේවයේ යෙදී සිටින උපාධිධාරීන් 'ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරීන්' ලෙස පුහුණු කර අනුයුක්ත කිරීමත් ඔවුන් ප්‍රජා සංවර්ධන සභාවල ලේකම් ධුරවලට පත් කිරීමත් මේ සමඟ ම සිදු වනවා.




සහභාගිත්වයෙන් ඇරඹූ ප්‍රජා සංවර්ධන සභා සක්‍රිය ව පවත්වාගෙන යාමත් අභියෝගාත්මක වූ අවස්ථා ද ඇතැම් ප්‍රදේශවලින් වාර්තා වී තිබෙනවා. සමහර අමාත්‍යාංශවල වෙන් ව තිබූ ප්‍රතිපාදන එක ම සංවර්ධන සැලැස්මකට ඒකාබද්ධ කිරීමේ දුෂ්කරතාත් ඒවායේ පැවැති මූල්‍ය සහ මානව සම්පත් ගැටලුත් වැඩසටහනේ ප්‍රායෝගික ක්‍රියාවලියේදී හඳුනාගෙන තිබුණා. ව්‍යාපෘතිවල ප්‍රගතිය නිසි ලෙස මැන බැලීම සඳහා ඒකාබද්ධ දත්ත පද්ධතියක අවශ්‍යතාවත් දිස්ත්‍රික් මට්ටමෙන් සහ ජාතික මට්ටමෙන් තොරතුරු හුවමාරුව විධිමත් කිරීමේ අවශ්‍යතාවත් මතු ව ඇත්තේ මෙහෙයුම් සහ ඇගයීම් අවස්ථාවේදී. රාජ්‍ය-පෞද්ගලික-ප්‍රජා හවුල්කාරිත්වය (Public-Private-People Partnership) ගොඩනැංවීම, ග්‍රාමීය සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ආකර්ෂණය සහ දායකත්වය ලබා ගැනීම දුෂ්කර වීම ද හඳුනා ගත් බාධක. මේ සියලු බාධා, අභියෝග, දුෂ්කරතා අතික්‍රමණය කරමින් 'ගම් දහසක - වැඩ දහසක්' මඟ පාදන්නේ ග්‍රාමීය ජනයාට තිරසර ආදායම් උත්පාදන අවස්ථා සහ ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් ඔවුන්ගේ ආර්ථික ස්වයංපෝෂිතභාවය ස්ථාපිත කිරීමට.

'කිසි තැනක කිසිවෙක් අත් නොහැර' යන සංකල්පය යටතේ ප්‍රජාශක්ති වැඩසටහන සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාවට නංවමින් ඇරඹි ගම් දහසක - වැඩ දහසක් ක්‍රියාන්විතයෙන් ග්‍රාමීය ව වෙසෙන බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා මුදාගනිමින් සියලු ම ජනතාවගේ ජීවන මට්ටම් ඉහළ නැංවීමට හැකි වෙතැයි තමන් අදහස් කරන බව පවසන ප්‍රජාශක්ති වැඩසටහනේ අධ්‍යක්ෂ ප්‍රසාද් කෝරළගේ පෙන්වා දෙන්නේ මේ ඔස්සේ ගැමියන්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ නිර්මාණය කිරීමෙන් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනයට මග පෑදීම ද සිදු වන බව. නව රැකියා සහ ස්වයං රැකියා අවස්ථා ඇති වීමත් අමතර ආදායම් මාර්ග සැකසීමත් ද්‍රව්‍ය හෝ මුදල් හෝ සහනාධාර බෙදා දීමකින් තොර ව දුප්පත්කම නැති කිරීමේ ස්ථීර ක්‍රමවේදයක් නිර්මාණය කිරීමත් පවතින පිරිස් බලය රටේ සංවර්ධනයට යොදා ගැනීමත් පමණක් නොව ඔවුන්ට අවශ්‍ය රැකවරණය ද මෙයින් සැපයෙන නිසා මේ වැඩසටහන ජනතා අවධානය දිනා ගනු ඇති බව පැහැදිලි වන කාරණයක්.

සැතෑ වන මධ්‍යම අධිවේගී සිහිනය

මුදිතා දයානන්ද



රටක සංවර්ධනයේදී යටිතල පහසුකම් සංවර්ධනය අනිවාර්ය වූවක්. එහිදී විශේෂයෙන් ප්‍රවාහන පද්ධතිය දියුණු වීම ඉතා වැදගත්. ඒ අතරිනුත් අධිවේගී මාර්ග පද්ධතිය සුවිශේෂ වන්නේ අනෙකුත් මාර්ගවලට වඩා එහි පවතින සුවිශේෂතා කිහිපයක් හේතුවෙන්.

අධිවේගී මාර්ග හරහා ඉතා කෙටි කාලයකින් දිගු දුරක් ගමන් කළ හැකි වීම, මාර්ග තදබදයකදී වාහන නතර කර තැබීමෙන් අපතේ යන ඉන්ධන අධිවේගී මාර්ගවල නොනවත්වා ධාවනය කිරීමෙන් ඉතිරි කරගත හැකි වීම, මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය වේගවත් වීම නිසා වෙළෙඳාම, සංචාරක ව්‍යාපාරය සහ කර්මාන්ත දියුණු වීම මෙන් ම සාමාන්‍ය මාර්ගවලට වඩා ආරක්ෂිත ව ගමන් කළ හැකි වීම යන කාරණා එහිදී ප්‍රමුඛ වනවා.

මේ වන විට රටපුරා අධිවේග මාර්ග පද්ධතිය දියුණුවෙමින් පවතින අතර මධ්‍යම අධිවේගී මාර්ගයේ තෙවැනි කොටසේ දෙවැනි අදියර නොබෝදා (මැයි 29) ආරම්භ වුණා. ඒ, කිලෝමීටර 32.5කින් යුතු රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ කොටසේ ඉදිකිරීම් අරඹමින්. කඩවතින් ආරම්භ වී මීරිගම පොතුහැර හරහා මහනුවර (ගලගෙදර) දක්වා මේ මාර්ගය ගමන් කරනවා. මේ මාර්ගය පොතුහැර සිට දඹුල්ල දක්වා දිර්ඝ කරමින් සම්බන්ධ වන්නේ උතුරු හා උතුරුමැද පළාත්වලට.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ කොටස් 04ක් (අදියර 4ක්) යටතේ. එහිදී අදියර 01 කඩවත සිට මීරිගම දක්වා කිලෝමීටර් 37ක ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මෙහි අදියර 02 ක්‍රියාත්මක වන්නේ මීරිගම සිට කුරුණෑගල (පොතුහැර) දක්වා වන අතර එහි දිග කිලෝමීටර් 39.7ක්. මෙහි වැඩ අවසන් කර මහජන භාවිතය සඳහා වසර කිහිපයකට පෙර විවෘත කළා. පොතුහැර සිට රඹුක්කන දක්වා කිලෝමීටර් 09ක් වන අදියර 03හි ඉදිකිරීම් 2026 වසරේ ආරම්භ කළ අතර 2027 වසරේදී එහි ඉදිකිරීම් අවසන් කිරීමයි අපේක්ෂාව. නොබෝදා ඇඹුණේ මෙහි රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ කොටසේ ඉදිකිරීම්. අදියර 04 ක්‍රියාත්මක වන්නේ කිලෝ මීටර් 60.3ක් වන කුරුණෑගල සිට දඹුල්ල දක්වා. මෙහි ඉදිකිරීම් සඳහා දැනට ඉඩම් පවරා ගැනීම ආරම්භ කර තිබෙනවා. කඩවත සිට දඹුල්ල දක්වා අධිවේගී මාර්ගය සම්පූර්ණ දිග කිලෝමීටර් 136.9ක්. කඩවත සිට ගලගෙදර දක්වා සම්පූර්ණ දිග කිලෝ මීටර 119ක්.

මධ්‍යම අධිවේගී මාර්ගය ගම්පහ, කුරුණෑගල, කෑගල්ල සහ මහනුවර, මාතලේ දිස්ත්‍රික්ක හරහා ගමන් කරනවා. මේ අධිවේගී මාර්ගය සමන්විත වන්නේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 12කින් සහ කඩවත, විල්වත්ත සහ පොතුහැර ලෙස සේවා අන්තර් හුවමාරු 03කින්.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සමස්ත වියදම් ඇස්තමේන්තුව ශ්‍රී

මධ්‍යම අධිවේගී මාර්ගය නිසා මධ්‍යම, වයඹ, උතුර, උතුරු මැද, පළාත්වලට සෘජු ව ම ප්‍රතිලාභ ලැබෙනවා. මේ මාර්ගය දක්ෂිණ අධිවේගී මාර්ගයත් සමඟ සම්බන්ධ වීමෙන් උතුරේ සිට දකුණට ඉතා කෙටි වේලාවකදී ගමන් කිරීමේ, භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ හැකියාව ලැබෙනවා මෙන් ම වාහන නඩත්තු වියදම් අඩු වන නිසා ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභය ගණනින් මනින්නට බැහැ.

ලංකා රුපියල් බිලියන 445.3ක් වුවත් එයින් අදියර 1, 2 සහ 4 සඳහා පමණක් වියදම රුපියල් බිලියන 350.64ක් වනවා. ව්‍යාපෘතිය 2024 වසරේ අවසන් කිරීම සැලසුම් වුවත් සිදු වූ ප්‍රමාදය නිසා අවසන් කළ හැකි වන්නේ 2029 වසරේදී බවයි මාර්ග සංවර්ධන අධිකාරිය පවසන්නේ. මෙලෙස ප්‍රමාද වීම නිසා මේ කාර්යයට ලැබෙන ඩොලර් ගණන වෙනස් නොවුණත් රුපියල් වියදම වැඩි වන බවයි මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු නලින්ද රත්නායක පෙනවා දෙන්නේ. කඩවත මීරිගම කොටසේ වියදම ඇස්තමේන්තු කර තිබුණේ රුපියල් බිලියන 158.5කට වුවත් දැන් ඒ සඳහා වියදම රුපියල් බිලියන 229ක් වන බවත් අනෙක් කොටස් දෙකේ අදියර සඳහා වියදම ඒ අනුව අනිවාර්යයෙන් ම වැඩි වන බවත් ඔහු පවසනවා.

අදහස් දක්වන ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු නලින්ද රත්නායක; " මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත මීරිගම කොටස ඉදිකිරීමේ ව්‍යාපෘතිය අරඹන්නේ 2016 වසරේදී වුණත් ණය ගිවිසුම් අත්සන් කරන්නේ 2019 මාර්තු 22 දින චීන ඒක්සිම් බැංකුව සමඟ. එහි මුදල් ලැබෙන්නේ 2020 සැප්තැම්බර්. 2022 වන විට භෞතික සැලැස්මේ 34%ක් අවසන් කර තිබුණා. මෙහි ඇස්තමේන්තුව ඇමරිකන් ඩොලර් මිලියන 989ක්. එයින් ඇමරිකන් ඩොලර් මිලියන 189.51ක වැඩ කර තිබියදීයි රට බංකොලොත් බව ප්‍රකාශ කළේ. ඒ නිසා විදේශ ණය ලැබීම නැවතුණා. වියදම් කළ මුදලින් ලබාගත හැකි වුණේ ඩෝලර් මිලියන 51.57ක් පමණයි. ඉතිරි මුදල් ලැබුණේ නැති නිසා ඉදිකිරීම් නැවැත්වීමට සිදු වුණා. දැන් චීන එක්සිම් බැංකුව එකඟ වී තිබෙනවා නැවත ව්‍යාපෘතිය ඉදිරියට ගෙනියන්න."

පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ සිට මධ්‍යම අධිවේගී මාර්ගය යා කරන කඩවත අන්තර් හුවමාරුව සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ මුල් මීටර් 500 සඳහාත් ටෙන්ඩර් පිරිනමා වැඩ අරඹා තිබෙනවා. මීට අමතර ව පොතුහැර සිට රඹුක්කන කොටස වැඩ කඩිනම් කර තිබෙනවා. 2027 මාර්තු පමණ වන විට එහි වැඩ නිම කිරීමයි මාර්ග සංවර්ධක අධිකාරියේ අපෙක්ෂාව.

මේ ව්‍යාපෘතියට 10%ක පමණ දායකත්වයක් රජයෙන් දරන අතර ඉතිරි සියල්ල විදේශ ආධාර වනවා. ඉතිහාසයේ පළමු වතාවටයි මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටසක් මහා භාණ්ඩාගාරයේ මුදල්වලින් ඉදි කරන්නට තීරණය කර ඇත්තේ. මේ වියදම රුපියල් බිලියන 112ක්.

මීරිගම සිට කුරුණෑගල (පොතුහැර) දක්වා කොටස ජනතා අයිතියට පත් ව ඇතත් කඩවත සිට මීරිගම කොටස තව ම වැඩ අවසන් ව නැහැ. එහි වැඩ නිම කළ පසු මධ්‍යම, දකුණ සහ කටුනායක අධිවේගී මාර්ග සම්බන්ධ වීමෙන් ජනතාවට කෙටි වේලාවකින් ගමන් පහසුව සලසා ගැනීමට හැකි වෙනවා. එවිට භාණ්ඩ ප්‍රවාහනයට විශේෂයෙන් සහල්, එළවලු ඇතුළු කෘෂි නිෂ්පාදන වේගවත් ව ප්‍රවාහනය කිරීමට හැකි වීමෙන් පාරිභෝගිකයාට නැවුම් ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමේ හැකියාව ලැබෙනවා පමණක් නොව ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනයේදී සිදු වන හානිය අවම වීමත් වාසිදායක තත්ත්වයක්. මාර්ග සංවර්ධන අධිකාරිය පෙන්වා දෙන්නේ දැනට පවතින මාර්ග තදබදය 90%කින් පමණ අඩු කර ගැනීමටත් අධිවේග මාර්ග භාවිතය නිසා හැකි වන බව.

මධ්‍යම අධිවේගී මාර්ගය නිසා මධ්‍යම, වයඹ, උතුර, උතුරු මැද, පළාත්වලට සෘජු ව ම ප්‍රතිලාභ ලැබෙනවා. මේ මාර්ගය දක්ෂිණ අධිවේගී මාර්ගයත් සමඟ සම්බන්ධ වීමෙන් උතුරේ සිට දකුණට ඉතා කෙටි වේලාවකදී ගමන් කිරීමේ, භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ හැකියාව ලැබෙනවා මෙන් ම වාහන නඩත්තු වියදම් අඩු වන නිසා ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභය ගණනින් මනින්නට බැහැ.





IMF සමඟ සිව් වසරක්

මහාචාර්ය
ප්‍රියංග දුනුසිංහ
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය



ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය ක්‍රමය අනුව එහි 05 වැනි සහ 06 වැනි වාරික එකවර ගෙවීමට නොබෝදා අනුමැතිය ලැබුණා. ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අනුව යමින් යම් ආකාරයක ශක්තිමත් ආර්ථික වටපිටාවක් සකසා ගනිමින් සිටින කාලවකවානුවක දිට්වා සුළි කුණාටුවත් මැදපෙරදිග යුද්ධය වාතාවරණයත් ශ්‍රී ලංකා ආර්ථිකයට වෙනස් පීඩනකාරී තත්ත්වයක් ඇති කළා. මෙවැනි පසුබිමක වුවත් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතා වැඩපිළිවෙළ ශක්තිමත් ව පවත්වාගෙන ගොස් ඇති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමාලෝචන වාර්තාව පෙන්වා දී තිබෙනවා. එයින් පෙනී යන්නේ ශ්‍රී ලංකාව පක්ෂ විපක්ෂ බේදයකින් තොර ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතාව පිළිගෙන ඇති බවත් ඒ අනුව ක්‍රියා කර ඇති බවත්. වෙනත් ලෙසකින් පැවසුවහොත් එම වැඩපිළිවෙළට අනුගත නොවුණහොත් ඒ වෙනුවෙන් ඉහළ පිරිවැයක් දැරීමට සිදුවන බව ශ්‍රී ලංකාව අවබෝධ කරගෙන තිබෙන බවකුයි මෙයින් පෙනී යන්නේ. මෙයට පෙර ක්‍රියාත්මක වූ IMF සහයෝගිතා වැඩසටහන්වලට සාපේක්ෂ ව මෙය වෙනස් තත්ත්වයක්. අතීතයේ ඇතැම් අවස්ථාවල එක් ආණ්ඩුවක් ක්‍රියාත්මක කළ IMF වැඩසටහන් තවත් ආණ්ඩුවක් අතරමඟ අත්හැර දැමූ අවස්ථා ද තිබුණා. එහෙත් අර්බුදයෙන් පසුව වෙනත් විකල්පයක් නොමැති බවත් පවතින තත්ත්වය අනුව එය අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීමට සිදු ව තිබෙන බවත් ශ්‍රී ලංකා රජය අවබෝධ කරගෙන එහි ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ආර්ථික අර්බුදයත් සමඟ ඇති වූ මහජන පීඩනය ක්‍රමක්‍රමයෙන් අවම වීම නිසා මහජනතාව ද පෙරට වඩා මේ වැඩසටහන පිළිගනිමින් සහයෝගයක් දක්වන ආකාරයක් ද පෙන්නුම් කරනවා. මේ අනුව පෙනී යනවා විවිධ අර්බුදකාරී තත්ත්ව මැද වුවත් මෙයට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් එකඟතා වැඩසටහන්වලට වඩා මේ වැඩසටහන රජය සහ මහජනතාව එකඟතාවකින් යුතු ව අඛණ්ඩ ව ක්‍රියාත්මක වෙමින් පවතින බව. එය යහපත් ලක්ෂණයක්.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් සහයෝගිතා ගිවිසුම සමඟ ශ්‍රී ලංකාව නැවතත් බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව යම් ආකාරයකින් වර්ධනය කරගෙන තිබෙන බව පැවසීම සත්‍යයක්. උදාහරණ වශයෙන් දිට්වා සුළි කුණාටුව අවස්ථාවේ ඒ සඳහා ණය ගැනීම්වලින් තොර ව ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ලැබුණේ මේ නිසා. රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම හා විදේශ සංචිත ප්‍රමාණය යම් මට්ටමකින් ස්ථාවර ව පවත්වා ගැනීමට හැකියාව ලැබීම මෙයට පිටුවහල් වුණා. ඒවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් කොන්දේසි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතා වැඩපිළිවෙළ අනුව ශ්‍රී ලංකාව මූලික අරමුණු 05ක් අපේක්ෂා කළා. පළමුවැන්න රාජ්‍ය මූල්‍ය තිරසර බව හා ණය තිරසරභාවය ඇතිකර ගැනීම. ඒ අනුව රාජ්‍ය මූල්‍ය තිරසර බව සඳහා රාජ්‍ය අදායම් ඉහළ නංවා ගැනීමත් රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීමත් කළ යුතු වුණා. ණය තිරසර බව ඇතිකර ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණය කළා. දෙවැනි ව අපේක්ෂා කළේ විශේෂයෙන් ආර්ථිකයේ ස්ථාවරභාවය ඇති කර ගැනීම. එහිදී මූල්‍ය අංශයේ ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීමට අවධානය යොමු වුණා. විදේශ සංචිත ගොඩනැගීම හා ස්ථාවර ව පවත්වා ගැනීමයි තුන් වැනි ව අපේක්ෂා කළේ. ඉන්පසුව වංචාව, දූෂණය අවම කිරීම සහ රටේ පහළ ම ආදායම් ලබන පිරිසගේ සමාජ ආරක්ෂණය ද අරමුණක් වුණා. අවසාන අරමුණ වුණේ ආර්ථික වර්ධනයට හිතකර ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

මේ මූලික අරමුණු හා ඒවා ඉටු කර ගැනීම පිළිබඳ පසුවිපරමක් සිදු කළහොත් රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට ලැබී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් එකඟතාව අනුව ප්‍රාථමික ගිණුමේ ශේෂය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2.3 ඉක්මවා යාමට හැකි ව තිබෙනවා. මේ වන විට ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය පවතින්නේ අවසාන අදියරේ. සමස්ත මිල මට්ටම පහළ ගොස් උද්ධමනය අවම අගයකට ගෙන ඒමට සමත් ව තිබීමත් වැදගත්. ඒ අනුව මූල්‍ය ස්ථාවරත්වයකින් අභ්‍යන්තර ස්ථාවරත්වයක් ඇති කර ගැනීමට හැකියාව ලැබී තිබෙනවා. විදේශ සංචිත පවත්වා ගැනීමේදී වුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කළ මට්ටමට ම නැතත් ඉහළ මට්ටමක ස්ථාවර ව පවත්වා ගැනීමට හැකි වී තිබීම සුවිශේෂයි. ඒ ආකාරයට සංචිත රැස් කිරීම නොකළා නම් ණය ගැනීමට සිදුවීමත් දිට්වා සුළි කුණාටුව හා මැදපෙරදිග යුද්ධය වාතාවරණය වැනි කාරණා



නිසාත් නැවතත් රට අස්ථාවර තත්ත්වයට පත්වීමට හැකියාව තිබුණා. මේ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව ඒ සඳහා උනන්දු කරවනු ලැබීම ඉතා යහපත් ලක්ෂණයක්. ඒ නිසයි දිට්වා සුළි කුණාටුව සහ අනෙකුත් ගෝලීය වෙනස්කම් වැනි අනපේක්ෂිත පීඩන සඳහා ශ්‍රී ලංකාවට ශක්තිමත් ව ප්‍රතිචාර දැක්වීමට හැකි වූයේ. මේ සියල්ල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් ගිවිසුම හා අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ සාධනීය ලක්ෂණ විදිහට දකින්නට පුළුවන්.

එහෙත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තවදුරටත් අවධාරණය කරන කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන් බදු ආදායම හා බදු පැහැර හැරීම තවදුරටත් අවම කර ගැනීම එක් කාරණයක්. එහිදී බදු ආදායම තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා ආර්ථිකයේ වර්ධනය සහ ස්ථායිතාව ඇති කර ගැනීමට මැදිකාලීන වැඩපිළිවෙළක් පිළිබඳ ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතුයි. විදුලිය ඉන්ධන වැනි භාණ්ඩවල පිරිවැය, මූලික මිලකරණය පිළිබඳ තවදුරටත් අවධානය යොමු කළ යුතු බව ද ඔවුන් පෙන්වා දෙනවා. දෙවැනි ව ණය තිරසර බව ඇති කර ගැනීම. එය ගැඹුරින් විග්‍රහ කරගත යුතු කාරණයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කරන ආකාරයට ණය තිරසරභාවය පිළිබඳ යම් අවදානමක් ශ්‍රී ලංකාවට තිබෙනවා. මේ ප්‍රකාශය සලකා බැලීමේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතා වැඩපිළිවෙළ අවසන් වන කාලය පිළිබඳ සලකා බැලුවහොත් එය 2027 මාර්තු මාසයෙන් පසුව අවසන් වීමට නියමිත ව තිබෙනවා. එහිදී අවධානය යොමු වන කාරණයක් නම් සැබැවින් ම ශ්‍රී ලංකාවට මේ වැඩසටහනින් ඉවත් වීමේ හැකියාව පවතිනවාද? යන ප්‍රශ්නය. ණය තිරසරභාවය පිළිබඳ ශ්‍රී

> ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් සහයෝගිතා ගිවිසුම සමඟ ශ්‍රී ලංකාව නැවතත් බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව යම් ආකාරයකින් වර්ධනය කරගෙන තිබෙන බව පැවසීම සත්‍යයක්. උදාහරණ වශයෙන් දිට්වා සුළි කුණාටුව අවස්ථාවේ ඒ සඳහා ණය ගැනීම්වලින් තොර ව ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ලැබුණේ මේ නිසා. රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම හා විදේශ සංචිත ප්‍රමාණය යම් මට්ටමකින් ස්ථාවර ව පවත්වා ගැනීමට හැකියාව ලැබීම මෙයට පිටුවහල් වුණා. ඒවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් කොන්දේසි.

ලංකාවට පවතින අවදානම සාර්ථක ව පහළ හෙළීමට අපොහොසත් වුවහොත් ඇතිවන තත්ත්වය වන්නේ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ඒ අනුව ශ්‍රේණිගත කිරීම. එසේ නම් අප ණය ගෙවීමේ හැකියාව වර්ධනය කරගත යුතුයි. මේ නිසා ඇතැම් විට ශ්‍රී ලංකාවට 2027 මාර්තු මාසයෙන් පසුව තවදුරටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ මෙයට වඩා වෙනස් ආකාරයකින් ක්‍රියා කිරීමට සිදු වනු ඇති. එය බොහෝ විට වසර දෙකක පමණ උපකාරක (Stand by) වැඩසටහනක් හෝ එසේ නැතහොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීමක් විය හැකියි. මේ නිසා ඉදිරි මාස 09ක කාලයේ මේ තත්ත්ව හමුවේ කටයුතු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව ගැඹුරින් සාකච්ඡා කළ යුතුයි.

ආර්ථික වර්ධනය වේගවත් කර ගැනීම සඳහා අදාළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම ද වැදගත්. විදේශ සංචිත තවදුරටත් ඉහළ නැංවීම ද කළ යුතු වෙනවා. ණය තිරසර බව ඇති කර ගැනීම සඳහා එය වැදගත්. නොබෝදා රජය විසින් අපනයන ආදායම ඉහළ නංවා ගැනීම සඳහා නව ජාතික අපනයන සංවර්ධන උපායමාර්ගික සැලසුමක් එළිදැක්වූවා. එහිදී නව වෙළෙඳපොළ හඳුනා ගැනීමට ක්‍රියා කරන බව එහි සඳහන් වෙනවා. ඒ ආකාරයට ඉතා ඉක්මනින් අවදානමක් පවතින ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරමින් එම අවදානම අවම කර ගැනීමට පියවර ගත යුතුයි. කෙටිකාලීන උපායමාර්ග වශයෙන් ආනයන විදයම් අවම කරගත හැකි නම් එයින් ගලා යන විදේශ විනිමය අවම කරගත හැකියි. නව විදේශ වෙළෙඳ ගිවිසුම්වලට ඇතුළත් වීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කළ හැකියි. කෙටිකාලීන වශයෙන් ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් වන්නේ පිරිවැය අවමකරණය යටතේ මාර්ගගත ක්‍රමයෙන් සේවා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. එය කළ හැකි නම් ප්‍රවාහන වියදම විශාල ලෙසින් අවම කර ගැනීමේ හැකියාවක් පවතිනවා. වර්තමානයේ ඩිජිටල් ආර්ථිකයක් කරා යන ගමනේදී මෙය අත්හදා බැලීමක් වශයෙන් වුව ද කළ හැකියි.

සාකච්ඡා සටහන
දීප්ත කුමාර බටගොඩ

83 ජූලි පැල්ලම

වසන්ත දිසානායක

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අඳුරුතම කළු පැල්ලමක් සටහන් කළ කුප්‍රකට කළු ජූලියට වසර 43ක්. මේ අපකීර්තිමත් සිද්ධිදාමය මුළුදීමට ආසන්නතම හේතුව වූයේ 1983 ජූලි 23 සෙනසුරාදා දින රාත්‍රී යාපනේ තින්නවෙලිහිදී එල්ටීටීඊ කණ්ඩායමක් රැක සිට එල්ල කළ ප්‍රහාරයකින් හමුදා බණ්ඩයක අණදෙන නිලධාරියා ඇතුළු හමුදා සෙබළුන් 13 දෙනෙකු මරණයට පත් කිරීමේ සිද්ධිය. මෙයට ගොදුරු වූයේ ගුරුනගර් සිට මාදගල් දක්වා 'ෆෝ ෆෝ බ්‍රාවෝ' නමින් වූ සෝදිසි මෙහෙයුමක යෙදී සිටි 15කින් යුත් හමුදා බණ්ඩයක්. මේ සිද්ධියෙන් අනතුරු ව ඊට ප්‍රතිචාර වශයෙන් සිදු වූයේ හමුදාව විසින් පසු දින එනම් ජූලි 24 දින යාපනේ සිවිල් වැසියන් 20 දෙනෙකු ඝාතනය කරනු ලැබීම හා එදින සන්ධ්‍යාවේ සිට කොළඹ ප්‍රධාන කේන්ද්‍රය කරගනිමින් දෙමළ විරෝධී ජන ඝාතනයේ, ගිනිබත් කිරීමේ, බලහත්කාර ස්ත්‍රී දූෂණයේ හා කොල්ලකෑමේ තිරශ්චීන සිද්ධි දාමයක් නිදැල්ලේ දියත් වීම.

බැලූ බැල්මට පෙනී ගියේ හා පෙන්නුම් කිරීමට උත්සාහ කෙරුණේ මේ සිද්ධියෙන් ප්‍රකෝප වූ සිංහල ජනයා ස්වයංසිද්ධ ව වීදිවලට බැස මේ සිදුවීම්වලට සම්බන්ධ වූ බව. එහෙත් කරුණු කාරණා පෙන්නුම් කරන්නේ මේ සිදුවීමෙන් අනතුරු ව ප්‍රධාන වශයෙන් කොළඹත් කොළඹ අවට තදාසන්න නගරවලත් රට පුරාමත් දෙමළ විරෝධී ජන ඝාතක හා කොල්ලකෑමේ ස්වයංසිද්ධ නොව සැලසුම් සහගත තිරශ්චීන ක්‍රියාවලියක් දියත් කෙරුණු බව. සිය ගණන් දෙමළ ස්ත්‍රීන් බලහත්කාර ලිංගික දූෂණයට ගොදුරු කෙරුණා. සිය ගණනක් දෙමළ වැසියන් පණ පිටින් පුළුස්සා ඝාතනය කෙරුණා. දෙමළ ජනයාට අයත් ගෙවල් දොරවල්, වෙළෙඳ හල්, කම්හල් හා වෙනත් දේපළ දවා හළු කෙරුණා. මේ සියල්ල සිදු කෙරුණේ බෞද්ධ යැයි කියන රටක. 200 ගණනක් කුරිරු අන්දමින් ඝාතනය කෙරුණු පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු තත්ත්වයත් හමුදා සෙබළුන් 13 දෙනෙකු ඝාතනය කිරීමෙන් පසු ඇති වූ මෙකී තත්ත්වයත් සසඳා බැලුවහොත් 1983 කළු ජූලි සිදුවීම් පිටුපස මනාව සැලසුම් කළ ක්‍රියාවලියක් පැවති බව වටහා ගැනීමට කෙනෙකුට අටුවා ටීකා අවශ්‍ය වන්නේ නැහැ.

මේ ක්‍රියාදාමයේදී දෙමළ ජන ජීවිත 3,000ක් පමණ ඝාතනය කෙරුණා. මේ ඝාතන අතර අවස්ථා දෙකකදී දරුණු වධ බන්ධනයට පත් කර මරා දැමුණු කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටි දෙමළ රැඳවියන් 53 දෙනෙකුගේ ජීවිත ද වුණා. වාර්තා වූ අන්දමට මේ ප්‍රහාරය සඳහා සිංහල සිරකරුවන් මෙහෙයවා ඇත්තේ ජේලර්වරයෙකු ප්‍රමුඛ බන්ධනාගාර නිලධාරීන් පිරිසක්. නිවාස 20,000කට ආසන්න සංඛ්‍යාවක් හා වෙළෙඳ ව්‍යාපාරික ස්ථාන හා නිෂ්පාදන කම්හල් 5,000ක් පමණ ගිනිබත් කෙරුණා. මේවා අතර ප්‍රමුඛ පෙළේ දෙමළ සහ ඉන්දියානු කර්මාන්තකරුවන්ට අයත් කාර්මික සංකීර්ණ 17ක් ද ලෝක බැංකුව ණයක් ලබා දුන් ශ්‍රී ලංකාවේ එක ම ධනපතියා වූ බහු-කෝටිපති ඒ. වයි. ඥානම්ගේ හා බලගතු මහාරාජා සංවිධානයේ කාර්මික හා ව්‍යාපාරික



ස්ථාන ද කොළඹ හා තදාසන්න ප්‍රදේශවල 4,000ක පමණ ශ්‍රම බලකායක් වැඩ කළ හයිඩ්‍රාමනී ලිමිටඩ්හි රෙදිපිළි මෝල් ද කේ.ජී. ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ්, විශාලතම ඇඟලුම් අපනයනකරුවෙකු වූ හෙන්ටිලිස් ගාමන්ට් සහ අපනයනය සඳහා සකස් කරන ලද තවත් විශාල රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන ආයතන කිහිපයක් ද ඉන්දියානු විදේශ බැංකුව සහ ඕමාන් බැංකුව ද දෙමළ ජාතිකයන්ට අයත් සිනමා ශාලා කිහිපයක් ද වුණා. දෙමළ ජාතිකයන් වැඩි ම පිරිසක් ජීවත් වූ වැල්ලවත්ත හා තදාසන්න ප්‍රදේශය ද දෙමළ සහ ඉන්දියානු වෙළෙඳුන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ කොළඹ වාණිජ මධ්‍යස්ථානය වූ පිටකොටුව ද බෝම්බ හෙළා විනාශ කරන ලද යුද පිටියක් හා සමාන වුණා. ඒවායේ එකදු දෙමළ හෝ ඉන්දියානු ආයතනයක්වත් ඉතිරි වී නැහැ. අවතැන් කෙරුණු ගණන 150,000කට ආසන්න වුණා.

මේ සංවිධිත ක්‍රියාදාමය පිටුපස සිටියේ කිසිදු සැකයකින් තොර ව එවකට බලයේ සිටි එජාප ආණ්ඩුව හා සිංහල අන්ත ජාතිවාදී බලවේග. විශේෂයෙන් එජාප ආණ්ඩුව කළු ජූලි වැනි සිද්ධි දාමයක් මුදා හරින්නට සැලසුම් කරන්නට වූයේ තින්නවෙලි සිද්ධියට පෙර සිට ම බව උපකල්පනය කරන්නට පුළුවන්. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන, කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති සී. සිරිල් මැතිව් හා ඉඩම් හා මහවැලි සංවර්ධන ඇමති ගාමිණී දිසානායක වැන්නන් මෙවැනි සංවිධිත ක්‍රියාවලියක් පිටුපස සිටි ප්‍රධාන මෙහෙයුම්කරුවන්.

1983 කළු ජූලියට පෙර ජූලි 11 දින ලන්ඩන් ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පතේ ඉයන් වෝඩ් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකදී ජනාධිපති ජයවර්ධන කියා සිටියේ මෙලෙස.

"මම දැන් යාපනේ ජනයාගේ මතය ගැන කරදර වෙන්නේ නැහැ... දැන් අපට ඔවුන් ගැන හිතන්න බැහැ. අප හිතන්නේ ඔවුන්ගේ ජීවිත ගැන හෝ අපි ගැන ඔවුන් දරන මතය ගැන හෝ නොවේ.... උතුරේ පීඩනය වැඩි කරන තරමට මෙහි සිංහල ජනතාව වඩාත් සතුටින් සිටිනු ඇති. සැබවින් ම මා දෙමළ ජනයා කුස ගින්නේ තැබුවහොත් සිංහල ජනතාව සතුටු වනු ඇති."

කළු ජූලි සිදුවීම්වලින් පසු 1983 සැප්තැම්බර් 5 දින සිරිකොතෙහි පැවති ලංකා ජාතික වතු කම්කරු සංගමයේ විධායක කමිටුව අමතමින් එහි සභාපතිවරයා ද වූ ඉඩම් හා මහවැලි සංවර්ධන ඇමති ගාමිණී දිසානායක පැවසූ බවට වාර්තා වී ඇති පහතින් දැක්වෙන ප්‍රකාශ දෙස බලන්න.

දෙමළ ජනයා අමතා ඔහු මෙලෙස කියනවා.

"ඔබට පහර දුන්නේ කවුද? සිංහලයෝ. ඔබ ව ආරක්ෂා කළේ කවුද? සිංහලයෝ. ඔබට පහරදිය හැක්කෝත් ඔබ ව ආරක්ෂා කළ හැක්කෝත් අපටයි."

ඔහු තවදුරටත් කියා සිටියේ ඔවුන්ට ඉන්දියාවෙන් හමුදාවක් ගෙන ආ හැකි බවත් ඊට පැය 14ක් ගත වනු ඇති බවත් එහෙත් විනාඩි 14කදී අපට රටේ සෑම දෙමළෙකුගේ ම රුධිරය දේශයට පූජා කරන්නට හැකි බවත්.

තව ද ඔහු කළු ජූලිය සාධාරණය කරමින් කියා සිටියේ "කිසිවෙකුගේ නළලේ ඔහු ඉන්දියානු දෙමළෙකු හෝ යාපනේ දෙමළෙකු, මඩකලපු දෙමළෙකු හෝ උඩරට දෙමළෙකු, හින්දු දෙමළෙකු හෝ ක්‍රිස්තියානි දෙමළෙකු කියා ලියා නැත. සියල්ලෝ ම දෙමළ වෙති" කියා.

"අපි වනාන්තර විනාශ කර මන්නාරම ඇතුළු දිස්ත්‍රික්ක හතරක් සිංහල ජනතාවගෙන් ජනාවාස කිරීමට තීරණය කර තිබෙනවා. සිංහලයන්ගෙන් බහුතරයක් එහි පදිංචි කරනු ඇති. ඔබ කැමති නම් ඔබටත් එහි සංක්‍රමණය විය හැකියි."

ජේ. ආර්. ආණ්ඩුවේ කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිවරයා ද එජාප ව්‍යාත්තීය සමිති සංවිධානය වූ ජාතික සේවක සංගමයේ සභාපතිවරයා ද වූ සිරිල් මැතිව්ට අනුව සිංහලයේ අදිසි සතුරා වූයේ දෙමළ ජනයා. ඔහු 'සිංහලයේ අදිසි සතුරා' නමින් පොතක් ද ලියා පළ කළා.

1983 අගෝස්තු 4 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනා 6 වැනි සංශෝධනය පිළිබඳ විවාදයේදී සිරිල් මැතිව් කතා කළේ පිටකොටුවේ දෙමළ කඩසාප්පු ගිනිබත් කිරීම උත්කර්ෂයට නංවමින්. ඔවුන් (දෙමළුන්) එහි ජීවත් වුණේ මහාරාජාවරුන් ලෙසින් යැයි කී ඔහු එහි සිංහල වෙළෙන්දෙකුට ඇඟිල්ලක ඉඩක්වත් නොලැබුණ බවයි කීවේ. කාලයක් මුළුල්ලේ මේ අසාධාරණය තුවාලයක් මෙන් පැසවමින් තිබූ බවත් අවශ්‍ය ව තිබුණේ එක් ගිනි පුපුරක් පමණක් බවත් ජූලි 24 දින දැල් වී ගියේ එම ගිනි පුපුර බවත් ඔහු කියා සිටියා.

විශේෂයෙන් උතුරේ හා නැගෙනහිර දෙමළ ජනයා වෙන ම රාජ්‍යයක් පාදක කරගත් සටනක් පිළිගැනීමේ තත්ත්වයකට ඇද දැමූ සිංහල ස්වෝත්තමවාදී ආණ්ඩුවලට හා බලවේගවලට 70 ගණන්වල අගභාගයේ හා 80 ගණන්වල මුල්භාගයේ වෙන ම රාජ්‍යයක් සඳහා වූ සන්නද්ධ ක්‍රියාකාරිත්වය මහත් හිසරදයක් බවට පත් ව තිබුණා. මේ වකවානුවේ පාලන බලය දැරූ එජාප ආණ්ඩුවට 'දෙමළුන්ට' පාඩමක් ඉගැන්වීමට ද අවශ්‍ය ව තිබුණා. 1981 යාපනේ සංවර්ධන සභා මැතිරවරණ ක්‍රියාවලියේදී ගාමිණී දිසානායක, රනිල් වික්‍රමසිංහ, සිරිල් මැතිව් ඇතුළු තවත් එජාප නායකයන් ගණනාවක මෙහෙයවීමෙන් යාපනේට ගිය 1500ක් පමණ වූ එජාප මැර කණ්ඩායම අතෙක් ඒවා අතර යාපනේ පුස්තකාලය ගිනි තබා විනාශ කළේ ඒ වුවමනාව ද ප්‍රකාශයට පත් කරමින්. එහෙත් සිදු වූයේ මෙල්ල වීම නොව සන්නද්ධ ක්‍රියාකාරිත්වය ඇතුළු ක්‍රියාකාරකම් උත්සන්න වීම. 1983 තින්නවෙලිහිදී හමුදා සෙබළුන් 13 දෙනෙකු මරණයට පත් කිරීමේ සිද්ධිය හට ගන්නේ මේ ක්‍රියාකාරකම් දාමයේ දිගුවක් ලෙස. මේ සිද්ධිය ආණ්ඩුවේ අභිමානය බරපතළ ලෙස බිඳ දැමූ මෙතෙක් සිදු වූ බරපතළ ම සිදුවීම වුණා. මේ සිද්ධියත් සමඟ ආණ්ඩුවේ සැලැස්ම වූයේ සමස්ත දෙමළ ප්‍රජාවට ම මතක සිටින පාඩමක් ඉගැන්වීම. සිද්ධිය වූයේ යාපනේ 'දෙමළුන්' අතින් වුව ද ගාමිණී දිසානායකගේ වචනවලින් කීවොත් "දෙමළා දෙමළාමය. කිසිවෙකුගේ නළලේ ඔහු ඉන්දියානු දෙමළෙකු හෝ යාපනේ දෙමළෙකු, මඩකලපු දෙමළෙකු හෝ උඩරට දෙමළෙකු, හින්දු දෙමළෙකු හෝ

ක්‍රිස්තියානි දෙමළෙකු කියා ලියා නැත. සියල්ලෝම දෙමළුමය.” ඒ අනුව මේ නිශ්චිත අවස්ථාවේ දෙමළාට පාඩම් ඉගැන්වීමේ ප්‍රධාන කේන්ද්‍රය ලෙස ගත්තේ උතුරේ යාපනය නොව දකුණේ කොළඹ හා තදාසන්න පෙදෙස්. එහි දෙමළ ජනයා හා දෙමළ දේපළ. මින් කියැන්නේ මේ තිරශ්චීන ක්‍රියාවලිය කොළඹ හා තදාසන්න ප්‍රදේශවලට සීමා වූ බව නොව එය කෙන්ද්‍රය කර ගත් බව. එය ප්‍රධාන කේන්ද්‍රය කරගෙන රට පුරා දියත් කෙරුණු බව.

කාලයක් පුරා දෙමළ විරෝධී මනෝභාවයකින් පෙළුණු සිංහල ජන කොටස් ද අවස්ථාව උපයෝගි කර ගනිමින් මංකොල්ලකෑම ආදී වුවමනාවෙන් මෙහෙයවුණු කොටස් ද ස්වයංසිද්ධ ව මේ ක්‍රියාදාමයේ කොටස්කරුවන් වූ බව ඇත්ත. එහෙත් කළු ජූලියේ පිටුපස සැලසුම්කරුවා හා මෙහෙයවන්නා වූයේ ජනාධිපති ප්‍රමුඛ ආණ්ඩුව හා සිංහල ස්වෝත්තමවාදී සංවිධිත බලවේග.

ජූලි 23 සිද්ධියෙන් පසු ආණ්ඩුවේ සැලසුම වූයේ ඝාතනය කෙරුණු සෙබළුන්ගේ දේහ කොළඹට ගෙනවිත් දෙමළාට එරෙහි ව මිනිසුන් උසි ගන්වන, වෛරය, කෝපය හා සන්ත්‍රාසය මුදා හරින තත්ත්වයක් නිර්මාණය කළ හැකි 'උත්කර්ෂවත්' සමූහ අවමංගල උත්සවයක් පැවැත්වීම. ඉන් අනතුරු ව ස්වයංසිද්ධ ව දියත් වූ බව පෙනෙන දෙමළ විරෝධී සංහාරක, ගිනිලෑමේ හා කොල්ලකෑමේ ව්‍යාප්තිත ක්‍රියාවලියක් දියත් කිරීම. මේ ක්‍රියාකාරිත්වයේදී පහර දිය යුතු හා ගිනි තැබිය යුතු නිවාස, ව්‍යාපාර ස්ථාන සලකුණු කළ ලැයිස්තු සකස් කර තිබුණා. මෙහිදී ප්‍රධාන වශයෙන් යොදාගෙන තිබුණේ ඡන්දදායක ලැයිස්තු. විවිධ වාර්තා අනුව ගිනි තැබීමට අවශ්‍ය කරන පෙට්‍රල් විශාල ප්‍රමාණයක් කැන්වලට දමා සූදානම් කළේ බනිජ තෙල් සංස්ථාවේ ආණ්ඩුවේ වෘත්තීය සමිති ක්‍රියාකාරීන්.

සැලසුම් කළ පරිදි ඝාතනයට ලක් වූ සොල්දාදුවන් 13 දෙනාගේ අවමංගල්‍ය උත්සවය ජූලි 24 දින පූර්ණ රාජ්‍ය ගෞරව සහිත ව පවත්වන බව නිවේදනය කෙරුණා. ආණ්ඩුව අපේක්ෂා කළ පරිදි (සැලසුම් කළ පරිදි) දහස් ගණන් දෙනා ජූලි 24 දින සවස් භාගය වන විට කොළඹ කනත්තට එක් රොක් වුණා. කෙසේ වුව ද යෝජිත වේලාවට මළ සිරුරු ගෙන ආවේ නැහැ. කලබල වූ පිරිස්, කනත්තේ සිට බොරැල්ල දෙසට ගමන් කරන්න වූ කණ්ඩායමක් ඔවුන් මෙහෙයවනු පෙනෙන්නට තිබුණා. මේ මෙහෙය වූ පිරිස් අතර චිවරධාරීන් ද දක්නට ලැබුණා. වැඩි වේලාවක් ගත වූයේ නැහැ. පහරදීම්, ගිනි තැබීම්, මංකොල්ලකෑම් හා ඝාතන රැල්ලක් ආරම්භ වන්නට වුණා. ආරක්ෂක අංශ ඒවා වැළක්වීමට කිසිදු පියවරක් ගත්තේ නැතිවා පමණක් නොව ඒවාට අනුග්‍රහ දක්වන බව පෙනෙන්නට තිබුණා. ආණ්ඩුව ද ඒවා වැළක්වීමට කිසිදු පියවරක් ගත්තේ නැහැ. පමා වී ඇදිරි නීතිය පැන වුව ද සිදු වූයේ එය ඝාතකයන්ට හා මංකොල්කරුවන්ට ආරක්ෂක පලිහක් වීම. ජනාධිපති ජයවර්ධන බීබීසීය සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවකදී ආරක්ෂක අංශවල ක්‍රියාකාරිත්වය සාධාරණීකරණය කළේ පහතින් එන පරිදි.





"හමුදා අතර විශාල දෙමළ විරෝධී හැඟීමක් තිබූ බව මම සිතමි, කැරලි ගසන සිංහලයන්ට වෙඩි තැබීම සිංහල විරෝධී විය හැකි බව ඔවුන්ට හැඟෙන්නට ඇත. ඇත්ත වශයෙන් ම සමහර අවස්ථාවල ඔවුන් ඔවුන් ව දිරිගැන්වීම අපි දුටුවෙමු."

සිදුවීම් වෙද්දී ජනාධිපතිවරයා ජාතිය ඇමතුවේ දින හතරක් ගත වීමෙන් පසු 28 බ්‍රහස්පතින්දා සවස් වරුවේ. ඔහු එතෙක් සිද්ධීන් සිදු වනු බලා සිටියා. ඔහුගේ කතාවේදී සිදු කෙරෙමින් පැවති තිරශ්චීන ක්‍රියා හෙළා දැක්කේ නැහැ. දෙමළ ජන ඝාතන හෝ මැර ක්‍රියා කිසිවක් ගැන හෝ සඳහන් කළේ නැහැ. ඔහුගේ කතාව සිංහල මැර කල්ලිවල ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමක් සහ තවත් බොහෝ දේ සඳහා නොකියා කළ ආරාධනාවක් වුණා. සිංහලයන්ගේ ක්‍රියා දෙමළ වෙන්වීමේ ඉල්ලීමට ප්‍රතිචාරයක් බව පැවසූ ඔහු වෙන්වීමට පක්ෂ ව කතා කරන සියලු පක්ෂ සහ ව්‍යාපාර තහනම් කිරීමට නීති ගෙන එන බවත් සිවිල් අයිතිවාසිකම් සහ ඔවුන්ගේ වෘත්තීන්හි යෙදීමේ අයිතිය අහිමි කිරීම ඇතුළු දැඩි දඬුවම් එවැනි පක්ෂවල සාමාජිකයන්ට එරෙහි ව පනවන බවත් නිවේදනය කළා. ඔහු කතා කළේ ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවගේ ජනාධිපතිවරයා ලෙස නොව සිංහල ජනතාවගේ ජනාධිපතිවරයෙකු ලෙස.

මේ ක්‍රියාවලියේදී ආණ්ඩුවේ ප්‍රධාන උපක්‍රමික සැලසුම වූයේ දෙමළ ජනතාවට මතක සිටින පාඩමක් ඉගැන්වීම. එහෙත් ක්‍රියාවලිය ඇදී යද්දී එයට අලුත් උපක්‍රමික අවශ්‍යතාවක් එක් වුණා. එනම් මේ සිදුවීම් පිටුපස ආණ්ඩු විරෝධී වෙනත් බලවේග සිටි බව කියා පෑම හා එය දඩමීමා කරගෙන අනාගතයේ ආණ්ඩුවට අභියෝගයක් විය හැකි ඇතැම් දේශපාලන ව්‍යාපාර මර්දනය කිරීමේ උපක්‍රමික අවශ්‍යතාව.

1983 ජූලි මස 29 සිකුරාදා ජනාධිපති ජේ. ආර්ගේ විශ්වාසතම රාජ්‍ය ඇමතිවරයෙකු වූ ආචාර්ය ආනන්ද තිස්ස ද අල්විස් මෙසේ පැවසුවා.

"ඔබ ම දන්නා කරුණු කිහිපයක් දෙස බලන්න ...කෝලාහල සිදු වූ සෑම තැනක ම මේ පිළිබඳ රටාවක් තිබුණා.... පූර්ව සැලසුම් කිරීම, එක් එක් කණ්ඩායම කළ

යුතු දේ පිළිබඳ උපදෙස් දීම, උදාහරණයක් ලෙස කෝලාහල සිදු වුව ද නගරයේ සහ එහි තදාසන්න ප්‍රදේශවල නිවාස සහ සාප්පු ගිනි තැබීම් සිදු වූ සෑම අවස්ථාවක ම වෙනස් ක්‍රමයක් තිබූ බව ඔබ ම දුටුවා. කැරලිකරුවන් ඇවිත් හිමිකරුවන් හෝ සේවකයන්



මේ සංවිධිත ක්‍රියාදාමය පිටුපස සිටියේ කිසිදු සැකයකින් තොර ව එවකට බලයේ සිටි එජාප ආණ්ඩුව හා සිංහල අන්ත ජාතිවාදී බලවේග. විශේෂයෙන් එජාප ආණ්ඩුව කළු ජූලි වැනි සිද්ධි දාමයක් මුදා හරින්නට සැලසුම් කරන්නට වූයේ තින්නවෙලි සිද්ධියට පෙර සිට ම බව උපකල්පනය කරන්නට පුළුවන්. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන, කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති සී. සිරිල් මැතිව් හා ඉඩම් හා මහවැලි සංවර්ධන ඇමති ගාමිණී දිසානායක වැන්නන් මෙවැනි සංවිධිත ක්‍රියාවලියක් පිටුපස සිටි ප්‍රධාන මෙහෙයුම්කරුවන්.

හා භාණ්ඩ හෝ ඔවුන්ගේ නිවාසවලින් සහ සාප්පුවලින් පිටතට ඇදලා දාලා ඒ ඇද දැමූ භාණ්ඩවලට ගිනි තැබුවා. ඉන්පසු ඔවුන් වැඩපොළ හෝ කර්මාන්ත ශාලාව හෝ නිවස තුළට හෝ ගොස් ඉතිරි ඒවාටත් ගිනි තැබුවා. දැන්, මෙය බොරැල්ලේ සිදු වී නුගේගොඩ සිදු නොවුණා නම් රටාවක් නැහැ. එවිට නිර්මාණයේ ඒකාග්‍රතාවක් නැහැ. උපදෙස් දී තිබීමක් නැහැ. නමුත් එය සිදු වූ ඕනෑ ම තැනක එය හරියට ම සිදු ව ඇත්තේ එකම ආකාරයකින්. රටාව වූයේ මෙයයි. ඇත්ත වශයෙන් ම කොල්ලකෑම් තිබුණා. නමුත් දැන් රජය අතේ ඇති තොරතුරු අනුව කොල්ලකෑම නොකිරීමට නිශ්චිත උපදෙස් දී තිබුණා. මෙම උපදෙස් පැහැදිලි ව ම ලබා දී ඇත්තේ ඔවුන් කරන දෙයට හෝ එය කරන පුද්ගලයන්ට හෝ මහජන අප්‍රසාදය සහ ප්‍රතිරෝධය ඇති නොවීම සඳහා. තව ද සිදු වූ කොල්ලය ප්‍රදේශවාසීන් සහභාගී වූ ක්‍රියාකාරකමක් ”

"ඉතින්, ඒ තරමට ම, රටාවක් තිබුණා. සෑම කෙනෙකු ම දුටු තවත් දෙයක් වූයේ ගිනි තැබීම්වලට හා කොල්ලකෑම්වලට පැමිණි පුද්ගලයන් නම් සහ ලිපින ලැයිස්තු රැගෙන පැමිණි බව. ඔවුන් යා යුතු ස්ථානය හරියටම දැන සිටියා. ඔවුන් ඒවා සෙව්වේ නැහැ. ඔවුන් කඩදාසි කැබැල්ලක් දෙස බැලුවා, අංකයක් දෙස බැලුවා. කාර්යය කළා. එබැවින් පූර්ව සැලසුම් කිරීමක් තිබුණා. ලැබී ඇති තොරතුරුවලින් අපට දැන් තේරෙනවා මේ නම් සහ ලිපින ජන්දදායක ලැයිස්තුවෙන් ලබාගෙන ඇති බවත් මේවා මෙවැනි අවස්ථාවක් සඳහා බොහෝ කලකට පෙර සිට සකස් කර ඇති බවත්....”

එදින ම සවස් වරුවේ රූපවාහිනියෙන් හා ගුවන්විදුලියෙන් ජාතිය ඇමතූ අගමැති ප්‍රේමදාස කිසිදු පක්ෂයක් හෝ සංවිධානයක් නම් නොකර කියා සිටියේ මෙය ජනාධිපතිවරණයේදී සහ ජනමත විචාරණයේදී පරාජයට පත් වූ සහ තමන්ගේ රජය යටතේ රට ලබා ගන්නා ආර්ථික වර්ධනය ගැන ඊර්ෂ්‍යා කළ බලවේග මගින් රජය පෙරළා දැමීමේ උත්සාහයක පියවරක් බව. මෙය ආණ්ඩුවේ දැනුවත් මෙහෙයවීමෙන් දියත් කරන ලද වාර්ගික ප්‍රචණ්ඩත්වයේ වරද ආණ්ඩුවට විරුද්ධ බලවේග මත පැටවීම සඳහා වූ ආණ්ඩුවේ කුට නීච උපක්‍රමය එළිපිට ම ප්‍රකාශ කිරීමක් වුණා.

30 සෙනසුරාදා රාජ්‍ය අමාත්‍ය ආනන්ද තිස්ස ද අල්විස් රූපවාහිනිය හා ගුවන්විදුලිය හමුවේ යළිත් ප්‍රකාශ කරමින් කියා සිටියේ සිදු වී ඇත්තේ සිංහල/දෙමළ වාර්ගික ගැටුමක් පමණක් නොව රජය පෙරළා දැමීමේ ගැඹුරු සැලැස්මක් බව. හොඳින් සැලසුම් කර තිබූ මේ මෙහෙයුමේ ප්‍රධානියා ලෙස නම් නොකළ මහා බලවතෙකුට ද චෝදනා කළ ඔහු උතුරේ ත්‍රස්තවාදීන් සමඟ රහසිගත සම්බන්ධතා ඇති ඇතැම් දේශපාලන පක්ෂ මේ ප්‍රචණ්ඩත්වය පිටුපස සිටින බව කියා සිටියා.

එහෙත් මේ මහ බලවතාවත් ප්‍රචණ්ඩත්වය පිටුපස සිටින බවට කියා සිටි දේශපාලන පක්ෂවත් නම් කෙරුණේ නැහැ. ආණ්ඩුව එදින ම ඊළඟට කළේ පසුබිමේ හිම වලහෙක් සහිත පෝස්ටරයක් නිර්මාණය කර රට පුරා ඇලවීම. හිම වලහාගෙන් නිරූපණය කෙරුණේ නම් නොකළ ඒ මහ බලවතා. එනම් සෝවියට් දේශය. මේ බොරුවට අංශු මාත්‍ර හෝ පදනමක් නිර්මාණය කළ නොහැකි බව දැන දැන ම ආණ්ඩුව එය ප්‍රචාරය කළා. ඊ ළඟට ආණ්ඩුව අවජාතක කළු ජූලියේ සිය පීතෘත්වයෙන් මිදීමට ක්‍රියා කළේ කළු ජූලි දෙමළ විරෝධී ප්‍රචණ්ඩක්‍රියා පිටුපස සිටි බවට පට්ටපල් චෝදනාවක් එල්ල කරමින් 1983 ජූලි 30 දින ම හදිසි නීති රෙගුලාසි යටතේ ජනතා විමුක්ති පෙරමුණ, නව සමසමාජ පක්ෂය හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය යන පක්ෂ තුන තහනම් කිරීම. මෙහිදී ආණ්ඩුවේ සැබෑ අරමුණ වූයේ අනාගතයේ තමන්ට තර්ජනයක් විය හැකි ජනතා විමුක්ති පෙරමුණ තහනම් කර ප්‍රචණ්ඩ දේශපාලනයකට තල්ලු කර එය මර්දනය කිරීමට වාතාවරණයක් ගොඩ නඟා ගැනීම. නව සම සමාජ හා කොමියුනිස්ට් යන පක්ෂ දෙක තහනම් කළේ ඒවා තමන්ට තර්ජනයක් වූ නිසා නොව හුදු ආවරණයක් වශයෙන්. ආණ්ඩුව ජවිපෙ තහනම දිගට ම පවත්වා ගත්තේත් අනෙක් පක්ෂ දෙකේ තහනම ඉවත් කළේත් ඒ අනුව. ජවිපෙ එම උගුලට අසුව 1989 මහා මර්දනයකට ගොදුරු වුණා. එය වෙනම කතාවක්.

අප යළිදු කළු ජූලියට යොමු වන්නේ නම් එයින් අප වටහා ගත යුත්තේ ක්‍රියාවට නඟන ධනපති පක්ෂවල හා ධනපති දේශපාලනයේ උපාය හා උපක්‍රමවල සදාතනික ස්වභාවය හා සදාචාරය.

80 වැරැමේ කතාව



මුදිතා දයානන්ද

ලංකාවේ දේශපාලන ඉතිහාසය උද්ඝෝෂණ, වෘත්තීය ක්‍රියාමාර්ග හා වැඩ වර්ජනවලින් ලියැවුණක්. ඒ තරමට තීරණාත්මක වැඩ වර්ජන ඉතිහාසයේ හමුවෙනවා. වැඩ වර්ජන පිළිබඳ ඉතිහාසය ගැන කතා කරන විට 1980 ජූලි වර්ජනය අමතක කරන්නට බැහැ. එය සිදු වී වසර 46ක් ගත වී තිබෙනවා.

1977 වසරේදී පාර්ලිමේන්තුවේ 5/6ක බලයක් සහිත ව බිහි වූ එජාප පාලන කාලය ලාංකික සමාජය උඩු යටිකුරු කළ දැවැන්ත බේදවාචක ගණනාවක් ඇති කළා. ආණ්ඩුව පත් වූ විගස විධායක ජනාධිපති ධුරයක් සහිත ඒකාධිපති ව්‍යවස්ථාවක් සම්මත කරගත් අතර නව නීති සම්පාදනය කරමින් ගිය ගමනයි 80 ජූලි වර්ජනයට මග පෑදුවේ. ආණ්ඩුව රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරන්නට ගත්තා. ලංකාවේ විශාලතම පෙහෙකම්හල වූ තුල්හිරිය මෙන් ම පූගොඩ ඇතුළු කර්මාන්ත රැසක් පෞද්ගලීකරණය කළා. මේ නිසා බොහෝ පිරිසකට රැකියා අහිමි වුණා. ඒ හේතුවෙන් පෞද්ගලීකරණයට එරෙහි විරෝධතා නැඟුණේ සේවකයන් පාරට බැස උද්ඝෝෂණය කරන්නට පටන් ගැනීමෙන්.

විවෘත ආර්ථිකය හඳුන්වා දුන් මුල් අවස්ථාවේ නව රැකියා බිහි වුණත් ඊට පසු දැඩි නීති රීති පනවා සිදු කළ ශ්‍රම සූරාකෑම නිසා සේවකයන් පීඩාවට පත් වුණා. ජීවන වියදම ඉහළ යාම, වැටුප් වැඩි නොකිරීම, කම්කරුවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් මර්දනය, සේවකයන් රැකියාවලින් ඉවත් කිරීම වැනි ක්‍රියා ඔස්සේ පාලකයන් ගියේ දැඩි මර්දනකාරී ගමනක්.

මේ පීඩනය දරාගත නොහැකි වූ විට ජීවන වියදම පියවා ගැනීම සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ සේවකයන්ට දිනකට රුපියල් 10 බැගින් මසකට රුපියල් 300ක වැටුප් වැඩිවීමක් සහ ජීවන දර්ශකයට සාපේක්ෂ ව දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා වැඩපොළ සේවකයන් වැඩ වැරුවා. මීට සමගාමී ව ඒ ඒ ආයතනවලට ම ආවේණික ප්‍රශ්න පැන නැඟුණා. ඒවාට එරෙහිවත් තැනින් තැන මතු වුණේ විරෝධතා. විශේෂයෙන් රත්මලාන දුම්රිය සේවක වැඩ වර්ජනයත් එවැන්නක්. ඒ විදිහට 1980 වසරේ ජූලි 05 දින සිට විවිධ ආයතන මට්ටමෙන් ආරම්භ වූ වැඩ වර්ජන හා විරෝධතා ක්‍රමයෙන් වැඩි වුණා. මේ තත්ත්වය දුටු වෘත්තීය සමිති නායකයන් තීරණය කළේ සමස්ත මහා වැඩ වර්ජනයක් කැඳවීමට. ඒ අනුව ජූලි 18 දින මේ වැඩ වර්ජනය කැඳවූ අතර වර්ජනය කළහොත් සේවය හැර ගියා සේ සලකා වැටුප් නතර කරන ලෙසටයි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කළේ. එහෙත් වර්ජනය නැවැත්වූයේ නැහැ. වර්ජනය කළ ලක්ෂයකට අධික පිරිසකට රැකියා අහිමි වුණා. එහි ප්‍රතිඵලය වුණේ ආණ්ඩුව පාක්ෂිකයන්ගෙන් ඒ හිඩැස් පිරවීම.

ජූලි වර්ජකයන් තමන්ට රැකියා ලබාදෙන ලෙස දිගින් දිගට ම බලයට පත් වන රජයෙන් ඉල්ලීම් කළා. එහිදී ඇතැම් අවස්ථාවල දේශපාලන පළිගැනීම් ලෙස ඒ ඒ පාලකයන් විසින් තමන්ගේ හිතවතුන් නැවත සේවයේ පිහිටුවනු ලැබූ අතර ඇතැමෙකුට වන්දි හිමි වුණා. ඇතැමෙකුට සේවය අහිමි ව සිටි කාලයත් සේවයේ සිටි කාලයක් සේ සලකා විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අවස්ථාව සකස් කර දුන්නා.

අනෙක් අතට හතළිස් දහසකට ආසන්න පිරිසක් කිසි ම අවස්ථාවක් නොලැබ, කිසි ම සාධාරණ වන්දියක් නොලැබ අසරණ ව ම ජීවත් වුණා. ඇතැමුන් චිත්ත පීඩා දරාගත නොහැකි ව අසරණ ව රෝගී වී මරණයට පත් වුණා.

80 වර්ජනයේ ප්‍රතිඵල මෙසේ වුවත් ඉන් එහා ගිය අවාසියක් වැඩ කරන ජනතාවට සිදු වූ බවයි ඇතැම් වෘත්තීය සමිති නායකයන් පවසන්නේ. ඒ, මේ සිදුවීමෙන් බොහෝ කාලයක් ගත වන තෙක් වෘත්තීය ක්‍රියාමාර්ගවලට එකතු වන්නට වැඩ කරන ජනතාව බියක් දැක්වීම නිසා. මේ තත්ත්වය දන්නා පාලකයනුත් තමන්ට කැමති ලෙස බලය පවත්වාගෙන යාමට 80 ජූලි වර්ජනය පෙන්වමින් තව තවත් ජනතාව බියට පත් කළ බවයි ඔවුන් පෙන්වා දෙන්නේ.

80 ජූලි වර්ජනයට සහභාගි වූ හිටපු වෘත්තිය සමිති නායක ලෙස්ලි දේවේන්ද්‍ර පැවසුවේ මෙවැන්නක්. ඔහු; "ඒ කාලේ පාරිභෝගික භාණ්ඩ මිල වේගයෙන් ඉහළ ගියා. නමුත් අපේ වැටුප් වැඩි වුණේ නැහැ. ඒ නිසා අපි මාසෙට රුපියල් 300ක වැටුප් වැඩිවීමක් ඉල්ලුවා. ඒ මත තමයි මේ අරගලය නිර්මාණය වුණේ. ඒ අවස්ථාවේ වෘත්තිය සමිති නායකයන් තීරණය කළා සමස්ත මහා වැඩ වර්ජනයක් කැඳවන්න. ආණ්ඩුව හදිසි නීතිය ගෙනත් එය මර්දනයට



සුදානම් වුණා. රජයේ පමණක් නෙවෙයි පෞද්ගලික අංශයේ සෑම ආයතනයක්මත් හදිසි නීතිය යටතේ අත්‍යවශ්‍ය සේවා කළා. එයින් ඒ හැමෝට ම රැකියා අහිමි කළා. මේ විදිහට ලෝකෙ කොහෙවත් අත්‍යවශ්‍ය සේවා නම් කරලා නැහැ. මේ නිසා අපේ 80,000කට වැඩි පිරිසකට රස්සා නැති වුණා. වෘත්තිය සමිති නායකයෝ හිරේ ගියා. ඒක දැවැන්ත මර්දනයක්. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා වූ පසු කොටසකට නැවත රැකියා ලැබුණා. තවත් පිරිසකට වන්දි ලැබුණා. නමුත් ඒ වෙනකොට සමහර අය දිවි නසාගෙන. සමහරු දුකට පත් ව ලෙඩ වී මිය ගියා. දැන් ඒ අයගෙන් ජීවත් වන්නේ ඉතා සුළු පිරිසක්. මේ අරගලයේදී අපේ නායකයෝ, අපේ වෘත්තීය සමිතිවල තත්ත්වයයි රජයේ ශක්තියයි හොඳින් විග්‍රහ කර නොගැනීම විශාල අඩුවක්."

80 ජූලි වර්ජනය නිසා වර්ජකයන්ට මුහුණ දෙන්නට සිදු වූ තත්ත්වය නිසි ලෙස සැලසුම් කර, වෘත්තීය සමිතිවල ශක්තිය මෙන් ම ආණ්ඩුවේ ශක්තියත් කිරා මැන බලා වර්ජනය නොකැඳවීමේ ප්‍රතිඵලයක් බවයි වෘත්තීය සමිති නායකයෙකු ලෙස කලක් වැඩ කළ කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ ද පවසන්නේ. එසේ ම පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලයක් සහ විධායක බලතල සහිත ජනාධිපතිවරයෙකුගේ නායකත්වය සහිත ආණ්ඩුවට තමන් කැමති විදිහට පාලනය ගෙන යා හැකි වීමත් මීට බලපෑ බවයි ඔහුගේ අවධාරණය.

අදහස් දක්වන කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරයා; "ජූලි වර්ජකයන්ගෙන් කොටසකට විටින් විට විවිධ ආණ්ඩු යටතේ යම් යම් සහන ලැබුණා. නමුත් සමස්තයක් විදිහට මේ වර්ජනයට සහභාගි වීමෙන් රැකියා අහිමි වූ ලක්ෂයකට අධික රජයේ සේවකයන් දශක ගණනාවක් තිස්සේ දැඩි පීඩනයකට ලක් ව ජීවත් වුණා. විටින් විට යම් යම් පාලන යටතේ ඇතැම් කණ්ඩායම්වලට සහන ලබා දී තිබෙනවා. 80 දශකයේ පමණක් නොවෙයි ඉන්පසු බිහි වූ සෑම පාලනයක් යටතේ ම වැඩකරන ජනතාවට තමන්ගේ අයිතීන් දිනාගන්න දැඩි අරගලයක් කරන්න සිදු වුණා. ඒ හැම විටක ම ඒ ඒ ආණ්ඩු මර්දනකාරී ව කටයුතු කළා. නමුත් දැන් තත්ත්වය වෙනස්. වැඩ කරන ජනතාවගේ ආණ්ඩුවක් තිබෙන නිසා ඔවුන්ගේ අවශ්‍යතා හොඳින් හඳුනනවා. ඒ නිසා පළමු අය වැයෙන් ම රාජ්‍ය සේවක වැටුප් වැඩි කළා. සේවක අවම වැටුප් සීමාව ඉහළ දැම්මා. මේ වසරේ අය වැයෙන් වතු කම්කරුවන්ගේ දෛනික වැටුප වැඩි කරන්න මහා භාණ්ඩාගාරයෙනුත් මුදලක් වෙන් කළා. මේ කිසිවක් ආණ්ඩුව ලබා දුන්නේ අරගලවලට පිළියම් විදිහට නොවෙයි. කලින් ආණ්ඩු කාලේ වැඩ කරන ජනතාව කළ අරගලවලට මේ ආණ්ඩුව යටතේ පිළියම් යෙදුවා. වැඩ කරන ජනතාවගේ ඇත්ත ප්‍රශ්නය හඳුනා ගනිමින් පිළිතුරු සෙව්වා."

නියෝජ්‍ය අමාත්‍යවරයා පවසන කරුණ මේ වන විට යථාර්ථයක් ව අවසන්. දෛනික වැටුප වැඩි කරන ලෙස ඉල්ලා වතු කම්කරු ජනතාව අරගල කළේ දශක ගණනාවක්. එය මල්ඵල ගැන්වුණේ මේ ආණ්ඩුව යටතේ. ඒ අනුව වතු හිමියන් සමඟ දීර්ඝ ව සාකච්ඡා කර වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1750 දක්වා ඉහළ දැමුණේ එයින් රුපියල් 200ක් මහා භාණ්ඩාගාරයෙන් ගෙවන එකඟතාව මත.

2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවකයෙකුගේ අවම මූලික වැටුප රුපියල් 15,750කින් ඉහළ නැංවුණේ වසර 03ක්, අදියර 03ක් යටතේ වන සැලසුමකට අනුව. එහිදී මෙතෙක් ලබා දුන් අතුරු දීමනා සියල්ලත් මූලික වැටුපට ඒකාබද්ධ කළා. 2025 ජනවාරි 01 දින හෝ ඉන්පසු විශ්‍රාම යන රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුපත් මේ වැටුප් පරිමාව මතයි සැකසෙන්නේ. රාජ්‍ය සේවකයන්ගේ ආපදා ණය සීමාව රුපියල් 250,000 සිට රුපියල් ලක්ෂ 400,000 දක්වා නංවා තිබෙනවා.

පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීමට රජයට නොහැකි වුවත් 2025 අංක 11 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන (සංශෝධන) පනත ගෙනෙමින් සේවකයන්ගේ අවම වැටුප 2025 ජනවාරි 01 දින සිට රුපියල් 9500කින් ද 2026 ජනවාරි 01 දින සිට රුපියල් 3000කින් ද වැඩි කළා.

වත්මනේ සේවක අයිතීන් වෙනුවෙන් මෙවැනි පසුබිමක් ගොඩනැඟී ඇති අතර කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරයා පෙන්වා දෙන පරිදි මේ දක්වා කිසි ම සාධාරණ සේවක උද්ඝෝෂණයක්, වැඩ වර්ජනයක් මර්දනය කර නැහැ. ඒ අයිතිය ඔවුන්ට ලබා දී තිබෙනවා. ඉදිරියටත් එහි වෙනසක් නොමැති බවයි ඔහුගේ අවධාරණය.



ඇමරිකා-ඉරාන සාම කතා

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

2026 ජූනි 14 දින Donald Trump සිය 80 වැනි උපන්දිනය සැමරුවා. එදින ම ඉරානයට එරෙහි වත්මන් ඇමරිකා-ඊශ්‍රායල යුද්ධයට දින 108ක් සැපිරුණා. ධවල මන්දිරයේ 4000කට අධික මහා සෙනඟක් මැද උපන්දිනය සැමැරූ ට්‍රම්ප්ට එදා ලැබුණේ අපූරු උපන්දින තෑග්ගක්. ඒ, වොෂින්ටනය සහ ටෙහෙරානය වත්මන් යුද්ධය අවසන් කිරීමට ලෙබනනය ඇතුළු සියලු පෙරමුණුවල මිලිටරි මෙහෙයුම් ස්ථිර ලෙස අවසන් කරන බව ප්‍රකාශ කරමින් අවබෝධතා ගිවිසුමකට ඉලෙක්ට්‍රොනික ව අත්සන් තැබීම. අන්‍යෝන්‍ය එකඟතාවෙන් දීර්ඝ කළ හැකි' දින 60ක් ඇතුළත අවසාන ගිවිසුමකට එළඹිය යුතු බව මේ අවබෝධතා ගිවිසුමේ සඳහන් ව තිබුණා.

මේ සුවිශේෂ දිනයේ ගැටුම්කාරී දෙරට ගිවිසුමකට එළැඹුණු බව නිවේදනය කළේ එහි මැදිහත්කරු ලෙස ක්‍රියා කරන පාකිස්තානයේ අග්‍රාමාත්‍ය Shehbaz Sharif. ඇමරිකානු ජනාධිපති Donald Trump විසින් එය තහවුරු කරනු ලැබුවා. ඒ ආසන්නතම සිකුරාදා (ජූනි 19) එය අත්සන් කිරීමේ උත්සවය පැවැත්වීමටයි කටයුතු යොදා තිබුණේ. එහෙත් එම බලාපොරොත්තුව ඉරිදා (ජූනි 21) තෙක් කල් දමන්නට කාරණා වී තිබුණේ අවාසනාවන්ත ආකාරයට. ඒ, ඇමරිකාව ලෝකයට ම අණබෙර ගසා සාම ගිවිසුමක් සහ සටන් විරාමයක් ගැන කියද්දී එරට සමීපතම සගයෙකු ලෙස සැලකෙන සහ මේ යුද්ධයේ ප්‍රධාන පාර්ශ්වකරුවකු වන ඊශ්‍රායලයේ අන්තනෝමතික හැසිරීමක් හේතුවෙන්. ගිවිසුම අත්සන් තැබීම සමඟ ම හෝර්මූස් සමුද්‍ර සන්ධිය විවෘත කරන බවට ඉරානය ප්‍රකාශ කළා. එහෙත් ඒ සමඟ ම ඉරාන සගයකු වන ලෙබනනය වෙත ඊශ්‍රායලය අඛණ්ඩ ප්‍රහාර මාලාවක් ඇරඹුවා. ඒ හේතුවෙන් හෝර්මූස් සමුද්‍ර සන්ධිය නැවතත් වසා දමන බවටයි ටෙහෙරානය නිවේදනය කළේ. ඒ සමඟ සිකුරාදාට නියමිත ව තිබූ ඇමරිකා එක්සත් ජනපදය සහ ඉරානය අතර සාකච්ඡාව ඉරිදා ස්විට්සර්ලන්තයේදී ආරම්භ වන බව පාකිස්තානය නිවේදනය කර තිබුණා.

ඉරානයේ පාර්ලිමේන්තු කථානායක Mohammad Bagher-Ghalibaf, විදේශ අමාත්‍ය Abbas Araghchi සහ අනෙකුත් ජ්‍යේෂ්ඨ නිලධාරීන් ඇතුළු ඉරාන දූත පිරිසක් ස්විට්සර්ලන්තයට පිටත් ව යන බව ඉරාන විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශක Esmail Baghaei සෙනසුරාදා තහවුරු කරන්නට යෙදුණා. වොෂින්ටනයේදී උප ජනාධිපති JD Vance තහවුරු කළේ එක්සත් ජනපදයේ ඉහළ ම සාකච්ඡාකරුවන් වන Jared Kushner සහ Steve Witkoff ස්විට්සර්ලන්තයේ සිටින බවක්. පාකිස්තාන සහ කටාර් මැදිහත්කරුවන් ඉරිදා වන විට පැමිණ සිටියේ ස්විට්සර්ලන්තයේ බර්ගන්ස්ටොක් කඳුකර නිකේතනයේදී පැවැත්වෙන ඇමරිකා එක්සත් ජනපද-ඉරාන සාකච්ඡාවලට එක්වන්නට. ඒ අනුව ආරම්භ වුණේ අවසන් ඇමරිකා-ඉරාන ගිවිසුමක් සඳහා වන තාක්ෂණික මට්ටමේ සාකච්ඡාවක්.

ගිවිසුමට අත්සන් තැබූ දිනවල ම ප්‍රංශයේ ස්විට්සර්ලන්ත දේශ සීමාව අසල එවියන්-ලෙස්-බේන්ස්හි පැවැත්වුණු G-7 රටවල නායකයන්ගේ රැස්වීමේදී ඔවුන් ඉරානය සමඟ ඇමරිකා ගනුදෙනුව සහ යුක්‍රේනයට එරෙහි රුසියානු යුද්ධය කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කර තිබුණා. මැදපෙරදිග ගැටුම අවසන් කිරීම සඳහා ගිවිසුම ඉක්මනින් අවසන් කරන ලෙස එක්සත් ජනපද ජනාධිපති Donald Trumpගෙන් ඉල්ලා සිටීමට ඒ අය යුහුසුළු වූයේ මේ යුද්ධයේ අතුරු පලයක් ලෙස ලෝකයේ ම ආර්ථිකය උඩු යටිකුරු කිරීමට සමත් වූ හෝර්මූස් සමුද්‍ර සන්ධිය ආශ්‍රිත ව හටගෙන තිබූ අර්බුදය නිසා.

ඉලෙක්ට්‍රොනික ව අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම සෙසු ලෝකයට විවෘත නොවූ නමුත් එය කරුණු 14කින් යුතු බව ඉරාන රාජ්‍ය මාධ්‍යයක් වාර්තා කර තිබුණා. එම කරුණු අතරට වත්මන් යුද්ධයට සම්බන්ධ ලෙබනන් ඇතුළු සියලු පෙරමුණුවල ස්ථිර සටන් විරාමයක්, ඉරානයේ අභ්‍යන්තර කටයුතුවලට ඇමරිකාව මැදිහත් නොවීම, දින 30ක් තුළ ඇමරිකානු නාවික අවහිරතාව ඉවත් කිරීම, ඇමරිකානු හමුදා ඉරානයෙන් ඉවත් වීම, දින 30 තුළ 'ඉරාන සැලසුම් යටතේ' හෝර්මූස් සමුද්‍ර සන්ධිය නැවත විවෘත කිරීම, එක්සත් ජනපදය සහ ඔවුන්ගේ මිත්‍ර පාර්ශ්ව අවම වශයෙන් ඩොලර් බිලියන 300ක් වටිනා ප්‍රතිසංස්කරණ සැලසුම් ආධාර ඉරානයට ලබා දීම, ඉරානයේ ඉන්ධන සහ ඛනිජ නිෂ්පාදන සඳහා වන සීමා ඉවත් කිරීම, න්‍යෂ්ටික අවි නිෂ්පාදනය නොකිරීමට ඉරානයේ කැපවීම නැවත අවධාරණය කිරීම, කලාපය තුළ තම හමුදා වැඩි නොකිරීමට සහ නව සම්බාධක නොපැමිණවීමට එක්සත් ජනපදය කැප වී සිටීම ඇතුළත් ව ඇති බව නිල නොවන ආරංචි මාර්ග පෙන්වා දුන්නා.

කෙසේ වුවත් අවසන් සාකච්ඡා ආරම්භ කෙරෙන්නේ ඉරානයේ තහනම් කර ඇති මුදල් අඩක් මුදාහැරීම, ඉන්ධන සඳහා පනවා ඇති සීමා අත්හිටුවීම සහ නාවික අවහිරය ඉවත් කිරීමෙන් පසුව බවයි තවත් වාර්තාවක සඳහන් වුණේ. ඒ අනුව ඉරානයට දළ වශයෙන් ඩොලර් බිලියන 24ක් වූ එහි තහනම් කර ඇති දිගුකාලීන අරමුදලින් අඩක් ලැබෙනු ඇතැයි ඉරානයේ බලගතු විප්ලවවාදී ආරක්ෂක හමුදාව පවසා තිබුණා. එහෙත් ගිවිසුමේ

නියමයන්ට අනුකූල බව පෙන්නුම් කරන තුරු ඉරානයට මුදල් කිසිවක් නොලැබෙන බව එක්සත් ජනපද නිලධාරීන් පවසා තිබුණා.

මේ සියල්ල අතර ගිවිසුමේ තීරණාත්මක සාධකය බවට පත් ව සිටියේ ඊශ්‍රායලය. නව ගිවිසුම සාකච්ඡාවට භාජනය වූ දින දෙක තුළ පමණක් ඊශ්‍රායලය දකුණු ලෙබනනයේ සටන් විරාමය 84 වතාවක් උල්ලංඝනය කර ඇති බවත් මේ ප්‍රහාර දිගට ම පැවතුණහොත් 'දැඩි ප්‍රතිචාරයක්' දක්වන බවටත් ඉරාන හමුදාව පැවසිමත් සමඟ නැවත වතාවක් මේ නව ගිවිසුම ද බිඳි යා හැකි බවට සැක සංකා ඉහළ ගියා. දකුණු ලෙබනනයේ නබාටියේහිදී වාහන කිහිපයකට එල්ල වූ ඩ්‍රෝන ප්‍රහාර ඇතුළු ඊශ්‍රායල ප්‍රහාරවලින් අවම වශයෙන් පුද්ගලයින් 04 දෙනෙකු මිය යාමෙන් පසුව මේ අනතුරු ඇඟවීම නිකුත් කර තිබුණා. මේ සමඟ ඊශ්‍රායල අගමැති Benjamin Netanyahuගේ හැසිරීම පිළිබඳ තමා "සතුටින් නොසිටින" බව එක්සත් ජනපද ජනාධිපති Donald Trump පැවැසූ අතර ඊශ්‍රායල නායකයා "මෙයට වඩා වඩා වගකීම් සහගත විය යුතු" බවයි ඔහු අවධාරණය කර තිබුණේ.

ඒ අතර සාම සාකච්ඡාවට දින නියමිත ව තිබූ ජූනි 19 දින හිස්බුල්ලා සංවිධානය සමඟ අලුත් සටන් විරාමයකට එළැඹීමට ඊශ්‍රායලය එකඟ වී තිබුණත් ලෙබනනයේ ඔවුන්ගේ ප්‍රහාර ජූනි 20 දින දක්වාත් පැවතුණා. අවම වශයෙන් මේ හේතුවෙන් පුද්ගලයන් 32 දෙනෙකු මිය ගිය බව ලෙබනනයේ සිවිල් ආරක්ෂක සහ රාජ්‍ය මාධ්‍ය වාර්තා ප්‍රකාශ කළා. ජූනි 19 දින ඊශ්‍රායල ප්‍රහාරවලින් පුද්ගලයන් 83 දෙනෙකු මිය ගොස් 141 දෙනෙකු තුවාල ලැබූ බව ලෙබනනයේ සෞඛ්‍ය අමාත්‍යාංශය පෙන්වා දී තිබුණා.

ලෙබනනයේ හටගත් මේ ඊශ්‍රායල 'අපරාධ', සටන් විරාමයක් ස්ථාපිත කිරීම සඳහා එක්සත් ජනපදය දුන් පොරොන්දු උල්ලංඝනය කිරීමක් ලෙස හැඳින් වූ ඉරානයේ ඉස්ලාමීය විප්ලවවාදී ආරක්ෂක බලකාය (IRGC) සෙනසුරාදා හෝර්මූස් සමුද්‍ර සන්ධියට නැවත සීමා පනවන බව පැවසුවා.

මේ අතර එක්සත් ජනපදය සහ ඉරානය අතර ගිවිසුමට සිය රට බැඳී නොමැති බව ඊශ්‍රායල නිලධාරීන් පවසා තිබුණා. ඔවුන් පැවසුවේ හිස්බුල්ලා සමඟ සටන අවසන් කිරීමට හෝ ලෙබනනයෙන් එහි හමුදා ඉවත් කර ගැනීමට හෝ තමන් එකඟ වී නැති බවක්. එහෙත් ජනාධිපති Trump, පාකිස්තාන මැදිහත්කරුවන් සහ ඉරානය පවසා ඇත්තේ මේ ගිවිසුමට ලෙබනනය ඇතුළු සියලු පෙරමුණුවල සතුරුකම් නැවැත්වීම ඇතුළත් බවක්.

මේ සමඟ ලෝකය ම අර්බුදයකට ඇද දැමූ හෝර්මූස් සමුද්‍ර සන්ධිය හරහා ඉන්ධන නැව්ගත කිරීම් ඉක්මනින් සාමාන්‍ය තත්ත්වයට පත්වීමට ඇති ඉඩකඩ නැවත ඇතිවී ගියා. නව සාම ගිවිසුම එහි සියලු පාර්ශ්ව විසින් එක සේ පිළිගැනීම සම්බන්ධයෙන් මතු ව ඇති මෙවැනි අවිනිශ්චිතතා සහ අබණ්ඩ ඊශ්‍රායල හිතුවක්කාරකම් මෙන් ම ඉරානය තුළ ඇමරිකාව අතීතයේ ද 'පොරොන්දුවලට ගරු කිරීමට අපොහොසත් වීම' සම්බන්ධයෙන් මතු ව ඇති තදබල අවිශ්වාසය හේතුවෙන් ලොව දේශපාලනික විචාරකයන්ගේ මතය වී ඇත්තේ ඒ පිළිබඳ තවමත් බොහෝ අවිනිශ්චිතතා පවතින බව.





වත්මන් ගැටුම ඇරඹුණේ ඇමරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය 2026 පෙබරවාරි 28 දින ඉරානය වෙත ගුවන් ප්‍රහාර 900ක් පමණ දියත් කිරීමත් සමඟ.

මේ යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස දහස් ගණනක් ජීවිත හානි, සිවිල් සහ හමුදා යටිතල පහසුකම් හානි විශාල ලෙස සිදු වුණා. එහිදී වැය වූ ගෝලීය ආර්ථික පිරිවැය ඩොලර් බිලියන 60 සිට 132 දක්වා ඇස්තමේන්තු කර තිබෙනවා. ගැටුමේදී එක්සත් ජනපදයට හමුදා භටයන් 13ක් අහිමි වූ අතර ඉරානයට උත්තරීතර නායක Ayatollah Ali Khamenei සහ ඉහළ නිලධාරීන් දුසිම් ගණනක් ඇතුළු 3375කට වැඩි පිරිසක් අහිමි වුණා. ඉන් 170 දෙනෙකු කාන්තා පාසලකට එල්ල වූ ටොමාහෝක් මිසයිල ප්‍රහාරයකින් මිය ගියා. ඉරානයේ ඊශ්‍රායල මිසයිල සහ ඩ්‍රෝන ප්‍රහාරවලින් 26 දෙනෙකු සහ ගල්ෆ් රාජ්‍යයන්හි තවත් දුසිම් ගණනක් මිය ගියා. හිස්බුල්ලා ප්‍රහාරවලට ප්‍රතිචාර වශයෙන් ඊශ්‍රායලය ප්‍රධාන ප්‍රහාරයක් දියත් කර ඇති ලෙබනනයේ අවම වශයෙන් 2000ක් පමණ මිය ගොස් තිබෙනවා.

මේ නිසා ලෝකය ම බලා සිටියේ යුද්ධය අවසන් කිරීමට මූලික ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ඇමරිකා සහ ඉරාන නිලධාරීන් ජූනි 21 දින ස්විට්සර්ලන්තයේදී ආරම්භ කළ සෘජු සාකච්ඡාව දෙස.

ස්විට්සර්ලන්ත සාකච්ඡා ආරම්භ වීමෙන් පසු, ඉරානය "ලෙබනනයේ ඉහළ වැටුප් ලබන ඉරාන නියෝජිතයන් කරදර ඇති කිරීම වහා ම නතර කළ යුතු" බව ජනාධිපති Donald Trump සමාජ මාධ්‍ය ඔස්සේ කියා සිටියා. එසේ නොකළහොත් ඉරානයට නැවතත් දැඩි ලෙස පහර දෙන බවට ඔහු තර්ජනය පවා කළා. ඇමරිකා නියෝජිත Marco Rubio, ඇමරිකා-ඉරාන යුද්ධය සහ ඊශ්‍රායල-හිස්බුල්ලා ගැටුම රාජ්‍ය තාන්ත්‍රික ව වෙන් ව තබා ගැනීමට උත්සාහ කළ බවක් පෙනී ගියා. සාකච්ඡා ආරම්භ වීමට පෙර, උප ජනාධිපති ජේ.ඩී. වැන්ස් පවසා තිබුණේ, න්‍යෂ්ටික ගැටලුව සහ ලෙබනනය සම්බන්ධයෙන් එක්සත් ජනපදය ප්‍රගතියක් අපේක්ෂා කරන බවක්. ඉරානය සිය කලාපීය අස්ථාවරත්වය සඳහා කරන බලපෑම් නවතා එරට දිගුකාලීන න්‍යෂ්ටික අවි අභිලාෂ අත්හැරීමට කැමැති නම් ඇමරිකාව ඔවුන් සමඟ යහපත් සබඳතාවකට එළඹීමට කැමැත්තෙන් සිටින බවක් ඔහු පැවසුවා. මේ අනුව මූලික ව අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය කාරණා තවදුරටත් සාකච්ඡා කිරීමට හා ඉරානයේ න්‍යෂ්ටික වැඩසටහනේ ඉරණම පිළිබඳ සාකච්ඡා කිරීමට එකඟතාවට පැමිණීමටත් ඉදිරි දින 60ක කාලයක් ඉතිරි ව තිබුණා.



කඩවුණු පොරොන්දු සහ මහජන විශ්වාසය

අගමැති කීර් ස්ටාමර්

නිහාල් පීරිස්

ජනතාව අතර බෙහෙවින් අප්‍රසාදයට පත් ව සිටින බව පැවසෙන බ්‍රිතාන්‍ය අගමැති කීර් ස්ටාමර් ඔහුගේ කම්කරු පක්ෂ නායකත්වයෙන් සහ අගමැති ධුරයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වෙනවා. මේ බව ඔහු නිල වශයෙන් ප්‍රකාශයට පත් කළා. ඒ, ඔහුට ඉල්ලා අස්වන ලෙස පක්ෂයෙන්මත් දැඩි පීඩනයක් එල්ල වූ පසුබිමක. කෙසේ වෙතත් පක්ෂය නව නායකයකු/ අගමැතිවරයකු පත් කරගන්නා තෙක් ඔහු එම ධුරවල කටයුතු කරනු ඇති.

ස්ටාමර් සහ ඔහුගේ කම්කරු පක්ෂ ආණ්ඩුව මේ වන විට යුරෝපයේ දරුණු ම දේශපාලන අර්බුදයකට මුහුණ දී සිටින පාර්ශ්වයක්. ඔවුන්ගේ ජනප්‍රියත්වය වේගයෙන් කඩා වැටෙමින් ඇති අතර ඔවුන්ට දැඩි අභියෝගයක් එල්ල කරමින් ඇතැම් විරුද්ධ පක්ෂ ඉදිරියට එමින් ඇති ආකාරයත් දැක ගන්නට පුළුවන්.

අගමැතිවරයාගේ සහ ආණ්ඩුවේ ජනප්‍රියත්වය පිරිහෙමින් ඇති පසුබිමක ස්ටාමර් පක්ෂ නායකත්වයෙන් සහ අගමැති ධුරයෙන් ඉල්ලා අස්විය යුතු බවට කාලයක සිට ම ඉල්ලීම් ඉදිරිපත් වෙමින් තිබුණා. ඔහුගේ පක්ෂයේ ම ඇතැම් මන්ත්‍රීවරුන්ගෙන් පවා මේ ඉල්ලීම ඉදිරිපත් වීම විශේෂත්වයක්. ඔවුන් පැවසුවේ ස්ටාමර් වෙනුවට පක්ෂය වහා ම වෙනත් නායකයකු පත් කරගත යුතු බව.

කීර් ස්ටාමර් නායකත්වය දෙන කම්කරු පක්ෂය බලයට පත් වූයේ 2024 ජූලි 05 දින. එකල අතිශයින් ජනප්‍රිය පක්ෂයක් වූ එය පාර්ලිමේන්තුවේ බහුතරයක් දිනා ගන්නට සමත් වුණා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ ආසන 650න් ආසන 411ක් ම දිනා ගන්නට 2024 ජූලි 04 දින පැවැති මහා මැතිවරණයේදී කම්කරු පක්ෂයට හැකි වුණා. (එතෙක් බලයේ සිටි කන්සර්වේටිව් පක්ෂයට දිනාගත හැකි වූයේ ආසන 121ක් පමණයි). මැතිවරණයේදී විශාල ජයග්‍රහණයක් හිමි කරගත් කම්කරු පක්ෂය මෙවැනි පසුබැමකට ලක් ව සිටින්නේ වසර දෙකක් වැනි කෙටි කාලයක වීම විශේෂත්වයක්.

පක්ෂය දුන් පොරොන්දු ඒ ආකාරයෙන් ඉටු කිරීමට අසමත් වීම, නායකයකු ලෙස ස්ටාමර්ගේ පවතින දුර්වලතා ආදිය මේ තත්ත්වයට හේතු වී තිබෙනවා. කම්කරු පක්ෂය බලයට පැමිණි විට තම ජීවිත වඩාත් සුවපහසු වනු ඇතැයි යන විශ්වාසයක් ජනතාවට තිබුණා. ජීවන වියදම අඩු කරන බවට කම්කරු පක්ෂය පොරොන්දු වීම වැනි කාරණා මීට බලපෑවා. මෙයට අදාළ ව ආණ්ඩුව යම් පියවර ගත්තත් ජනතාවට දැනෙන තරමින් ජීවන වියදම අඩු වී නැති බවට චෝදනා මතු වෙනවා. රජයේ වියදම් අඩු කිරීමේ අරමුණෙන් සමාජයේ ඇතැම් ස්ථරවලට ලබා දුන් සහනාධාර ආදිය කප්පාදු කිරීමත් ආණ්ඩුවේ ජනප්‍රියත්වය අඩු කිරීමට දායක වූ තවත් කාරණයක්. ආර්ථික අතින් පහළ මට්ටමේ ජීවත් වන ජන කොටස් මේ නිසා දැඩි අපහසුතාවට පත් වුණා.

බ්‍රිතාන්‍යයේ සිටින අනවසර සංක්‍රමණිකයන් පිළිබඳ ප්‍රශ්නයත් බොහෝ බ්‍රිතාන්‍ය ජාතිකයන්ට නිසරදයක් වී ඇති කාරණයක්. මේ සංක්‍රමණිකයන් වෙනුවෙන් ජනතාවගේ බදු මුදල් වැය කරන්නට සිදු වීම ජනතාව තුළ නොරුස්නාකමක් ඇති කර තිබෙනු දැකිය හැකියි. සංක්‍රමණිකයන් නිසා බ්‍රිතාන්‍යයේ

සංස්කෘතික අනන්‍යතාව අනතුරට ලක් ව ඇති බවත් ඇතැමුන් පෙන්වා දෙන්නක්. රටේ අපරාධ, ත්‍රස්ත ක්‍රියා ආදිය වැඩි වීමටත් අනවසර සංක්‍රමණිකයන් හේතු වී ඇති බවට අදහස් පළ වෙනවා.

මෙවැනි පසුබිමක සංක්‍රමණ විරෝධී උද්ඝෝෂණ සහ රැලි ආදිය නිතර පැවැත්වෙන අතර ඒවාට එක් ව සිටින්නේ දස දහස් ගණනින් විරෝධතාකරුවන්. පසුගිය මාස 20ක පමණ කාලයේ මෙවැනි විරෝධතා 300කට වැඩි ගණනක් පවත්වා ඇති බව සඳහන්.

මැයි මාසයේ ද මෙවැනි විශාල විරෝධතාවක් ලන්ඩන් නුවර

ජනතාවට සහ ව්‍යාපාරවලට බදු සහන ආදිය ලබා දෙන බව මේ පක්ෂයේ තවත් ආකර්ෂණීය පොරොන්දුවක්. මීළඟ මහා මැතිවරණයේදී Reform UK වෙතින් ප්‍රධාන පක්ෂ දෙක වන කම්කරු පක්ෂයට සහ කන්සර්වේටිව් පක්ෂයට දැවැන්ත අභියෝග යක් එල්ලවනු ඇති බවයි දේශපාලන විශ්ලේෂකයන්ගේ අදහස.


නිගෙල් ෆරාජ්

පැවැත්වුණු අතර ඊට 60,000කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වී තිබුණා. 2025 සැප්තැම්බර් මාසයේ පැවති මෙවැනි ම විරෝධතාවකට 150,000ක් පමණ සහභාගි වූ බව මාධ්‍ය වාර්තාවල දැක්වුණා.

අනවසර සංක්‍රමණිකයන් පිළිබඳ අර්බුදය විසඳීම සඳහා රජය ප්‍රමාණවත් තරමින් පියවර නොගන්නා බවයි ජනතාවගේ අදහස. මෙයත් කම්කරු පක්ෂ ආණ්ඩුවේ ජනප්‍රියත්වය බිඳ දැමීමට හේතු වී ඇති තවත් ප්‍රධාන සාධකයක්. පක්ෂයේ සිදු වූ බව පැවසෙන මූල්‍ය අක්‍රමිකතා ගැනත් පසුගිය කාලයේ චෝදනා එල්ල වුණා. ජනතාව තුළ පක්ෂය පිළිබඳ පැවති විශ්වාසය බිඳ දැමීමටත් මෙය හේතුවක්.

කීර් ස්ටාමර් ශක්තිමත් නායකයකු නොවන බවටත් ජනතාව තුළ අදහසක් තිබෙනවා. මැයි මාසයේ පවත්වන ලද ජනමත සමීක්ෂණයකට අනුව ඔහු පිළිබඳ යහපත් අදහසක් දරන්නේ බ්‍රිතාන්‍ය ජනතාවගෙන් 23%ක් පමණයි. 69%ක් ම ඔහු ගැන දරන්නේ අයහපත් ආකල්පයක්. බ්‍රිතාන්‍ය ජනතාවගෙන් 50%ක් ඔහු අගමැති ධුරයෙන් සහ කම්කරු පක්ෂ නායකත්වයෙන් ඉවත් විය යුතු යැයි කල්පනා කරන බවත් මේ සමීක්ෂණවලින් ප්‍රකාශ වී තිබුණා.

බ්‍රිතාන්‍යයේ මීළඟ මහා මැතිවරණය පැවැත්වීමට නියමිත ව ඇත්තේ 2029 වසරේ. ස්ටාමර් දිගට ම කම්කරු පක්ෂ නායකත්වයේ සිටියහොත් එම මැතිවරණයේදී පක්ෂය පරාජය වනු ඇතැයි යන විශ්වාසයක් පක්ෂයේ ඇතැමුන් තුළ පවතිනවා.

2029 මහා මැතිවරණයට අදාළ ව පවතින මේ සැක සංකාවලට තල්ලුවක් දෙන ආකාරයේ සිදුවීමක් මැයි මාසයේ සිදු වුණා. බ්‍රිතාන්‍යයේ පළාත් පාලන ආයතන රැසක් වෙනුවෙන් නියෝජිතයන් තේරීමේ පුංචි මැතිවරණයක් මැයි 07 දින පැවැත්වුණා. මෙහිදී එංගලන්තයේ පළාත් පාලන ආයතන 136ක ආසන 5,034ක් වෙනුවෙන් ඡන්ද විමසීම් සිදු වුණා. මේ අතරින් වැඩි ම ආසන ගණනක් දිනා ගත්තේ Reform UK නැමැති පක්ෂය. මෙය කලින් ප්‍රධාන පක්ෂයක් ලෙස සැලකුණේ නැහැ. නිගෙල් ෆරාජ් නායකත්වය දරන මේ පක්ෂය ආසන 1,454ක් දිනාගන්නට සමත් වූ අතර කම්කරු පක්ෂය දිනා ගත්තේ ආසන 1,068ක් පමණයි.

මෙවර ඡන්ද විමසීම් පැවැත්වුණු ආසනවලින් Reform UK පක්ෂය කලින් දිනාගෙන සිටියේ ආසන 2ක් පමණයි. ඒ අනුව ඔවුන් කෙතරම් ඉදිරියට පැමිණ ඇත්ද යන්න තේරුම්ගත හැකියි. කම්කරු පක්ෂය කලින් දිනාගෙන සිටි ආසනවලින් ආසන 1,498ක් පරාජය වී තිබෙනවා. මෙය ඉතා දරුණු පරාජයක් බව අමුතුවෙන් කිව යුතු නැහැ.

2024 කම්කරු පක්ෂය බලයට ඒමට පෙර, දිගු කලක් රට පාලනය කළ කන්සර්වේටිව් පක්ෂයටත් මෙහිදී හිමි ව ඇත්තේ දැඩි පරාජයක්. ඔවුන් දිනාගෙන තිබුණේ ආසන 801ක් පමණයි. ගිය වර ඔවුන් දිනාගෙන සිටි ආසන 563ක් මෙවර එම පක්ෂයට අහිමි වී තිබෙනවා. මේ අනුව පෙනෙන්නේ බ්‍රිතාන්‍ය ජනතාවට ප්‍රධාන පක්ෂ දෙක ම එපා වී ඇති ආකාරයක්.

හරිත පක්ෂය (Green Party) සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන් (Liberal Democrats) යන කුඩා පක්ෂ ද බෙහෙවින් ඉදිරියට පැමිණ ඇති ආකාරය දක්නට ලැබුණා. මෙවර විශාල වශයෙන් ඉදිරියට පැමිණ සිටින Reform UK පක්ෂය සැලකෙන්නේ දක්ෂිණාංශික ජාතිකවාදී පක්ෂයක් හැටියට.

බ්‍රිතාන්‍ය අනන්‍යතාව වෙනුවෙන් දැඩි ව පෙනී සිටින ඔවුන් උග්‍ර සංක්‍රමණ විරෝධී පක්ෂයක්. 'රටේ සිටින අනවසර සංක්‍රමණිකයන් පිටුවහල් කළ යුතු ය' යන්නයි Reform UK පක්ෂයේ ස්ථාවරය.

ඔවුන් පුනර්ජනනීය බල ශක්තියට එතරම් අනුකූලතාවක් නොදක්වන අතර බලයට පත් වූ විට බණිජ තෙල් සහ ගෑස් නිෂ්පාදනය ඉහළ දමන බව පවසනවා. වර්තමානයේ ජනතාවට බලශක්තිය වෙනුවෙන් වැඩි වියදමක් දරන්නට සිදු ව ඇත්තේ පුනර්ජනනීය බල ශක්තිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති නිසා බවයි ඔවුන් පෙන්වා දෙන්නේ.

ජනතාවට සහ ව්‍යාපාරවලට බදු සහන ආදිය ලබා දෙන බව මේ පක්ෂයේ තවත් ආකර්ෂණීය පොරොන්දුවක්. මීළඟ මහා මැතිවරණයේදී Reform UK වෙතින් ප්‍රධාන පක්ෂ දෙක වන කම්කරු පක්ෂයට සහ කන්සර්වේටිව් පක්ෂයට දැවැන්ත අභියෝගයක් එල්ලවනු ඇති බවයි දේශපාලන විශ්ලේෂකයන්ගේ අදහස. ඇතැම් විට එයින් පසු නිගෙල් ෆරාජ් බ්‍රිතාන්‍යයේ අගමැති බවට පත්වීමටත් ඉඩක් තිබෙන බවයි පෙනෙන්නේ.

ප්‍රංශ විප්ලවයේ ගිනි පුපුර

මනෝ ප්‍රනාන්දු

1789 ජූලි 14 දින සිදු වූ බැස්ටිලයට පහර දීම ලෝක ඉතිහාසයේ වැදගත් ම දේශපාලන සිදුවීමක් ලෙස සැලකෙනවා. එය ප්‍රංශ විප්ලවයේ ආරම්භය සංකේතවත් කළ අවස්ථාවක් පමණක් නොව ජනතාවගේ බලය රාජාණ්ඩු බලයට එරෙහි ව ප්‍රකාශ වූ සුවිශේෂ මොහොතක් වුණා. අදත් ජූලි 14 දින ප්‍රංශයේ ජාතික දිනය (බැස්ටිලයේ දිනය) සමරන්නේ මේ සිදුවීම සිහිපත් කරමින්.

18 වැනි සියවසේ අගභාගයේ ප්‍රංශය දැඩි ආර්ථික හා සමාජ අර්බුදයකට මුහුණ දුන්නා. එකල 16 වැනි ලුවීගේ පාලනය යටතේ රාජ්‍ය භාණ්ඩාගාරය හිස් ව තිබූ අතර දිගු යුද්ධවල අධික වියදම් සහ බදු ප්‍රතිපත්තියේ අසාධාරණකම් හේතුවෙන් ජනතාව මුහුණ දුන්නේ දැඩි දුෂ්කරතාවලට. විශේෂයෙන් ගොවියන්, කම්කරුවන් සහ නගරවල දුප්පත් ජනතාව ඉහළ බදු බරට යටත් ව සිටියත් වංශාධිපතිවරුන් සහ පූජක පන්තිය විශේෂ වරප්‍රසාද භුක්ති විඳිමින් සිටියා.

මෙවැනි පසුබිමක 1789 මැයි 5 දින රජු ප්‍රංශයේ නියෝජිත සභාව වන එස්ටේට්ස් ජෙනරල් රැස් කළා. එහිදී තුන් වැනි ජනතා පන්තියට අයත් නියෝජිතයන් (ව්‍යාපාරිකයන්, නීතිඥයන් හා කම්කරුවන් ඇතුළු බහුතරය) තමන්ගේ දේශපාලන අයිතිවාසිකම් ඉල්ලා නැගී සිටි අතර ඔවුන් ජාතික සභාව පිහිටුවා ගත්තා. මේ පියවර රාජාණ්ඩුව හා ජනතා නියෝජිතයන් අතර ඇති කළේ ගැටුමක්.

මේ අතර පැරිස් නගරයේ ජනතාව අතර කෝපය හා බිය වැඩිවෙමින් තිබුණා. රජු පැරිස් අවට හමුදා රැස් කරමින් සිටීම නිසා ජාතික සභාව විසුරුවා හැරීමට උත්සාහ කරන බවට සැකයක් මතු වුණා. එමෙන් ම ජනතාව අතර ජනප්‍රිය අමාත්‍යවරයෙකු වූ ජැක් නෙකර් ඉවත් කිරීමෙන් ජනතා විරෝධය තවදුරටත් උත්සන්න වුණා.

මෙවැනි තත්ත්වයක් යටතේ 1789 ජූලි 14 දින පැරිස් වැසියන් ආයුධ සොයා පිටත් ව ගිය අතර ඔවුන්ගේ ඉලක්කය වූයේ බැස්ටිලය නම් වූ බළකොටුව. බැස්ටිලය යනු පැරිසියේ පිහිටි මධ්‍යකාලීන බළකොටුවක්. පසුව රාජ්‍ය බන්ධනාගාරයක් ලෙස එය භාවිත කෙරුණා. රජුට අවශ්‍ය ඕනෑ ම පුද්ගලයෙකු නඩු විභාගයකින් තොර ව එහි සිරගත කළ හැකි ව තිබුණා. එහි රඳවා සිටියේ සුළු සිරකරුවන් පිරිසක්. එහෙත් ජනතාවගේ සිත් තුළ එය රාජාණ්ඩු පීඩනයේ සහ අත්තනෝමතික බලයේ සංකේතයක් බවටයි පත් වුණේ.

1370 අප්‍රේල් 22 දින මේ බළකොටුව ඉදි කිරීම සඳහා ආරම්භක ගඩොල තබන ලද අතර මෙය ඉදි කරන ලද්දේ ඉංග්‍රීසින්ගේ ආක්‍රමණවලින් ප්‍රංශය ආරක්ෂා කිරීමට. වර්ෂ 1577දී මෙහි නැගෙනහිර කොටසේ ආරක්ෂක පද්ධතිය සම්පූර්ණ කෙරුණා. හරස් බාධකයක් යොදා මෙහි ඇතුළත ප්‍රදේශ අසමාන කොටස්වලට බෙදා වෙන් කෙරුණේ 17 වැනි සියවසේදී. ගල්වලින් තැනූ මේ බළකොටුවේ තිබුණේ අඩි 100ක් උස බිත්ති.

ජනතාව බැස්ටිලය වටලා එහි තිබූ කාල තුවක්කු කුඩු සහ ආයුධ ලබා ගැනීමට




උත්සාහ කළ අතර ආරක්ෂකයන් හා ජනතාව අතර ඇති වූ ගැටුම් පැය කිහිපයක් පුරා පැවතුණා. දෙපාර්ශ්වයෙන් ම ජීවිත හානි සිදු වුණා. අවසානයේ බළකොටුවේ අධිපති වූ බර්නාඩ් - රෙනේ ද ලෞනේ තීරණය කළේ යටත්වීමට. එහිදී බළකොටුව ජනතාව අතට පත් වූ අතර එහි අධිපති ඝාතනය කෙරුණා.

බැස්ටිලයේ සිටි සිරකරුවන් ගණන හයක් වුවත් මේ සිදුවීමේ වැදගත්කම වන්නේ සිරකරුවන් නිදහස් කර ගැනීම නොවෙයි. ජනතාව රාජාණ්ඩුවේ බලය නියෝජනය කළ බළකොටුවක් අල්ලා ගැනීම යනු ප්‍රංශ සමාජයේ බලය ජනතාව වෙත මාරුවෙමින් පවතින බව පැහැදිලි සංඥාවක්.

බැස්ටිලයට පහර දීමෙන් පසු ප්‍රංශය පුරා ගොවියන් සහ සාමාන්‍ය ජනතාව අතර විප්ලවීය උද්‍යෝගයක් පැතිර ගියා. බොහෝ ප්‍රදේශවල වංශාධිපතිවරුන්ගේ දේපළවලට පහරදීම් සිදු වුණා. මේ තත්ත්වය හමුවේ ජාතික සභාව පියවර ගත්තේ වංශාධිපති වරප්‍රසාද අහෝසි කිරීමට. ඉන් අනතුරුව 1789 අගෝස්තු මාසයේදී 'මනුෂ්‍යයාගේ සහ පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳ ව' ප්‍රකාශනය සම්මත කෙරුණු අතර 'නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය' යන අදහස් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨ බවට පත් වුණා.

බැස්ටිලයට පහරදීම ප්‍රංශයට පමණක් නොව ලෝකයට ම බලපෑමක් ඇති කළා. එය නූතන ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ අදහස් ලොව පුරා ව්‍යාප්ත වීමට දායක වුණා. යුරෝපයේ බොහෝ රටවල ජනතා ව්‍යාපාරවලට සහ ජාතික නිදහස් අරගලවලට ද එම සිදුවීම් ලබා දුන්නේ ආශ්වාදයක්.

අද බැස්ටිල බළකොටුව තවදුරටත් නොපැවතුණත් එය කඩා බිඳ දැමූ ජනතාවගේ ක්‍රියාව ඉතිහාසයේ නොමැකෙන සලකුණක් ලෙස පවතිනවා. 1789 ජූලි 14 දින පැරිස් වැසියන් සිදු කළ එම ක්‍රියාව රාජාණ්ඩු පීඩනයට එරෙහි ජනතා නැගිටීමක සංකේතයක් වූ අතර ලෝක ඉතිහාසයේ නව යුගයක් ආරම්භ



බැස්ටිලයට පහර දීමෙන් පසු ප්‍රංශය පුරා ගොවියන් සහ සාමාන්‍ය ජනතාව අතර විප්ලවීය උද්‍යෝගයක් පැතිර ගියා. බොහෝ ප්‍රදේශවල වංශාධිපතිවරුන්ගේ දේපළවලට පහරදීම් සිදු වුණා. මේ තත්ත්වය හමුවේ ජාතික සභාව පියවර ගත්තේ වංශාධිපති වරප්‍රසාද අහෝසි කිරීමට. ඉන් අනතුරුව 1789 අගෝස්තු මාසයේදී 'මනුෂ්‍යයාගේ සහ පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳ ව' ප්‍රකාශනය සම්මත කෙරුණු අතර 'නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය' යන අදහස් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨ බවට පත් වුණා.

කළ ගිනි පුපුරක් බවට පත් වුණා. එබැවින් බැස්ටිලයට පහර දීම යනු සරල ව බළකොටුවක් අල්ලා ගැනීමක් නො ව ජනතාව තම අයිතිවාසිකම් වෙනුවෙන් ඉතිහාසයේ වේදිකාවට පිවිසි අමරණීය මොහොතක් ලෙස සලකන්නට පුළුවන්.

19 වැනි සියවසේ සුප්‍රසිද්ධ දාර්ශනිකයා හා ආර්ථික විද්‍යාඥයා වූ කාල් මාක්ස් ප්‍රංශ විප්ලවය සැලකුවේ නූතන ලෝක ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස. මාක්ස්ගේ විග්‍රහයට අනුව 1789 විප්ලවය යනු හුදෙක් රජෙකුට එරෙහි ජනතා කැරැල්ලක් නොව පැරණි වැඩවසම් සමාජ ක්‍රමය බිඳ දමා ධනේශ්වර පන්තිය බලයට ගෙන ආ සමාජ විප්ලවයක්. ඔහු ප්‍රකාශ කළේ ප්‍රංශ විප්ලවයෙන් වැඩවසම් දේපළ සම්බන්ධතා සහ වරප්‍රසාදිත පන්ති පාලනය විනාශ කර දැමූ බව. බැස්ටිලයට පහරදීම එම විශාල සමාජ පරිවර්තනයේ සංකේතාත්මක ආරම්භය ලෙස මාක්ස්වාදී ඉතිහාසඥයන් සලකනවා.

මාක්ස් ප්‍රසිද්ධ ව සඳහන් කළේ, "මිනිසුන් තමන්ගේ ම ඉතිහාසය සාදති. එහෙත් ඔවුන් එය තමන් කැමැති තත්ත්වයන් යටතේ නොව පවතින තත්ත්වයන් යටතේ සාදති" යන්න. පීඩිත පන්තියේ මේ ක්‍රියාව ප්‍රංශය පමණක් නොව ලෝක ඉතිහාසය ම වෙනස් කළා.

සුව විදු පියසේ සියවස්
සම්ප්‍රාප්තිය

බිනූ දිලාරා ගමගේ

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පුහුණු ආයතනයක් ලෙස සහ සෞඛ්‍ය අංශයේ නිවාරණ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතනයක් ලෙස ජාතික සෞඛ්‍ය විද්‍යායතනය (**National Institute of Health Sciences**) වර්තමානයේ ඉටු කරන්නේ ප්‍රමුඛ කාර්යභාරයක්. කළුතර ප්‍රදේශයේ සෞඛ්‍ය ඒකකයක් (**Health Unit**) වශයෙන් 1926 ඇරඹී මේ ආයතනයට 2026 ජූලි 01 දිනට වසර 100ක් සැපිරෙනවා. මෙවර කවරයේ කතාව සැකසෙන්නේ ඒ නිමිත්තෙන්.

'එක් රෝග මූලයක් නිසා රෝගයක් ඇති වෙනවා' යැයි පැවසීමට බැහැ. එනම් රෝගයක් යනු සාධක සමූහයක එකතු වීමක ප්‍රතිඵලයක්. ඒ සඳහා විවිධ හේතු බලපාන්නට පුළුවන්. පාරිසරික හා දේශගුණික සාධක, පවත්වාගෙන යන ආහාර රටාව, ව්‍යායාමවල නිරත වීම, ජානමය සාධක, වෛරස් බැක්ටීරියාවල බලපෑම, සනීපාරක්ෂක පිළිවෙත් සහ මානසික ආතතිය යනාදිය ඉන් කිහිපයක්. රෝගය ඇති වීමට පෙර මේ සාධක පාලනයට ක්‍රියා කරන්නේ නම් රෝගය ඇති නොවෙන්නට වගබලා ගත හැකියි. එය රෝග නිවාරණය ලෙස සලකනවා. රෝගයකට ගොදුරු වීමෙන් පසුව එය සුව කර ගන්නවාට වඩා එය වැලඳෙන්නට ඉඩ නොදී වළක්වා ගැනීම වැදගත්. ජනතාවට සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම මෙන් ම වැසිකිළි භාවිතයේදී, ඇඳුම් පැලඳුම් පරිහරණයේදී, ආහාර පිසීමේදී, ආහාර පාන ලබා ගැනීමේදී සෞඛ්‍ය සම්පන්න පුරුදු අනුගමනයට ජනතාව උනන්දු කරවීම යනාදිය රෝග නිවාරණයේදී ඉතා වැදගත්. ප්‍රජා සෞඛ්‍ය නිවාරණ අංශය ක්‍රියාත්මක වන්නේ සෞඛ්‍ය ප්‍රවර්ධනය ඔස්සේ මේ වෙනුවෙන් ජනතාවට මඟ පෙන්වීමට.

මේ කාර්යයට උරදෙන සෞඛ්‍ය සේවකයන් බලගැන්වීම හා සේවා සැපයීමෙන් මේ ආයතනය විශාල මෙහෙයක් ඉටු කරනවා. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය (National Institute of Health Sciences) යනු 'නව සහස්‍රකයේදී අග්නිදිග ආසියාවේ විශිෂ්ටතම ප්‍රජා සෞඛ්‍ය පුහුණු හා සංවර්ධන කේන්ද්‍රය බවට පත් වීම' (To be the center of excellence in the training and development of public health staff in the South East Region) අරමුණු කරගෙන 'දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට හා ප්‍රමිතීන්ට උචිත හා අනුකූල වන පරිදි සහස්‍රක සංවර්ධන අරමුණු කරා ළඟා වීමට උර දෙන නිපුණතා පූර්ණ සෞඛ්‍ය ප්‍රජාවක්



පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ' (To train and develop a competent and interdependent public health workforce capable of delivering services that achieve national health goals) ආයතනික මෙහෙවරකින් (Mission) ක්‍රියා කරන ආයතනයක්. ප්‍රාථමික සෞඛ්‍ය සේවා (PHC) කණ්ඩායම් සඳහා සෞඛ්‍ය මානව බලය සංවර්ධනය සහ පුහුණු සම්බන්ධීකරණය, සෞඛ්‍ය සේවා සහ මානව සම්පත් කළමනාකරණ පර්යේෂණ ඉදිරියට ගෙන යාම හා ජාතික මට්ටමේ පුහුණුව සහ තෝරාගත් ජාත්‍යන්තර වැඩසටහන් විශේෂයෙන් සාක් (SAARC) රටවල් සඳහා ලබා දීම එහි මූලික අභිමතාර්ථ වනවා.

මෙරට ප්‍රජා සෞඛ්‍ය සේවයේ අවශ්‍යතාවට ප්‍රමාණවත් වන ගුණාත්මක බවින් ඉහළ ශ්‍රම බලකායක් සැපයීමයි ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලික කාර්යභාරය. ඒ සඳහා රෝහල් සාත්තු සේවකයාගේ සිට විශේෂඥ වෛද්‍ය පුහුණුවේ ඇතැම් මොඩියුල ආවරණය කිරීම් දක්වා ම පුළුල් වර්ගීකරණයක් සහිත පුහුණු පාඨමාලා විශාල සංඛ්‍යාවක් සැපයෙනවා. රෝග නිවාරණය හා සුව කිරීමට (Preventive & Curative) අදාළ ව කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශය අවට සිටින 300,ට අධික ජනතාවගේ මූලික සෞඛ්‍ය අවශ්‍යතා සියල්ල සම්පූර්ණ කිරීමට මුල් වන්නේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය. මෙහිදී කළුතර, පයාගල හා බේරුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලින් රෝග නිවාරණය සඳහා මැදිහත්වෙනවා. ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට අනුබද්ධ අලුත්ගම සහ දර්ගා නගරයේ ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකක (Primary Health Care Units - PMCU) 06 සහ ආරෝග්‍යා මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර අංශයේ සේවා සැපයෙනවා. මේ නිසා ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ප්‍රතිකාර සේවා ලබා දෙනවා සේ ම රෝග සඳහා හේතු වන සෙසු සාධක පිළිබඳ අවධානය යොමු කරන සෞඛ්‍ය නිවාරණ ආවරණය කරන තොරතුරු ජාලයක් ද හුවමාරු වෙනවා.



1979 වසරේදී 'ජාතික සෞඛ්‍ය විද්‍යායතනය' බවට පත් වීමෙන් පසුව අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු යටතෙ පුහුණු (Trainings), ක්ෂේත්‍ර සේවා (Field Services), වෛද්‍ය සේවා ආයතන (Medical Care Institutions) යන දෙපාර්තමේන්තු වශයෙන් විෂය ක්ෂේත්‍ර වර්ධනය වුණා. එකල වෛද්‍ය සේවා ආයතන දෙපාර්තමේන්තුව යටතේ අලුත්ගම රෝහල, දර්ගා නගරයේ ප්‍රාදේශීය රෝහල, බේරුවල දිස්ත්‍රික් රෝහල සහ කළුතර නාගොඩ රෝහලත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට අයත් වුණා. පුහුණු දෙපාර්තමේන්තුව යටතේ ආයතනයේ හා ඊට අනුබද්ධ සියලු පුහුණු පාඨමාලාවලට අදාළ පරිපාලන මෙයෙවීම් භාර වූ අතර ක්ෂේත්‍ර සේවා දෙපාර්තමේන්තුවට ඒ වනවිට ආයතනික මට්ටමින් පැවරී තිබූ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල පරිපාලනය භාර වුණා. පසුකාලීන ව වෛද්‍ය සේවා ආයතන යටතේ තිබුණු ප්‍රධාන රෝහල් ආයතනයෙන් වෙන් වීමත් ඉතිරි වූ අනෙකුත් කුඩා රෝහල් සියල්ල ක්ෂේත්‍ර සේවා දෙපාර්තමේන්තුව යටතට ගැනීමටත් පියවර ගැනුණා. මේ දෙපාර්තමේන්තු අද වනවිට ප්‍රජා සෞඛ්‍ය පුහුණු දෙපාර්තමේන්තුව (Department of Public Health Training), කළමනාකරණ පුහුණු දෙපාර්තමේන්තුව (Department of ManagementTraining), පර්යේෂණ හා ඇගයීම් දෙපාර්තමේන්තුව (Department of Research & Evalution), අධ්‍යාපන විද්‍යා පිළිබඳ අධ්‍යයන දෙපාර්තමේන්තුව (Department of Educational Sciences), ජෛව වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන දෙපාර්තමේන්තුව (Department of Biomedical Sciences) වශයෙන් ක්‍රියාත්මක වෙනවා. අධ්‍යයන ඒකක ක්‍රමයක් (Unඋts) යටතේ ක්‍රියාත්මක වූ සෞඛ්‍ය පාසල් වර්තමානය වනවිට ආයතනය හා අනුබද්ධ ව ක්‍රියාත්මක වන්නේ වෛද්‍ය රසායනාගාර කාර්මික පුහුණු පාසල (Medical laboratoryTechnician Training School), ෆාමසි පුහුණු පාසල (Phamacy Training School), මහජන සෞඛ්‍ය රසායනාගාර පුහුණු පාසල (Public Health Laboratory Training School), මහජන සෞඛ්‍ය පරීක්ෂක පුහුණු පාසල (Public Health Inspector Training School), සූතිකා පුහුණු පාසල (MidwiferyTraining School) යනුවෙන්.

ප්‍රධාන වශයෙන් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය පුහුණු පාඨමාලාවක් හඳුන්වා දෙන්නේ ක්ෂේත්‍රයට පවතින පුහුණු අවශ්‍යතාව මුල්කරගෙන. ඒ සඳහා ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පර්යේෂණ කමිටුව (Ethics Review Committee - ERC) විසින් සිදු කරන ලද පර්යේෂණ ඔස්සේ ලබාගත් දත්ත මත විද්‍යාත්මක හා සායනික පදනමක් ගොඩ නගා ගැනීමයි පළමු ව සිදු වන්නේ. ඒ අනුව හඳුනා ගන්නා පුහුණු ක්ෂේත්‍රයකට අදාළ ව පුහුණු වැඩසටහනක් සකස් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකයෙන් අවසර ලබා ගත යුතුයි. එම අනුමැතිය ලැබීමෙන් පසු ව අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මනා න්‍යායික හා ප්‍රායෝගික දැනුමක් සහිත ආචාර්ය මණ්ඩලයකින් පුළුල් ඉගෙනුම් අධ්‍යයනයක් සිදු කර අදාළ පුහුණු පාඨමාලාව සඳහා විෂය මාලාවක් සකස් කෙරෙනවා. එයට ඇතුළත් කෙරෙන්නේ ඊට අදාළ ව කාල රාමුව, දැනුම කුසලතා ඇගයීම් ක්‍රමවේදයක් යනාදී කාරණා. ඉන්පසුව නියමු වැඩසටහන් ඇගයීම් සිදුකර ලබා ගත් ප්‍රතිඵල මත දිස්ත්‍රික් මට්ටමින් ඒ ඒ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාල දැනුවත් කිරීමෙන් අවශ්‍ය බඳවා ගැනීම් මෙහෙයවීමත් සිදු කරනවා. මේ සියලු කටයුතු නිසි අධීක්ෂණයකට යටත්වයි සිදු වන්නේ. වර්තමානයේදී ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ සියල්ල මෙහෙයවීම සිදු වන්නේ අධ්‍යක්ෂ වෛද්‍ය කේ. නත්තකුමාරන්ගේ නායකත්වයෙන්. එසේ ම ගත වූ වසර සියයක කාලයේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ දියුණුවට මඟ සැලසූ අධ්‍යක්ෂවරු ගණනාවක් සිටිනවා. වෛද්‍ය එස්. එෆ්. වෙල්ලප්පාගේ (1926-1928) සිට වත්මන් අධ්‍යක්ෂ වෛද්‍ය කේ. නත්තකුමාරන් (2025 සිට) දක්වා අධ්‍යක්ෂවරු 16 දෙනෙකු ඊට අයත්.

විශේෂයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්මාණය වන්නටත් ප්‍රථමයෙන් බිහි වූ ආයතනයක් විදිහට ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලික නිරෝධායන කටයුතු මෙහෙයවීම සඳහා ආයතනයට ම අනන්‍ය වූ මාර්ගෝපදේශ මාලාවක් තිබෙනවා. අද වනවිට ලෝක සෞඛ්‍ය සංවිධානය කාලීන වශයෙන් නිර්දේශ කරන මාර්ගෝපදේශ ද අනුගමනය කිරීමටයි ඔවුන් වගබලා ගන්නේ. ඒ අනුව අලුතින් ප්‍රජා සෞඛ්‍යය ගුණාත්මක කිරීම වෙනුවෙන් පිළිගත් ආයතන ගෙනෙන මාර්ගෝපදේශ අනුව නව පුහුණු පාඨමාලා ක්ෂේත්‍රයට හඳුන්වා දීමටත් පවතින පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීමටත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය පියවර ගන්නා අතර ප්‍රජා සෞඛ්‍ය සේවාව ආරම්භ කළ මූලික පදනම සම්පූර්ණයෙන් වෙනස් කරමින් අනෙකුත් නිර්දේශ පිළිපැදීමක් ඔවුන් සිදු කරන්නේ නැහැ.

මූලික පුහුණු වැඩසටහන් වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ඩිප්ලෝමා පාඨමාලාව, පවුල් සෞඛ්‍ය නිලධාරි ක්ෂේත්‍ර (ii කොටස) පුහුණුව, වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන, ඖෂධවේදියෙකු ලෙස ප්‍රවීණතා සහතිකය, ක්ෂය රෝග සහකාර සහතික පත්‍ර පාඨමාලාව එහි තිබෙනවා. පශ්චාත් මූලික පුහුණු වැඩසටහන් වශයෙන් මහජන සෞඛ්‍ය හෙද ඩිප්ලෝමා පාඨමාලාව, හෙද උපදේශන (මහජන සෞඛ්‍ය) ඩිප්ලෝමා පාඨමාලාව ලබා දෙන අතර ප්‍රජා සෞඛ්‍ය සේවයේ නියුක්ත ව නියමිත පූර්ණ කාල සීමාවක් සම්පූර්ණ කළ වෘත්තිකයන් සඳහා ද මාසයක කාලයක් සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරනවා. ඒ අයුරින් පවතින සේවාස්ථ පුහුණු වැඩසටහන් වශයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි MO (MCH)/ MO (PH) (ප්‍රජා සෞඛ්‍ය කළමනාකාරණය) පුහුණුව, පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් (AMOH) සඳහා පූර්ව ස්ථානගත කිරීමේ පුහුණුව, මහජන සෞඛ්‍ය පරීක්ෂක අධීක්ෂක නිලධාරි පුහුණුව, පවුල් සෞඛ්‍ය නිලධාරි අධීක්ෂක නිලධාරි පුහුණුව, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන, ගුරු පුහුණු වැඩසටහන, සෞඛ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන, අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා වැඩසටහන, ජාත්‍යන්තර රෝග වර්ගීකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව, වෛද්‍ය වාර්තා හා සෞඛ්‍ය තොරතුරු කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව, පශ්චාත් මූලික හෙදියන් (වාට්ටු සහ උපදේශක) සඳහා ප්‍රජා සෞඛ්‍ය පුහුණුව, PHNS සහ RSPHNO අධීක්ෂක නිලධාරි පුහුණුව, රජයේ රෝහල්වලට අනුයුක්ත ජ්‍යේෂ්ඨ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා කළමනාකාරණ පුහුණුව, මධ්‍යම මට්ටමේ කළමනාකාරවරුන් සඳහා ප්‍රජා සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව, මධ්‍යම මට්ටමේ කළමනාකාරවරුන් සඳහා මානව සම්පත් කළමනාකරණ පුහුණුව, ප්‍රධාන ඖෂධවේදීන් සඳහා කළමනාකරණ පුහුණු වැඩසටහන, රජයේ සෞඛ්‍යවේදීන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන, ඩිස්පෙන්සර්වරුන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන, රජයේ වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් සඳහා රසායනාගාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ සේවාස්ථ පුහුණු වැඩසටහන, රජයේ වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන්ගේ කුසලතා ශක්තිමත් කිරීම සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන, වතු වෛද්‍ය සහායකයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.

පශ්චාත් උපාධි මට්ටමේ පුහුණු අධ්‍යයන වන්නේ ප්‍රජා වෛද්‍ය විද්‍යාව/ ප්‍රජා දන්ත විද්‍යාව පිළිබඳ MSc උපාධිය, MD (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) ii කොටස පුහුණු වැඩසටහන, ජෙව වෛද්‍ය තොරතුරු විද්‍යාව පිළිබඳ MSc මහජන සෞඛ්‍ය පුහුණුව, ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් සඳහා ප්‍රජා ළමා රෝග පිළිබඳ පුහුණුව. එසේ ම මහජන සෞඛ්‍ය



පළමු අධ්‍යක්ෂ
වෛද්‍ය එස්. එෆ්. වෙල්ලප්පා (1926-1928)



වත්මන් අධ්‍යක්ෂ
වෛද්‍ය කේ. නත්තකුමාරන් (2025 සිට)

ක්ෂේත්‍රය පිළිබඳ හදාරන විදේශීය සිසුන් සඳහාත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විශේෂ පාඨමාලා කිහිපයක් පවත්වනවා. එවැනි ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් වශයෙන් මාලදිවයින PHC සිසුන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඩිප්ලෝමාව (සායනික), මාලදිවයින PHC සිසුන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා පිළිබඳ උසස් සහතික පත් පාඨමාලාව (සායනික), ජාත්‍යන්තර රෝග වර්ගීකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව, වෛද්‍ය වාර්තා සහ සෞඛ්‍ය තොරතුරු කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන, මධ්‍යම මට්ටමේ සෞඛ්‍ය නිලධාරීන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන අතර ජාත්‍යන්තර සහභාගිවන්නන් සඳහා ප්‍රජා සෞඛ්‍ය අධ්‍යයනය වැනි පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව සලසා දී තිබෙනවා. මීට අමතර ව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (Training of Trainers - TOT) සංවිධානය දක්නට පුළුවන්. එනම් ආධුනික සෞඛ්‍ය නිලධාරීන් පුහුණු කරවන ඒ ඒ සෞඛ්‍ය ආයතනවල සෞඛ්‍ය පුහුණුකරුවන් පුහුණු කරවීමයි මෙහිදී සිදු වන්නේ. සෑම විට ම ප්‍රජා සෞඛ්‍යයට පිවිසෙන හෝ නියමිත පුහුණු වාර අවශ්‍ය හෝ සියලු ආධුනික සෞඛ්‍ය නිලධාරි පුහුණු කිරීම ප්‍රායෝගික ව සිදු කළ හැකි කාරණාවක් වන්නේ නැහැ. ඒ වෙනුවට අදාළ සෞඛ්‍ය ආයතනවල පුහුණුකරුවන්ට (Training Staff) අවශ්‍ය මගපෙන්වීම් හා පුහුණු ලබා දීමෙන් ඔවුන් මගින් නැවතත් එම සෞඛ්‍ය ආයතනවල පුහුණු බලගැන්වීමටත් හැකියාව ලැබෙනවා. මේ සියලු අධ්‍යයන පාඨමාලා ක්‍රියාත්මක වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකය (Education, Training & Research Unit of Ministry of Health) ලබා දී තිබෙන මාර්ගෝපදේශවලට යටත් ව.

මූලික පුහුණු වැඩසටහන් සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ වසරක කාලයක්. එහිදී පවුල් සෞඛ්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, හෙදියන්, මහජන සෞඛ්‍ය රසායනාගාර තාක්ෂණවේදීන්, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් පුහුණු කිරීම මූලික වශයෙන් සිදු වන්නේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයෙන්. ඊට අමතර ව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවුල් සෞඛ්‍ය නිලධාරි ආදී තෝරාගත් පුහුණු පාඨමාලා තවත් පුහුණු මධ්‍යස්ථාන පහක සිදු කෙරෙන අතර පාඨමාලා සියල්ලෙහි එක හා සමාන ගුණාත්මකභාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා අධීක්ෂණය ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලිකත්වයෙන් සිදු වෙනවා. අධීක්ෂක නිලධාරීන් සඳහා ලබා දෙන පුහුණුවීම් සිදු කෙරෙන්නේ මාස තුනක පාඨමාලා කාල සීමාවකට යටත් ව. පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය (PGIM) ලබා දෙන පශ්චාත් උපාධි සඳහා මාසයක, මාස තුනක යනාදී වශයෙන් වූ කාල සීමාවට අදාළ පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා ජාතික සෞඛ්‍ය විද්‍යායතනය හා සම්බන්ධ වෙනවා. එමෙන් ම පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ මහජන සෞඛ්‍ය නිවාරණ විෂය ඒකකය ආවරණය සිදු

විශේෂයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්මාණය වන්නටත් ප්‍රථමයෙන් බිහි වූ ආයතනයක් විදිහට ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලික නිරෝධායන කටයුතු මෙහෙයවීම සඳහා ආයතනයට ම අනන්‍ය වූ මාර්ගෝපදේශ මාලාවක් තිබෙනවා. අද වනවිට ලෝක සෞඛ්‍ය සංවිධානය කාලීන වශයෙන් නිර්දේශ කරන මාර්ගෝපදේශ ද අනුගමනය කිරීමටයි ඔවුන් වගබලා ගන්නේ.

කරන්නේ ද ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යයන ආචාර්ය මණ්ඩලය. වෛද්‍ය වාර්තා ලේඛනගත කිරීමේ නිලධාරීන් (Medical Records Officers) සඳහා අත්‍යවශ්‍ය වන රෝග වර්ගීකරණය කිරීමේ ජාත්‍යන්තර කේතකරණය (International Classification of Disease) පිළිබඳ දැනුම හා පුහුණුව ලබා ගැනීමට ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමැතිය දී ඇති ජාත්‍යන්තර ආයතන කිහිපය අතරින් එකක් වන්නේ ද ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය. මීට අමතර ව පුහුණු අවශ්‍යතා හඳුනාගෙන සිදු කරන කෙටි පුහුණු වැඩසටහන් ද තිබෙනවා. මේ සියලු මහජන සෞඛ්‍ය පුහුණු පාඨමාලා යාවත්කාලීන වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ, දිශානති, ප්‍රමිතීන් ආදී ජාත්‍යන්තර මට්ටමේ ඉගෙනුම් මෙවලම් හා මාර්ගෝපදේශ පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒවාට අනුගත ව වැඩිදියුණු කරමින් පවත්වාගෙන යාමටයි ඔවුන් පියවර ගන්නේ. ජාතික මට්ටමින් පවා මහජන සෞඛ්‍ය ගුණාත්මක කිරීමට නව අදහස් ඉදිරිපත් වන අවස්ථාවලදී ඒවා පිළිබඳ ව සැලකිලිමත් වෙමින්, නව විෂය හා ප්‍රායෝගික දැනුම පාඨමාලා සඳහා එකතු කිරීමත් මෙහිදී සිදු වන්නක්. සිද්ධාන්ත පුහුණු කිරීම කෙරෙහි පමණක් මේ පාඨමාලාවලදී අවධානය යොමු කරන්නේ නැහැ.

තොරතුරු ලබා දීම වර්තමාන සමාජයේ බහුල ව පවතින්නක්. ඒ සඳහා පමණක් පාඨමාලා අන්තර්ගතයක් සකස් කිරීම ඵලදායී නැහැ. ඒ අනුව වර්තමානයේදී ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලික අවධානය යොමු වන්නේ දැනුමින් සන්නද්ධ වන අතර ම සෞඛ්‍ය පුහුණුව සඳහා වඩාත් වැදගත් වන ආකල්පය, මෘදු කුසලතා, සන්නිවේදන කුසලතා, මානුෂීය ගුණාංග සංවර්ධනයටත් චිත්තවේග කළමනාකරණයට හුරු කරවීමටත් වෘත්තීය පෞරුෂය ගොඩ නැගීමටත්. සෑම විට ම සෞඛ්‍ය නිලධාරියෙකුට තමන්ගේ වෘත්තිය ඉටු කිරීමට සිදු වන්නේ තවත් කණ්ඩායමක් සමඟ. එතැනදී සාමූහිකත්වයට මුල් තැනක් ලබා දෙනවා. එයට සෞඛ්‍ය පුහුණු නිලධාරියා බලගන්වන ආකාරයේ පාඨමාලා ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා උනන්දු කිරීමේ වැදගත්කමත් පුහුණු කාර්ය මණ්ඩලය හඳුනාගෙන තිබෙනවා. වෙනත් ජාතික මට්ටමේ ප්‍රජා සෞඛ්‍ය ආයතනවල නියමිත ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ නිර්දේශවලට යටත් ව මෙවැනි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අවස්ථාවලදී අදාළ විෂය සම්බන්ධ විශේෂ වූ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ආචාර්යවරයෙකු හෝ කිහිපදෙනෙකු හෝ එහි පුහුණුකරුවන් වශයෙන් සහභාගි වෙනවා. ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ආචාර්ය මණ්ඩලයත් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පුහුණු සහ වැඩමුළු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ තෝරා ගැනීම් ඔස්සේ සහභාගි වන්නේ නව දැනුමින් හා කාලීන ව කුසලතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට. විධිමත් කාලරාමුවකට ක්‍රියාත්මක නොවුණත් පීඨ වශයෙන් පවත්වන ආචාර්ය මණ්ඩලය සඳහා වෙන් වූ දහවල් විවේක කාලයේදී

පවත්වන දැනුම් හා පුහුණු දිශානති දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට සුවිශේෂ වූවක්. ජාත්‍යන්තර මට්ටමින් ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ ව අධ්‍යයන පුහුණු කණ්ඩායම් ජාතික සෞඛ්‍ය විදයායතනය සම්බන්ධ වන්නේ ලංකාවේ ප්‍රජා සෞඛ්‍ය සේවා ක්‍රියාවලිය පිළිබඳ ව දැනුම හා අත්දැකීම් බෙදා ගැනීමට.


ප්‍රජා සෞඛ්‍ය පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය පර්යේෂණ ක්‍රියාත්මක කිරීමත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලික කාර්යයක්. ආයතනික සියලු තීරණ හා වෙනස්කම් විද්‍යාත්මක පදනමක් සහිත ව මෙහෙයවීමට එය ඉතා වැදගත්. ආයතනයෙන් ලබා දෙන සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීමට, නව සේවා අවස්ථා හඳුනා ගැනීමට, පාඨමාලා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට, පාඨමාලා සාර්ථකත්වය මැනීමට පර්යේෂණ අවශ්‍ය වෙනවා. මෙහිදී වෙනත් රටවල් සමඟ එක්ව සිදු කරන පර්යේෂණ (collaborative research) ද තිබෙනවා. මේ සියලු කාර්ය ක්‍රියාත්මක කරන්නේ ආයතනයේ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ (Department of Research & Evaluation Unit) මැදිහත්වීමෙන් සහ අධීක්ෂණ සහිත ව. එසේ ම පුහුණු පාඨමාලා ආරම්භ කිරීමේදී එම පාඨමාලා කොතරම්දුරට ආචාරධර්මීය පදනමක් මත සිදු වන්නේ ද යන්න සහතික කරන 'Ethical Clearance' පර්යේෂණය සඳහා විධිවිධාන සලසන්නේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව (Ethics Review Committee). මේ සහතිකය ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ආරම්භ කරන පාඨමාලා සඳහා මෙන් ම වෙනත් ප්‍රජා සෞඛ්‍ය ආයතනවල පුහුණු පාඨමාලා සංවිධානය කිරීමේදී පවා ලබා ගැනීම අනිවාර්ය වෙනවා.

මේ අනුව මෙවැනි සුවිශේෂතා සනිටුහන් කරන ජාතික සෞඛ්‍ය විද්‍යායතනය නව සියවසකට පා තබන මොහොතේ ඔවුන් අපේක්ෂා කරනු ඇත්තේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගෝලීය ප්‍රවණතා අනුව යමින් සිය දැක්ම, මෙහෙවර හා කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීමට.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්විජිතයක් විදිහට පාලනය වූ කාලයේ සිට ම වතු ජනාවාසවල සහ ඒ ආශ්‍රිත ව ජීවත් වූ ජනතාවට පණු රෝග වැනි සනීපාරක්ෂක පහසුකම් හා පිරිසිදුකම අඩු නිසා ඇති වන විවිධ සෞඛ්‍ය ගැටලුවලට වරින් වර මුහුණ දෙන්නට සිදු වුණා. එම නිසා මේ තත්ත්වය පාලනය කිරීමට 1913 වසරේදී පමණ ඇමරිකාවේ 'රොකෆෙලර්' රාජ්‍ය නොවන සංවිධානය ඉදිරිපත් වී අවශ්‍ය ඖෂධ සැපයීම් සඳහා උපකාර කළා. එහෙත් වසර ගණනාවක් තිස්සේ මේ සඳහා ප්‍රතිකාර කළත් ඔවුන්ට රෝග තත්ත්ව සහමුලින් ම නිරෝධායනය කිරීමට හැකි වුණේ නැහැ. මේ පිළිබඳ ඇති වූ කුතුහලයත් සමඟ වැඩිදුර සොයා බැලීම් සිදු කළා. අවසානයේදී අනාවරණය වූණේ රෝගය සඳහා නිසි ඖෂධ ලබා දුන්නත් රෝගය වර්ධනය වීමට බලපෑ අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් නිසි පරිදි නොමැතිකම, පිරිසිදු පානීය ජලය නොමැති වීම වැනි කාරණා මුල් කරගෙන සම්පූර්ණයෙන් රෝගය නිවාරණය කළ නොහැකි බව. ඒ අනුව එතෙක් ඔවුන්ගේ අරමුණ වූ ඖෂධ ලබා දී රෝගය සුව කිරීමට වඩා එහා ගිය නිවාරණ කාර්යයක අවශ්‍යතාව හඳුනා ගැනීමට මෙය හේතුවක් වුණා.

රෝග නිවාරණ කාර්යයේදී තවදුරටත් පණු රෝග වැනි තත්ත්ව පමණක් නොව ළමා රෝග, වයස්ගත වීමත් සමඟ ඇතිවන රෝග තත්ත්ව, සනීපාරක්ෂක සුරක්ෂිතභාවය, වසංගත රෝග පාලනය යනාදී බොහෝ අංශ පිළිබඳ අධ්‍යනය යොමු කළා. එහිදී මේ සංකල්පය ලාංකේය සංස්කෘතිය හඳුන්වා දීමට ඉදිරිපත් වූ වෛද්‍ය විලියම් ජාකොබ් ඇමරිකානු සමාජයේ රෝග නිවාරණ කටයුතු සඳහා සහභාගි වීමෙන් ලත් අත්දැකීම් සහ ඔහු විසින් මේ පිළිබඳ හැදෑරීමෙන් එකතු කර ගන්නා ලද දැනුම උපයෝගි කර ගත්තා. වෛද්‍ය ජාකොබ්ට සහ වෛද්‍ය වෙල්ලප්පාට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් විෂය මූලික දැනුමක් තිබුණා. වෙනස් ව සිතා කටයුතු කිරීමට ශක්තිමත් තාර්කික බුද්ධියක් සහ පුළුල් දැක්මක් තිබුණා.

ඒ අනුව කළුතර ප්‍රදේශයේ සෞඛ්‍ය ඒකකයක් පිහිටුවා රෝග නිවාරණය සඳහා නිසි මාර්ගෝපදේශයක් ජනතාව අතරට ගෙන යාමට රොකෆෙලර් සංවිධානයේ සාමාජිකයෙක් වූ වෛද්‍ය විලියම් ජාකොබ් මෙරටට පැමිණියා. ඔහුට සහාය දීමට ඉදිරිපත් වුණේ වෛද්‍ය වෙල්ලප්පා. එලෙසින් ලංකාවේ පළමු ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ ආරම්භය මොවුන් දෙපළගේ පුරෝගාමීත්වයෙන් සිදු වෙනවා. ඔවුන් මේ සඳහා කළුතර ප්‍රදේශය ම තෝරා ගත්තේ විශේෂයෙන් ඊට කළුතර ප්‍රාදේශීය සභාවෙන් යහපත් සහයෝගයක් ලැබීම, මූල්‍ය අනුග්‍රහය ලබා දීමට ධානපතියන් ඉදිරිපත් වීම, පරිපාලන නගරය වන කොළඹ නගරයට ආසන්න කළුතර දිස්ත්‍රික්කයේ ලංකාවේ සියලු දේශගුණ තත්ත්ව හා ජනවර්ග ආදී බොහෝ සාධක නියෝජනය කරන පරිසරයක් පැවතීම යන කාරණා මත. මේ සියලු ම කරුණු සලකා බලා 1926 ජූලි 01 දින කළුතර ප්‍රදේශයෙන් මේ සෞඛ්‍ය නිවාරණ සංකල්පය ස්ථාපනය කිරීම ඇරඹුණා. ඒ සඳහා මුල්කාලීන ව ස්ථිර ගොඩනැගිල්ලක් තිබුණේ නැහැ. කළුතර බැද්ද ප්‍රදේශයේ කුලී පදනම යටතේ මිල දී ගත් නිවසක 'සෞඛ්‍ය ඒකකය'



ඉහළ ප්‍රමිතිකරණයකින් පුළුල් සේවාවක්

පිහිටුවීමට පියවර ගත්තා. පසුව කළුතර තොටමුල්ල ප්‍රදේශය දක්වා ම එහි සේවාවන් ව්‍යාප්ත කිරීමට හැකි වුණා.

මේ සෞඛ්‍ය නිවාරණ කටයුතු ඉතා කෙටි කාලයක් තුළ වඩාත් කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගත්තා. මාතෘ මරණ, ළදරු මරණ, පාචනය, පණු රෝග, අතීසාරය වැනි රෝග වාර්තා වීම් බොහෝදුරට අඩු වුණා. මේ ආකාරයෙන් ඉතා කෙටි කාලයකදී දිනාගත් සාර්ථකත්වය නිසා ම රෝග නිවාරණ සඳහා වූ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල (MOH) තවදුරටත් දිවයින පුරා ව්‍යාප්ත කෙරුණා. මෙලෙස පුළුල් කළ සේවාව ජනතාවට ලබා දීම සඳහා පුහුණු සෞඛ්‍ය නිලධාරීන් අවශ්‍ය වුණා. ඒ සඳහා සේවාව ලබා දීමට අමතර ව සේවාව සඳහා අලුතින් පිරිස් බඳවාගෙන අවශ්‍ය පුහුණුව කළා. ඒ අනුව 1928 වසර වන විට අවශ්‍ය පුහුණුවීම් සඳහා විදේශ රටවල පුහුණු පාඨමාලා සඳහා ආධුනිකයන් යොමු කිරීමටත් එයින් පුහුණුව ලත් පිරිස් මෙරටට ගෙන්වාගෙන ඔවුන්ගෙන් මෙරට මහජන සෞඛ්‍ය සේවා පුහුණුව ආරම්භ කළා. මහජන සෞඛ්‍ය හෙද නිලධාරී පුහුණු පාඨමාලා, පවුල් සෞඛ්‍ය නිලධාරී පුහුණු පාඨමාලා ඒ අයුරින් ආරම්භ කළ ඒවා. 1936 වසරේදී මැලේරියා වසංගතයට මුහුණ දීමට සිදු වූ අවස්ථාවේදී විශාල වශයෙන් මතු වුණේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ (MOH) අවශ්‍යතාව. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහජන සෞඛ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේ විධිමත් පුහුණුවක් ආරම්භ කිරීමට වෛද්‍ය වෙල්ලප්පා මූලිකත්වය ගත්තා. ඒ අනුව සෞඛ්‍ය නිලධාරීන් ඇතුළු මහජන සෞඛ්‍ය අංශයේ සේවාවන් සඳහා අවශ්‍ය පුහුණු වීම් පටිපාටිය සකස් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශන කෘතියක් පවා ඔහු ප්‍රකාශයට පත් කෙරුණා.

පසුව 1945 වසරේදී පමණ කොළඹ CMC ආයතනය මූලික කරගෙන පවත්වාගෙන යන ලද මහජන සෞඛ්‍ය නිලධාරී (PHI) පුහුණුව සඳහා වඩාත් සුදුසු පුහුණු ආයතනය බවට කළුතර සෞඛ්‍ය ඒකකය තෝරා ගැනුණා. මෙලෙසින් පුහුණු පාඨමාලා සංඛ්‍යාව



වෛද්‍ය
පුෂ්පිකා චන්ද්‍රසේකර
ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය

ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ ඊට සමගාමී ව අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ප්‍රමාණවත් වුණේ නැහැ. මේ කාලයේදී ලෝක සෞඛ්‍ය ආයතනයෙන්, ඕස්ට්‍රේලියානු රජයෙන් මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ අරමුණින් අරමුදල් ගලා ආවා. එහි ප්‍රතිඵලයක් විදිහටයි 1966 වසරේදී 'ස්වස්ථායතනය' (Institute Of Hygiene) නමින් වර්තමානයේ 'ජාතික සෞඛ්‍ය විද්‍යායතනය' පිහිටා තිබෙන භූමියට පළමු පියවර තැබුණේ. මුල්කාලීන ව මෙහි සියලු අධ්‍යයන හා පුහුණු කටයුතු සඳහා පහසුකම් සැපයුණේ වර්තමානයේ හඳුන්වන 'පරිපාලන ගොඩනැගිල්ල' තුළ. මීට අමතර ව අධ්‍යයන කටයුතුවලට පැමිණෙන සිසුන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට නේවාසිකාගාරයක් තිබුණා.

1978 පමණ වනවිට 'අල්මාටා' ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ සංකල්පය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩි අවධානයක් යොමු වීමෙන් ඔවුන් ලෝකයට ගෙන ගිය අදහස වුණේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවය සෑම පුද්ගලයෙකුට ම සමාන ව සාධාරණත්වයකින් යුතු ව ලැබීමේ අයිතිය පවතින බව. ඊට සමගාමී ව ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍යය නඟා සිටුවීමට අවශ්‍ය පුහුණු මානව සම්පත් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව ඇති වුණා. ඒ මත තවදුරටත් මහජන සෞඛ්‍ය අංශයේ පුහුණු පාඨමාලා වර්ධනය වීමත් ඒ සමඟ ගොඩනැගිලි, දේශන ශාලා, ශ්‍රවණාගාර, රසායනාගාර හා විද්‍යාගාර, පුස්තකාල හා නේවාසිකාගාර පහසුකම් මෙන් ම ආයතන පරිශ්‍රයේ අධ්‍යයන හිතකාමී පරිසරයක් ඇති කිරීමට අවශ්‍ය ගෙවතු අලංකරණ, ආපන ශාලා පහසුකම් ආදිය සඳහා නව ඉදි කිරීම් සිදු වුණා. ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය ආධාර ලබා දීමට ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), ජනගහන ක්‍රියාකාරකම් සඳහා වන එක්සත් ජාතීන්ගේ අරමුදල (UNFPA), ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි රාජ්‍ය නොවන සංවිධාන ඉදිරිපත් වුණා.

1979 වසරේදී ස්වස්ථායතනය යන්න 'ජාතික සෞඛ්‍ය විද්‍යායතනය' (National Institute of Health Sciences) නමින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සෘජු ව ගනුදෙනු කළ හැකි ජාතික පුහුණු ආයතනයක් බවට පත් වුණා. පරිපාලන පහසුව සඳහා එතෙක් පැවතුණ පාලනාධිකාර තනතුර වූ 'Chief MOH' තනතුර වෙනුවට 'ජාතික සෞඛ්‍ය විද්‍යායතන අධ්‍යක්ෂ' (Director of National Institute of Health Sciences) තනතුර හඳුන්වා දුන්නා. මේ තනතුරු වෙනස් වන විට ප්‍රධාන විධායක තනතුරේ කටයුතු කළ වෛද්‍ය ගොඩ්වින් ප්‍රනාන්දු (Dr. Godwin Fernando) ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පළමු අධ්‍යක්ෂවරයා බවටත් පත් වුණා. එම ප්‍රධාන අධ්‍යක්ෂ තනතුර යටතේ Deputy Director Training, Deputy Director Field Services, Deputy Director Medical Care Institutions යනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු ඇති කෙරුණා. මුල්කාලීන ව හඳුන්වා දෙන ලද අධ්‍යයන හා පුහුණු පාඨමාලා කාලයත් සමඟ සමකාලීන මහජන සෞඛ්‍ය අවශ්‍යතා මුල්කරගෙන වෙනස්කම්වලට භාජනය වුණා. එලෙසින් සිදු කරන ලද ඇගයීම් ක්‍රමවේද, පුහුණුව ලබා දුන් ක්‍රියාපටිපාටිය වඩාත් පුළුල් හා ගුණාත්මක කිරීමට නව තාක්ෂණය, ලෝක සෞඛ්‍ය ආයතනයේ නිර්දේශ උපයෝගි කර ගනිමින් වර්තමානය වනවිට වඩාත් ඉහළ ප්‍රමිතිකරණයක් දක්වා ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ඔසවා තැබීමට සමත් වී සිටිනවා.

පාඨමාලාවලට ඉහළ පිළිගැනීමක්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පුහුණු ආයතනය විදිහට සෞඛ්‍ය අංශයේ පුහුණු කටයුතු සම්බන්ධයෙන් ජාතික සෞඛ්‍ය විද්‍යාතනය වර්තමානයේ ප්‍රමුඛත්වයක් දරනවා. සෞඛ්‍ය අංශයේ රැකියා යනු ලෝකයේ බොහෝ රැකියා අතර ඉතා ඉහළ අවදානමක් සහිත රැකියාවක්, සේවාවක්. ඒ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියුක්ත මානව සම්පත යනු ඉතා ඉහළ වෘත්තිකභාවයකින් කටයුතු කරන පිරිසක්. ඒ සඳහා ප්‍රජා සෞඛ්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාමට පුහුණුව ලබන ආධුනිකයන් වෙනුවෙන් විෂයික දැනුම මෙන් ම ප්‍රායෝගික පුහුණුව නිසි පරිදි ලබා දීමේ වගකීමත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනටත් පවතිනවා.

අප ආයතනය මුලින් ම 1926 වසරේදී ආරම්භ කර තිබෙන්නේ සෞඛ්‍ය ඒකකයක් (Health Unit) හැටියට. ඒ කාලයේ ජනතාවට පැන නැඟුණු සෞඛ්‍ය ගැටලුවලට අවශ්‍ය සේවා සැපයීමට මේ ඒකකය පියවර ගෙන තිබුණා. මෙයින් සිදුවුණේ ලෙඩක් නිසා පැමිණෙන රෝගියෙකුට බෙහෙත් ලබා දීමක් වැනි කාර්යයක් නොවෙයි. රෝගයක් ඇති වෙන්නට හෝ ව්‍යාප්තියක් සිදු වන්නට පෙර එය වළක්වා ගැනීමට අවශ්‍ය මූලික සනීපාරක්ෂක පහසුකම් හා අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීමයි මෙහිදී සිදු වුණේ. මේ විදිහට රෝගයක් ඇතිවීමට පෙර එය වැළැක්වීම පිළිබඳ ව සැලකිලිමත් වීම ඒ කාලයේ අලුත් සංකල්පයක් වුණා. සෞඛ්‍ය ඒකකය පිහිටුවීමට පුරෝගාමීන් වූ වෛද්‍ය වෙල්ලප්පා සහ වෛද්‍ය විලියම් ජාකොබ් යන දෙපළ මේ සංකල්පය විධිමත් ව (uniformly) රට පුරා ඉදිරියට රැගෙන යාමේ අරමුණින් 'Guide to Health Unit Procedure in Ceylon' ප්‍රකාශයට පත් කළා. එකල ආයතනයේ මූලික සේවා පවත්වාගෙන යාමට ප්‍රධාන මාර්ගෝපදේශකය විදිහට එය භාවිත කළා. අදටත් මේ ග්‍රන්ථය ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පුස්තකාලයේ තබා තිබෙනවා.

කාලයත් සමඟ සෞඛ්‍ය ඒකකය (Unit System) දිනා ගත් ඉහළ සාර්ථකත්වයත් සමඟ මෙවැනි සෞඛ්‍ය ඒකක තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව ඉස්මතු වුණා. මේ තත්ත්වය ක්‍රමානුකූල ව වර්ධනය වී අද වනවිට දිවයිනේ ඕනෑ ම ප්‍රදේශයක් කිනම් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි



විශේෂඥ වෛද්‍ය
තරංගා නවෝදනී
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය

කාර්යාලයකින් (MOH office) ආවරණය වන ආකාරයට දැනට කාර්යාල 361 පිහිටුවා තිබෙනවා. ඒ සියල්ලට ම හේතු වූ මූලික ආරම්භය සිදු වන්නේ 1926 වසරේදී කළුතර භූමියෙන්.

1966 වනවිට මෙය 'ස්වස්ථායතනය' (Institute of Hygiene) බවට නම් කෙරුණා. වර්තමානයේ අප ආයතනය හඳුන්වා දෙන 'ජාතික සෞඛ්‍ය විද්‍යායතනය' (National Institute of Health Sciences - NIHS) බවට පත් වන්නේ 1979 වසරේදී. වර්තමානයේ සෞඛ්‍ය නිවාරණ කටයුතු සඳහා අවශ්‍ය සේවා සැපයීමත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය නිසි පුහුණුවීම් විෂය - ප්‍රායෝගික පාඨමාලා ඔස්සේ සැපයීමත් යන මූලික කාර්යභාරය පුළුල් ආයතනික රාමුවකින් හඳුනා ගන්න පුළුවන්. ඒවා මූලික පුහුණු පාඨමාලා, පශ්චාත් මූලික පුහුණු වැඩසටහන්, සේවාස්ථ පුහුණු වැඩසටහන්, පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන්, ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් වශයෙන් පුහුණු මට්ටම් කිහිපයක් ඔස්සේ හැඳෑරීමට අවස්ථාව සලසා දී තිබෙනවා.

සාමාන්‍යයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සියල්ල ම පාහේ ක්‍රියාත්මක වන්නේ පළාත් සභා ආයතනවලට යටත් ව. එහෙත් කළුතර, පයාගල සහ අලුත්ගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල පමණක් සෞඛ්‍ය නිවාරණ අංශවලට අදාළ නිසි පුහුණු සැපයීමේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණු අභ්‍යාස පහසුකම් සපයා ගැනීම සඳහා ජාතික සෞඛ්‍ය විද්‍යායතන පරිපාලනය යටතට තිබෙනවා. ඒ, MOH කාර්යාලවලින් ජනතාවට සුපුරුදු පරිදි සලසන පහසුකම්වලට අමතර සේවාවක් විදිහට. මීට අමතර ව දුරස්ථ පුහුණු මධ්‍යස්ථාන (satellite training centers) පවතිනවා යාපනය, මඩකලපුව, ගාල්ල, කඩුගන්නාව, කුරුණෑගල ප්‍රදේශවලත්. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සංවිධානය කරන පාඨමාලා සඳහා මේ දුරස්ථ පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කර ගැනීමට අවශ්‍ය අවස්ථාවලදී ඒ සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයෙන් (Distance Learning Center) අවශ්‍ය තාක්ෂණික පහසුකම් සපුරා දීමත් සිදු කෙරෙනවා.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වසරකට පවත්වන්නේ පුහුණු පාඨමාලා 02 බැගින්. ඒ හැර මූලික පුහුණු හා පශ්චාත් මූලික පුහුණු පාඨමාලා සඳහා ලබා දෙන ලද නිර්දේශ යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අදාළ පුහුණු සඳහා තෝරා පත්කර එවනවා. එබැවින් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විසින් සෘජු ව මේ පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමක් ප්‍රධාන වශයෙන් සිදු වන්නේ නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාව පරිදි අවශ්‍ය කාලවලදී මේ පාඨමාලා හැදෑරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශ කරන පිරිසට හැදෑරීමට අවස්ථාව සලසා දීමයි සිදු වන්නේ. එම නිසා ක්‍රමානුකූල ව මේ පාඨමාලා ආරම්භ කරන දිනයක්, වාර්ෂික ව හෝ අර්ධ වාර්ෂික ව හෝ පුහුණුව සඳහා එකතු වන සිසුන් පිරිසක් කාලීන අවශ්‍යතාව අනුව වෙනස් වෙනවා. එලෙසින් තෝරාගෙන පුහුණුව සඳහා බඳවා ගන්නා සෞඛ්‍ය නිලධාරීන්ට අවශ්‍ය සියලු පහසුකම් සපයා දීමට ජාතික සෞඛ්‍ය විද්‍යායතනය බැඳී සිටිනවා. එහිදී පුහුණුවන්නන් සඳහා අවශ්‍ය පන්ති කාමර, රසායනාගාර, ක්ෂේත්‍ර අධ්‍යයන අවස්ථා, නේවාසික පහසුකම්, පුස්තකාල, පරිගණක විද්‍යාගාර, විෂය බාහිර ක්‍රියාකාරකම්, එළිමහන් ක්‍රීඩාගාර පහසුකම් සපයා දී තිබෙනවා. එහෙත් ඇතැම් සේවාස්ථ පුහුණු සඳහා තෝරා ගැනීම් සිදු වන්නේ සෞඛ්‍ය විද්‍යායතනයේ දැනුම් දීම්වලට අදාළ ව සෞඛ්‍ය ආයතන පරිපාලනය

හෝ ඉහළ සෞඛ්‍ය නිලධාරින් හෝ එවන ලද නාම යෝජනා යටතේ.

කාලයෙන් කාලයට රෝග නිවාරණ ක්ෂේත්‍රයට එල්ල වන අභියෝග මත ඊට අනුවර්තනය විය හැකි ලෙස යාවත්කාලීන වීම අවශ්‍යයි. මුල් කාලයේදී රෝග නිවාරණය යටතේ පණු රෝග, පාචනය වැනි රෝග සඳහා අවධානය යොමු කළත් වර්තමානය වනවිට වැඩි වශයෙන් බෝ නොවන රෝග පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමට සිදු ව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය රෝග නිවාරණ කටයුතු සඳහා මඟ පෙන්වීමට අවශ්‍ය ව තිබෙනවා. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සමඟ මහජන ක්ෂේත්‍රයේ විවිධ නිවාරණ අංශවලට ප්‍රවීණත්වයක් දරන දක්ෂ ආචාර්ය මණ්ඩලයක් සිටින අතර පුළුල් වපසරියකින් ලබා දෙන මහජන සෞඛ්‍ය සේවා ඉගැන්වීම් හා පුහුණුවීම් ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගැනීමට ප්‍රමාණවත් වන ආකාරයෙන් පුහුණු ආචාර්යවරුන් පිරිසක් ද සිටිනවා.

දැනට පවතින මේ පාඨමාලාවලට අමතර ව ඉදිරියේදී අලුතින් පාඨමාලා කිහිපයක් හඳුන්වා දීමට සූදානම්. ගිලන් රථ සේවාව ආශ්‍රිත සෞඛ්‍ය පුහුණු වැඩසටහන්, රෝගී සත්කාර සේවා (Care Giver) ආශ්‍රිත සෞඛ්‍ය පුහුණු වැඩසටහන්, සෞඛ්‍ය කළමනාකරණය සම්බන්ධ පාඨමාලා යනාදිය ඊට අයත්. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාඨමාලා සඳහා බඳවා ගැනීම් හැර අප ආයතනයේ අනෙකුත් පාඨමාලා සඳහා බඳවා ගැනීමේදී ඒ සඳහා නිල වෙබ් පිටුව ඔස්සේ මාර්ගගත ව අයදුම්පත් කැඳවීමට අපේක්ෂා කරනවා. ඉදිරියේදී සෞඛ්‍ය සේවා වර්ධනය කළ හැකි ආයතනයක් වශයෙන් අප ආයතනයෙන් සපයන ඇතැම් පාඨමාලාවලට මුදල් ගෙවා හැදෑරීමට අවස්ථාව සලසා දීමේ අදහසක් ද පවතිනවා. දැනටත් රජයේ පිළිගත් ප්‍රධාන ම සෞඛ්‍ය පුහුණු ආයතනය වශයෙන් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයෙන් ලබා දෙන පාඨමාලා සඳහා ඉහළ ඉල්ලුමක් සහ පිළිගැනීමක් සෞඛ්‍ය අංශයේ පවතින බැවින් ඊට අවස්ථාවක් අප ආයතනයට පවතිනවා.

තව ද අප ආයතනය ඉදිරියේදී ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගිතා පුහුණු මධ්‍යස්ථානයක් (WHO collaboration centre) වශයෙන් ද අන්තර්ජාතික මට්ටමේ පුහුණු කටයුතු කිරීමට අපේක්ෂා කරනවා.

නව සියවසක ආරම්භයක්



වෛද්‍ය
ශාලිකා චූලරත්න
විශේෂඥ වෛද්‍ය - සෞඛ්‍ය තොරතුරු
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය

ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සමාන ම ඉතිහාසයක් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සතුවත් පවතිනවා. ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයට වසර සියයක් සපිරෙන 2026 ජූලි 01 දිනට ජාතික සෞඛ්‍ය විද්‍යායතනයටත් වසර 100ක්. එවැනි කාලයක් ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අඛණ්ඩ සේවාවක් සපුරාලීමට සමත් ව තිබීමත් සුළුපටු නැහැ. ඒ, කාලය පුරාවට ජාතික සෞඛ්‍ය විද්‍යායතනය කැප වුණේ ප්‍රජා සෞඛ්‍යයට අවශ්‍ය ශ්‍රම බලකාය එනම් සුදුසුකම් ලත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, මහජන හෙද නිලධාරින්, පවුල් සෞඛ්‍ය නිලධාරින් සැපයීම වෙනුවෙන්.

ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයේත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේත් සියවස් සැමරුම 2026 ජූලි 01 දිනට යෙදී තිබෙන බැවින් සැමරුම් උත්සව ද්විත්වය ම එකට පැවැත්වීමට තීරණය කර තිබෙනවා. ඒ අනුව ජූලි මාසයේ මුල් භාගය ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ සියවස් සැමරුම් වැඩසටහන් සඳහාත් අගභාගය ප්‍රජා සෞඛ්‍ය සේවාවට සියවසක් පූර්ණ වීම සැමරීමටත් කටයුතු සූදානම්. එම නිසා මේ සියවස් සැමරුම හුදෙක් ආයතනයට පමණක් සීමා වී නැහැ. එය මෙරට සෞඛ්‍ය සේවයේ සුවිශේෂ හැරවුම් ලක්ෂ්‍යයක ආරම්භය සිහිපත් කරවන සියවසක ආගමනයක්. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම මත මෙහි සියලු උත්සව සංවිධානය සිදු වන්නේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයෙන්.

ජූලි 01 දින පස්වරු 04ට ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ශත සංවත්සර සැමරුම් උත්සවයෙන් වැඩසටහන් මාලාව ඇරඹෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක, සෞඛ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස, නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුළු සෞඛ්‍ය



ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට සියවසක් සම්පූර්ණ වන මේ අවස්ථාව නව සියවසක ආරම්භයක්. සමාරම්භක උත්සවයේ මුඛ්‍ය අදහස් දැක්වීම් දිශානුගත වන්නේත් මේ සම්බන්ධයෙන් සංවාදයක් ඇති කිරීමට. ඒ අනුව මෙතැන් සිට අභිනවයෙන් එළඹෙන නව සියවසට සූදානම් වෙමින් අලුත් වන ප්‍රජා සෞඛ්‍ය සේවයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමටත් ඒ ඔස්සේ පාඨමාලා ඒකක යාවත්කාලීන කිරීමටත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය අපේක්ෂා කරනවා.

අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් සැමරුම් උත්සවයට ආරාධනා ලැබ තිබෙනවා. ප්‍රජා සෞඛ්‍ය සේවයේ සියලු ම සෞඛ්‍ය අංශ ආවරණය කෙරෙන සහභාගිත්වයක් ද එදිනට සිදු වේවි. උත්සවය සමගාමී ව ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ඉතිහාසය හා මෙතෙක් පැමිණ ගමන්මඟ පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් එළි දැක්වීම, ශත සංවත්සරය නිමිති කරගෙන සමරු මුද්දරයක් නිකුත් කිරීම මෙහිදී සිදු වෙනවා. එදින උදේ වරුවේ සියවසක් සම්පූර්ණ වීම අරමුණු කරගෙන කළුතර ප්‍රජා සෞඛ්‍ය ඒකකය විසින් පළමුවරට ආරම්භ කරන ලද භූමියේ එනම් දැනට කොහොලාන ප්‍රදේශයේ පිහිටා තිබෙන MOH කාර්යාලයේදී ස්වාමීන් වහන්සේලා 500 නමකට දානමය පින්කමක් පැවැත්වීමටත් අපේක්ෂිතයි.

දෙවැනි සහ තුන්වැනි දිනවල පර්යේෂණ සමුළුවක් පැවැත්වීමට නියමිත ව තිබෙනවා 'Public Health Excellence through Primary Health Care' තේමාව යටතේ. එහි ආරාධිතයන් වශයෙන් WHO, UNICEF, Family Planning Association (FPA) රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් සහභාගි වෙනවා. පර්යේෂණ සමුළුවේදී එක් එක් අධ්‍යයන සැසි සංවිධානය කරන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA), ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය විද්‍යාලය (CCPSL), ශ්‍රී ලංකා සෞඛ්‍ය තොරතුරු විද්‍යායතනය (SLCHi), ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවී විද්‍යාඥයන්ගේ විද්‍යාලය (SLCM), ශ්‍රී ලංකා ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාලය (CCDSL) ආදී ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සමඟ සම්බන්ධ වෘත්තීය ආයතන. එම සැසිවාරවලදී ආයතන මට්ටමින් සිදු කරන ලද පර්යේෂණ වාර්තා එළිදැක්වීමට පර්යේෂණ කණ්ඩායම්වලට හැකියාව ලැබෙනවා. ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පුහුණු පාඨමාලා හදාරන ශිෂ්‍යයන්ගේ පර්යේෂණ ලිපි කැඳවා ඒ ඔස්සේ ලබා ගන්නා ලද 100කට ආසන්න පර්යේෂණ ලිපි සියල්ල නිසි ක්‍රමවේදයකට අනුව සමාලෝචනය කර පර්යේෂණ සමුළුවේදී එළිදැක්වීමත් සිදු වනු ඇති. මහජන සෞඛ්‍ය සේවකයන් සඳහා ජාතික මට්ටමේ පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය වන්නේ ඉතා කලාතුරකින්. ඒ අඩු ව පිරිමසිමින් හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආදී වෘත්තීය ක්ෂේත්‍රවල නියුතු වෘත්තිකයන්ට අදාළ පර්යේෂණ ලිපි එළිදැක්වීමට මෙහිදී පුළුවන්. එයින් ඔවුන් වෘත්තියේ නියැළීමේදී ලබා ගන්නා අත්දැකීම් හා දැනුම පාදක ව ඉහළ කාර්ය සාධනයක් ලබා ගත හැකි භාවිතාවන් (best practices) පර්යේෂණ සැසියේදී දිරි ගැන්වෙනවා. එහිදී භාෂා සීමා, පාරිභාෂික වචන භාවිතයේ පවතින දුර්වලතා සම්බන්ධයෙන් සැහැල්ලු පිළිවෙතක් අනුගමනය කෙරෙන අතර සරල හා නිරවුල් සන්නිවේදනය පමණක් ප්‍රමාණවත්.

ජූලි මස 06, 07 දිනවලදී ශ්‍රී ලංකාවේ සියලු ම MOH කාර්යාලවලට අයත් ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් පළාත් මට්ටමින් සහභාගි වන ක්‍රීඩා උත්සවයක් ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ (NIHS) ක්‍රීඩා පිටියේදී පැවැත්වීම, ජූලි 10 දින සෞඛ්‍ය නිවාරණය සහ සෞඛ්‍ය සම්පන්න පුරුදු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා කළුතර නගරයෙන් ආරම්භ කර ජාතික පුහුණු ආයතනයට පැමිණ අවසන් කෙරෙන පාගමනක් සංවිධානය මෙහිදී සිදු වෙනවා. එම පා ගමනට සහභාගි වන්නේ සෞඛ්‍ය අමාත්‍යවරයා පෙරටු කරගෙන 600ක් පමණ වන ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් පිරිසක්. ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා පාසල්, ලංකාවේ සියලු ම රජයේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ, නාරා අයතනය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, ධීවර අමාත්‍යාංශය ආදී වශයෙන් ප්‍රදර්ශන කුටි ඇතුළත් ව ජාතික සෞඛ්‍ය විද්‍යායතන පරිශ්‍රයේ දින 03ක් ප්‍රජා සෞඛ්‍ය සේවාව විෂය කරගෙන ආහාර සුරක්ෂිතභාවය, වැඩිහිටි හා ළමා රෝග ආදී ප්‍රධාන තේමා 05ක් ඔස්සේ ප්‍රදර්ශනයක් ද පැවැත්වෙනවා. මේ ප්‍රදර්ශනයේ එක් අංගයක් වන්නේ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ මූලිකත්වයෙන් වෘත්තීය පුහුණු මඟ පෙන්වීමේ වැඩමුළුවක් පැවැත්වීම.

සියවස් සැමරුම නිමිති කරගෙන ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සියවස් සැමරුම් ලාංඡනයක් ද නිර්මාණය කර තිබෙනවා. මේ ගොඩනැගිලි සියල්ල වසර 25කට වඩා පැරණි නිසා NIHS ආයතනය සිදු කළ ඉල්ලීම පරිදි අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා උපරිම සහාය ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රාජ්‍ය නොවන සංවිධාන ඉදිරිපත් වුණා. ඒ අනුව ආයතන පරිශ්‍රය තුළ නව ඉදිකිරීම් හා අලුත්වැඩියාව සඳහා සංවර්ධන ව්‍යාපෘති 60ක් ක්‍රියාත්මකයි. ඒ අතර දේශන ශාලා පහසුකම් අලුත්වැඩියා කිරීම්, සුහුරු පන්ති කාමර ඇති කිරීම්, ආයතනික පරිශ්‍රය ම free Wi-Fi කලාපයක් කිරීම, නේවාසික පහසුකම් අලුත්වැඩියා කිරීම්, ශ්‍රවණාගාර පහසුකම් දියුණු කිරීම්, ගොඩනැගිලි පින්තාරු කිරීම්, භූමි අලංකරණ සැලසුම් කිරීම් ආදිය කිහිපයක්.

ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට සියවසක් සම්පූර්ණ වන මේ අවස්ථාව නව සියවසක ආරම්භයක්. සමාරම්භක උත්සවයේ මුඛ්‍ය අදහස් දැක්වීම් දිශානුගත වන්නේත් මේ සම්බන්ධයෙන් සංවාදයක් ඇති කිරීමට. ඒ අනුව මෙතැන් සිට අභිනවයෙන් එළඹෙන නව සියවසට සූදානම් වෙමින් අලුත් වන ප්‍රජා සෞඛ්‍ය සේවයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමටත් ඒ ඔස්සේ පාඨමාලා ඒකක යාවත්කාලීන කිරීමටත් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය අපේක්ෂා කරනවා. පැරණි මෙන් ම තවදුරටත් වෘත්තීය ක්ෂේත්‍රයට ප්‍රයෝජනවත් නොවන පාඨමාලා විෂය නිර්දේශවලින් ඉවත් කිරීමත් ඉදිරි කාර්යයක්. ඇතැම් ඩිප්ලෝමා පාඨමාලා සඳහා මේ වනවිට විශ්වවිද්‍යාල මට්ටමින් අධ්‍යයන පාඨමාලා නිර්මාණය වී තිබෙනවා. ඒ පිළිබඳ සැලකිලිමත් වෙමින් පාඨමාලාවල අවශ්‍ය වෙනස්කම් සිදු කර විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා සඳහා සහාය පුහුණු පාඨමාලා හඳුන්වා දීමේ අදහසක් ද දැනට සංකල්පීය මට්ටමේ පවතිනවා. Coivd 19 වසංගතයතට පෙර ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතා ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන ලද ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට නැවතත් එම අවස්ථාව දිනා ගනිමින් 'දකුණු ආසියාවේ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානය' (Public Health Collaborative Center in South Asia) බවට පත් කිරීමට අවශ්‍ය සියල්ල සම්පූර්ණ කිරීමත් මේ නව සියවස අභියස අප ආයතනය සතු ව පවතින තවත් ප්‍රධාන ඉලක්කයක්.



ආයු කෙටි කරන කෑම

රංගිකා අබේසේකර

පෝෂණය මූලික මිනිස් අවශ්‍යතාවක්. දකුණු ආසියානු අනෙක් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාව සෞඛ්‍ය දර්ශකවල ඉතා ඉහළ තත්ත්වයක සිටිනවා. එහෙත් පෝෂණය සම්බන්ධ දර්ශක සමඟ සංසන්දනයේදී ඒ පිළිබඳ සතුටු විය නොහැකි බවයි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ සඳහන් කරන්නේ. මේ නිසා රජයක් ලෙස සෑම පාර්ශ්වයක් ම එක් ව බහු පාර්ශ්වීය ප්‍රවේශයකින් සාර්ව ක්‍රියාකාරී සැලැස්මක් ඔස්සේ ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම ඉතා වැදගත්.

ජූනි 1 සිට ජූනි 30 දක්වා ක්‍රියාත්මක වූ 'ජාතික පෝෂණ මාසය' මේ පිළිබඳ පුළුල් ව අවධානයක් යොමු වූ කාල සීමාවක්. 2026 වසරේ එහි තේමාව වූයේ 'කෙටි ආහාර ගැන සිතමු, සෞඛ්‍ය සම්පන්න ස්වාභාවික කෙටි ආහාර තෝරමු' යන්න. ජාතික පෝෂණ මාසය පාදක කරගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නව චක්‍රලේඛයක් නිකුත් කෙරුණා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති විශ්ලේෂක හා සංවර්ධන අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය වින්ද්‍යා කුමාරපේළි පවසන්නේ මේ තේමාවත් සමඟ සෞඛ්‍යයට අහිතකර කෙටි ආහාර නිතර නිතර භාවිතයේ අවදානම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමත් නිසි වේලාවට සමබර ප්‍රධාන ආහාරවේල් ගැනීම සඳහා ජනතාව

> උසට සරිලන බර තිබෙනවාද යන්න සොයා බැලීමට 2024 වසරේ සිදු කළ Global School Based සමීක්ෂණය අනුව (වයස අවුරුදු 13-14ත් අතර පාසල් යන දරුවන්ගෙන්) අනාවරණය වී ඇත්තේ දරුවන්ගෙන් 29%ක් දෛනික ව ලුණු සහ මේදය අධික ආහාර භාවිත කරන බවත් 41%ක් සීනි අධික ආහාර භාවිත කරන බවත්.

බලගැන්වීමත් කළ යුතු බව. අවශ්‍ය විට ස්වාභාවික හා පෝෂණීය කෙටි ආහාර තෝරා ගැනීමත් දේශීය ව ලබාගත හැකි ආහාරවලට ප්‍රමුඛතාව ලබාදීමත් සෞඛ්‍ය සම්පන්න කෙටි ආහාර ලබාදෙන හිතකර පරිසරයක් නිර්මාණය කිරීමත් අහිතකර කෙටි ආහාර පිළිබඳ ප්‍රචාරණය සීමා කිරීමත් අනිවාර්යයෙන් ම කළ යුත්තක් බව.

මන්දපෝෂණය, අධිපෝෂණය සහ ක්ෂුද්‍ර පෝෂක ඌණතා පිළිබඳ සැලකීමේදී වර්තමානයේ ශ්‍රී ලංකාව එම අභියෝග කෙරෙහි ප්‍රබල ව මුහුණ පා සිටින රටක්. එය එක් එක් වයස් කාණ්ඩවලට එක් එක් ආකාරයෙන් බලපෑම් සිදු කරනවා. ඒ තත්ත්ව සලකා 2026-2035 දස අවුරුදු ප්‍රතිපත්තිවල පෝෂණය සහ යහපත් පුරුදු පිළිබඳ දැඩි අවධානයක් යොමු කර ඇති බවයි විශේෂඥ වෛද්‍ය වින්ද්‍යා කුමාරිපේළි සඳහන් කරන්නේ. එහිදී යහපත් පුරුදුවලට සමපාත කාරණාවක් ලෙස යහපත් ආහාර රටාව හඳුනාගන්නට පුළුවන්. එහිදී බෝ නොවන රෝග පිළිබඳ වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. විශේෂයෙන් මෙහිදී ජීවන චක්‍රය (Life Stages) අලළා පුද්ගලයා බලගැන්වීමයි ඉතා වැදගත්. ජනතාවගේ සෞඛ්‍ය සාක්ෂරතාව වැඩි කර පෝෂණය සම්බන්ධයෙන් දැනුමක් ලබා දීම, සෞඛ්‍ය සම්පන්න යහපත් පෝෂණ පරිසරයක් රටේ ක්‍රියාත්මක කිරීම එහිදී විය යුත්තක්.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය මොනිකා විජේරත්න පවසන්නේ අධ්‍යාපන

අමාත්‍යාංශය, ආහාර හා සම්බන්ධ අමාත්‍යාංශ, ග්‍රාමීය හා කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය, මත්ස්‍ය නිෂ්පාදන වැනි සෑම අංශයක් ම රටේ ජනතාවගේ පෝෂණ අවශ්‍යතා නගා සිටුවීමට දායක විය යුතු බව. පෝෂණ තත්ත්වය ඉහළ මට්ටමකට නංවා ගැනීම අපහසු වී තිබෙන්නේ බහු පාර්ශ්වීය කළමනාකරණයේ පවතින යම් යම් ගැටලු මතු වීම නිසා බවයි ඇයගේ පෙන්වා දීම.

ළමා හා මාතෘ සෞඛ්‍ය පිළිබඳ ව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය. එහි 2025 වසරේ දත්ත දෙස බැලීමේදී පළමු මාස 3 තුළ සිටින ගර්භිණී කාන්තාවන්ගෙන් 13%ක් ම අඩු බර කාණ්ඩයට අයත්. එම වසරේ ප්‍රථම වරට ගර්භිණී වූ කාන්තාවන්ගෙන් එනම් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ලියාපදිංචි වූ මව්වරුන් 14%ක් රක්තහීනතාවෙන් රෝගී වී සිටින බවයි විශේෂඥ වෛද්‍ය වින්දියා කුමාරපේළි සඳහන් කරන්නේ.

ආහාර පුරුදු හා ආහාර රටා මේ සඳහා විශේෂිත ව බලපානවා. උසට සරිලන බර තිබෙනවාද යන්න සොයා බැලීමට 2024 වසරේ සිදු කළ Global School Based සමීක්ෂණය අනුව (වයස අවුරුදු 13-14ත් අතර පාසල් යන දරුවන්ගෙන්) අනාවරණය වී ඇත්තේ දරුවන්ගෙන් 29%ක් දෛනික ව ලුණු සහ මේදය අධික ආහාර භාවිත කරන බවත් 41%ක් සීනි අධික ආහාර භාවිත කරන බවත්. වසර 5කට වරක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග අංශයෙන් සිදු කරන Steps සමීක්ෂණයෙන් අනාවරණය වී ඇත්තේ වයස අවුරුදු 18-69 අතර ගැහැනු සහ පිරිමි පුද්ගලයන්ගෙන් රැස් කළ දත්ත අනුව ඒ පුද්ගලයන්ගෙන් අධිබර සහිත අය අතරින් වැඩිහිටි කාන්තාවන් 48%ක් වූ අතර 30%ක් පිරිමි පුද්ගලයන් වන බව.

සාමාන්‍යයෙන් පෝෂණ මාසය සැමරීමේදී සෑම වසරක ම පවුල් සෞඛ්‍ය සේවා කාර්යාංශයෙන් දත්ත රැස් කිරීමක් සිදුකරනවා. ඒ අනුව අවුරුදු 05න් පහළ දරුවන්ගේ 2025 වසරේ රැස්කළ දත්ත අනුව ජාතික මට්ටමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට මිටි බව 10.1%ක්. විශේෂයෙන් වතුකර ජනතාවගේ එය 23%ක් ලෙසයි සඳහන් වන්නේ. කෘශ බව සාමාන්‍ය ජනතාවගෙන් 10%ක් වන විට වතුකර ජනතාවගේ එය 8.1%ක්. බර අඩුවීම ද මෙහිදී ගැටලුවක් ව තිබෙනවා. සාමාන්‍ය ජනතාවගේ දරුවන් අතර එය 16%ක් වන විට වතුකර ජනතාවගේ දරුවන් අතර 25%ක් බවට පත් ව තිබෙනවා. 2023 වසරේ 6%ක් වූ අධි බර දරුවන් සංඛ්‍යාව 2024 වසර වන විට 7%ක් දක්වා වර්ධනය වී තිබෙනවා.

එම සමීක්ෂණය අනුව 2023 වසරේ ස්ථූලතාව ඇති දරුවන් ගණන 2.7%ක්. 2024 වසරේ එය

> සැබවින් ම අප කෙටි ආහාර භාවිතයට ගන්නේ ඇයි? යන්න විමසා බැලීම වැදගත්. පුරුද්දක් ලෙස, මානසික හේතු නිසා, පහසුවෙන් ආහාරයට ගත හැකි නිසා, කෙටි ආහාර සඳහා ලබාදෙන ප්‍රචාරණය හේතුවෙන් ඒවාට උත්තේජනය වීම නිසා කෙටි ආහාර සඳහා යොමු වීමට පුළුවන්. කෙටි ආහාර අත්‍යවශ්‍ය නොවන බවයි විශේෂඥ වෛද්‍යවරුන්ගේ මතය. එහෙත් කෙටි ආහාර අවශ්‍ය පුද්ගලයන් සිටිනවා.

3.1%ක් ලෙස වර්ධනය වී තිබෙනවා. කුඩා දරුවන් අතර ස්ථූලතාව ගැටලුවක් වී නොමැති වුවත් පාසල් දරුවන් අතර මෙය ගැටලුවක් ව තිබෙනවා. ඊට හේතු වන්නේ ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය ඉතා අඩු මට්ටමක තිබීම. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව මෙරට සාඵල්‍යතා අනුපාතය (Total Fertility Rate) තිබිය යුතු අගය වන්නේ 2.1ක්. එහෙත් නව දත්ත අනුව එය ඇත්තේ 1.3ක අගයක. ඒ අනුව ඉදිරියේදී ජනගහනය අඩුවන බවයි මෙයින් පෙනී යන්නේ. දැනට සිටින දරුවන්ට බෝ නොවන රෝග වැලඳීමේ ඉඩකඩ වැඩි බවත් මන්දපෝෂණය සහ අධිපෝෂණය සම්බන්ධයෙන් ගැටලු ඇති බවත් වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කරන කාරණාවක්.



පාසල් සිසුන්ගේ ගෝලීය සෞඛ්‍ය සමීක්ෂණය-2024 අනුව (වයස අවුරුදු 13-17 පාසල් දරුවන් 2912ක් යොදා සිදු කළ) ඔවුන්ගේ ආහාර රටා සැලකූ විට 17.4%ක් දෛනික ව පැණි බීම භාවිත කර තිබෙනවා. විශේෂයෙන් සීනි අධික බීම වර්ග 28%ක්, අධික ලුණු සහිත ආහාර 28.5%ක්, අධික තෙල් සහිත ආහාර 10.3%ක්, අධික සීනි සහිත ආහාර 40.9%ක් දෛනික ව පරිභෝජනය කර ඇති අතර මේ දරුවන්ගෙන් 70.4%ක් පාසලෙන් පිට ව යන අවස්ථාවල ක්ෂණික ආහාර පරිභෝජනය කර තිබෙනවා. එයින් පැහැදිලි වන්නේ අහිතකර කෙටි ආහාර ගැනීම සම්බන්ධ ගැටලුව කොතරම්දුරට සමාජගත වී ද යන්න.

ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය මොනිකා විජේරත්න; "අතීතයේ නිවෙස්වල නිරන්තරයෙන් පෝෂණය රැකෙන පරිදි ආහාර පිස ගත්තා. එහෙත් වර්තමාන කාන්තාවන්ගේ කාර්යබහුලත්වය හේතුවෙන් නිවසේ ආහාර පිළියෙල කරන්නේ අවම වශයෙන්. ඒ නිසා කෙටි ආහාරවලට යොමු වී තිබෙනවා. අප කෙතරම් පෝෂ්‍යදායී ආහාර පිළිබඳ කතා කළත් ඒවා පිළිබඳ ප්‍රචාරණය ඉතා අඩුයි. එහෙත් සැකසූ කෙටි ආහාර සඳහා ඇති ප්‍රචාරණය ඉහළයි. එය හේතුවක් ව තිබෙනවා පෝෂණයක් නොමැති කෙටි ආහාර දරුවන් සහ වැඩිහිටියන් අතර ජනප්‍රිය වීමට සහ අබ්බැහි වීමට. උසට සරිලන දේහ බරක් සහිත අයෙකුට කෙටි ආහාර අවශ්‍ය වන්නේ නැහැ. කෙටි ආහාර අවශ්‍ය තැනැත්තන් සිටිනවා. ඔවුන්ට වෛද්‍ය උපදෙස් අනුව කුමනාකාරයේ



කෙටි ආහාරයක් ලබා ගත යුතු ද? යන්න තීරණය කළ හැකියි."

ඒ සඳහා රජය නොයෙකුත් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය හා එක් ව ආපනශාලා මාර්ගෝපදේශ සකසා තිබෙනවා. එයින් බලාපොරොත්තු වන්නේ හිතකර ආහාර පරිසරයක් නිර්මාණය කිරීමට සහාය වීම සහ සෞඛ්‍යයට අහිතකර කෙටි ආහාර වෙළෙඳපොළට ගෙන ඒමට සීමා පැනවීම. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණය පිළිබඳ විශේෂඥ වෛද්‍ය මනෝජි ගමගේ සඳහන් කරන්නේ තෝරාගත යුත්තේ කුමන කෙටි ආහාර ද යන්න සැලකීමේදී විටමින්, ඛනිජ ලවණ ලැබෙන ආහාරයක් තෝරා ගැනීම සෞඛ්‍යයට වඩාත් වැදගත් බව. අපේ සමාජයේ ක්ෂුද්‍ර පෝෂක ඌනතාව බහුල නිසා එය මඟ හැර ගැනීම සඳහා එළවළු, පලතුරු, රටකජු වැනි ඛනිජ ලවණ විටමින් ඇති ආහාර භාවිත කිරීම වඩා වැදගත්. විශේෂයෙන් කැලරි අවම, තන්තු වැඩි පෝෂණ ගුණයෙන් අනූන ආහාර කෙටි ආහාර ලෙස යොදා ගැනීම වැදගත් බවයි විශේෂඥ වෛද්‍ය මනෝජි ගමගේ අවධාරණය කරන්නේ.

සැබවින් ම අප කෙටි ආහාර භාවිතයට ගන්නේ ඇයි? යන්න විමසා බැලීම වැදගත්. පුරුද්දක් ලෙස, මානසික හේතු නිසා, පහසුවෙන් ආහාරයට ගත හැකි නිසා, කෙටි ආහාර සඳහා ලබාදෙන ප්‍රචාරණය හේතුවෙන් ඒවාට උත්තේජනය වීම නිසා කෙටි ආහාර සඳහා යොමු වීමට පුළුවන්. කෙටි ආහාර අත්‍යවශ්‍ය නොවන බවයි විශේෂඥ වෛද්‍යවරුන්ගේ මතය. එහෙත් කෙටි ආහාර අවශ්‍ය පුද්ගලයන් සිටිනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ වෛද්‍ය අරුණිකා සේනාරත්න පවසන්නේ ප්‍රධාන ආහාර වේලට ආදේශකයක් ලෙස කෙටි ආහාර භාවිත නොකළ යුතු බව. එය අමතර ව ලබා ගන්නා ආහාරයක්. ඇය පෙන්වා දෙන පරිදි සීමා කළ යුතු කෙටි ආහාර හඳුනාගෙන තිබෙනවා. සීනි සහිත බනිස් වර්ග, පැණි බීම, බිස්කට්, කේක්, රස කැවිලි සහ සීනි අධික අතුරුපස වර්ග, ලුණු සීනි සහ සෞඛ්‍යයට අහිතකර මේද සහිත ව සැකසූ කෙටි ආහාර පාසල් හා වැඩකරන ජනතාව අතර වඩාත් ප්‍රසිද්ධිය උසුලනවා. මේ ආහාර පුරුදුවලින් ජනතාව චර්යාත්මක ව ඉවත් විය යුතු අතර මේ සඳහා රටේ යහපත් ආහාර පරිසරයක් ප්‍රතිපත්තිමය වශයෙන් ඇති කළ යුතු වෙනවා.

අදහස් දක්වන ප්‍රජා විශේෂඥ වෛද්‍ය අරුණිකා සේනාරත්න; "නිවසේ පිළියෙල කළ ආහාර භාවිතය සඳහා ජනතාව යොමු කිරීමට ප්‍රචාරණය ලබා දීම වැදගත්. එහිදී සිහියෙන් සහ අවධානයෙන් ආහාර ගැනීමේ පුරුද්ද ප්‍රවර්ධනය කළ යුතුයි. විශේෂයෙන් පාසල් ආපන ශාලාවලට වෙන ම ආපන ශාලා මාර්ගෝපදේශක සකස් කිරීම වැදගත්. ඒවායේ විකිණිය යුතු ආහාර සම්බන්ධයෙන් නියාමන තිබෙනවා. ඒ අනුව දේශීය නිෂ්පාදන සහ නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කළ යුතුයි. ආහාර මිල දී ගැනීමේදී ලේබල්වල ඇති නිෂ්පාදිත ද්‍රව්‍ය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අඩුයි. සෑම ජීවන අවධියකදී ම පෝෂණය ගැන සැලකිලිමත් වීම වැදගත්. විශේෂයෙන් දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීම මෙහිදී වඩාත් කාලෝචිත වනවා."

කෙටි ආහාරවල ඇති අධික කැලරි ප්‍රමාණය පුද්ගලයෙකු අධික ලෙස ස්ථූලවීමටත් බෝ නොවන රෝග සඳහා මූලික ම හේතුවක් වීමටත් පුළුවන්. කෙටි ආහාර භාවිත කිරීමෙන් දියවැඩියාව වැනි රෝග වැලඳීමට ඇත්තේ වැඩි ඉඩක්. ඒ සමඟ ම හෘද රෝග වැනි බෝ නොවන රෝග ඇති වන්නට පුළුවන්. දැනට භාවිතයට ගන්නා බොහෝ කෙටි ආහාර නුසුදුසු බැවින් ඒවා පිළිබඳ නැවත සිතා බැලිය යුතුයි. ආහාර චර්යාව පිළිබඳ විමසීමේදී ප්‍රධාන ආහාර වේල් ඉලක්ක කරගත් නිවැරදි පෝෂණ රටාවක් ජනතාවට හුරු කළ යුතු වනවා.

(සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක් ඇසුරින්)

ජාතික පෝෂණ මාසයේ මහජන සෞඛ්‍යය ඉලක්ක කරගත් පණිවිඩ

1. බොහෝ සෞඛ්‍ය සම්පන්න වැඩිහිටියන් සඳහා නිතර කෙටි ආහාර අවශ්‍ය නැහැ.

2. සෞඛ්‍ය සම්පන්න පෝෂ්‍යදායී ප්‍රධාන ආහාර වේලක් පරිභෝජනය කරන්න.

3. නිතර නිතර කෙටි ආහාර ගැනීම සහ සැකසූ ආහාර පරිභෝජනය අවම කරන්න.

4. කෙටි ආහාර ලබා ගැනීමේදී ඒවා ස්වාභාවික, පෝෂ්‍යදායී, සෞඛ්‍යමත්, පෝෂණ ගුණයෙන් ඉහළ සහ නියමිත ප්‍රමාණවලින් ලබා ගැනීම වැදගත්.

5. සමබල ආහාර වේල් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර අනවශ්‍ය කෙටි ආහාර ගැනීම සීමා කළ යුතුයි.



පැසිෆික් උණුසුම

චන්දන මාරසිංහ

එල්නිනෝ (El Niño) ලෙස සැලකෙන්නේ පැසිෆික් සාගරයේ උෂ්ණත්වය සාමාන්‍ය මට්ටමට වඩා වැඩිවීම හේතුවෙන් ලෝකයේ කාලගුණ රටාවට බලපෑම් ඇති කරන දේශගුණික සංසිද්ධියක්. එනම් මේ කලාපයේ නිර්මාණය වන දක්ෂිණ දෝලනය ලෙසින් හඳුන්වන වායුගෝලීය සංසිද්ධියේ එක් අවස්ථාවක්. නිවර්තන පැසිෆික් සාගර කලාපයේ උණුසුම සාමාන්‍ය මට්ටමට වඩා වැඩිවීම හේතුවෙන් මේ තත්ත්වය ඇති වන අතර එහි බලපෑම නිසා සුළං රටාව වෙනසකට ලක් වෙනවා. මේ සංසිද්ධිය වසර 2-7 අතර කාලයකට වරක් ඇතිවිය හැකි බවයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසන්නේ.

1960 ගණන්වලදී නෝර්වේ ඇමරිකා කාලගුණ විද්‍යාඥයෙකු වූ Jacob Bjerknes පෙන්වා දුන්නේ එල්නිනෝ හේතුවෙන් ඇති වූ පැසිෆික් සාගරයේ උණුසුම, දකුණු දෝලනය සමඟ සම්බන්ධ වී ඇති බවත් ඉන් සාගරය හා වායුගෝලය අතර සමීප සම්බන්ධතාවක් ඇති කරන බවත්. ඒ අනුව මේ සම්බන්ධතාව ඒකාබද්ධ කරමින් එල්නිනෝවේ නිල නාමය වන එල්නිනෝ දක්ෂිණ දෝලනය (El Niño Sothern Oscillation) යන්න බිහි වී තිබෙනවා. එය කෙටියෙන් හැඳින්වෙන්නේ ENSO ලෙස. දකුණු පැසිෆික් කලාපයේ පීඩනය වැඩි වූ විට සිදු වන්නේ උතුරු ඕස්ට්‍රේලියාව හා ඉන්දුනීසියාව ආශ්‍රිත කලාපවල පීඩනය අඩු වීම. ඒ අනුව විශාල දුරකින් පිහිටි මේ කලාප දෙක වායුගෝලීය පීඩන හැසිරීම අනුව සම්බන්ධ වී තිබෙනවා. දකුණු දෝලනය ලෙස හැඳින්වෙන්නේ එම සම්බන්ධීකරණය.

එල්නිනෝ තත්ත්වයක් ඇතිවීම සඳහා මධ්‍යම සහ නැගෙනහිර නිවර්තන පැසිෆික් සාගරයේ මුහුදු මතුපිට උෂ්ණත්වය සාමාන්‍ය මට්ටමට වඩා +0.5°Cකින් උණුසුම් විය යුතු අතර එය අඛණ්ඩ ව මාස කිහිපයක් පැවතිය යුතුයි. ඊට අමතර ව වායුගෝලය උණුසුම් ජලයට ප්‍රතිචාර දැක්විය යුතු වන්නේ පවතින සුළං දුර්වල කරමින්.

'එල්නිනෝ' යනු ස්පාඤ්ඤ භාෂාවෙන් බිඳී ආ වචනයක්. එම භාෂාවෙන් එහි අර්ථය වන්නේ 'කුඩා පිරිමි ළමයා' යන්න. පේරු සහ ඉක්වදෝරය අසල වෙරළට ඔබ්බෙන් වූ කලාපයේ මේ තත්ත්වය අතීතයේ සිට ම නිරීක්ෂණයට ලක් ව තිබෙනවා. ස්පාඤ්ඤ ධීවරයන් නත්තල් සමයේදී මෙය නිරීක්ෂණයට ලක් කර ඇති බව ඇමරිකා වාණිජ දෙපාර්තමේන්තුවේ ජාතික සාගර හා වායුගෝලීය පරිපාලනය සඳහන් කර තිබෙනවා. ඇමරිකා ජාතික සාගර හා වායුගෝලීය පරිපාලනය 2026 ජූනි 11 දින ප්‍රකාශ කළේ එල්නිනෝ කාලගුණ රටාව නිල වශයෙන් ආරම්භ වී ඇති බව. ඔවුන් පෙන්වා දෙන ආකාරයට 2026 නොවැම්බර් සහ 2027 ජනවාරි කාලයේ මේ එල්නිනෝ තත්ත්වය වඩාත් ශක්තිමත් වීමේ සම්භාවිතාව 63%ක් වනවා. බ්‍රිතාන්‍ය කාලගුණ විද්‍යා කාර්යාලය පෙන්වා දෙන්නේ මේ බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමට සිදු වන බව. 2026 වසර අවසානයේ සහ 2027 වසර මුල වන විට ගෝලීය වශයෙන් ඉහළ උෂ්ණත්වයක් වාර්තා විය හැකි බව එම කාර්යාලය සඳහන් කරනවා. උතුරු පේරු සහ ඉක්වදෝරයේ ජලගැලීම් බහුල ව ඇති විය හැකියි. නැගෙනහිර අප්‍රිකාව, මධ්‍යම ආසියාව හා දකුණු ඇමරිකා කලාපයට ද එය ව්‍යාප්ත විය හැකියි. ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව ඇතුළු රටවල් අයත් කලාපවල නියඟය හා ලැව් ගිනි අවදානම ඉහළ යාමේ හැකියාව පවතිනවා. එය කෘෂිකර්මාන්තයට හා ගෝලීය ආහාර සැපයුම් දාමයට බලපෑම් එල්ල කිරීමට හේතුවක්. කෙසේ වෙතත් ඕස්ට්‍රේලියා කාලගුණ විද්‍යා කාර්යාංශය පවසන්නේ බලපෑම් ඉහළ යාමට නම් මුහුදු මතුපිට උෂ්ණත්වය +0.8°C ඉක්ම විය යුතු බව. බොහෝ අනාවැකි පෙන්වා දෙන්නේ මෙවර එල්නිනෝ තත්ත්වය වඩාත් ප්‍රබල විය හැකි බව. ආසියාවේ කෘෂිකර්මාන්තයට ද එයින් අහිතකර බලපෑම් එල්ල විය හැකි බවයි රොයිටර් පුවත් සේවය විශේෂ ලිපියක් පළ කරමින් සඳහන් කර තිබෙන්නේ. ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ සිට ඕස්ට්‍රේලියාවේ නැගෙනහිර කලාපයට ඉන් බලපෑම් එල්ලවීමේ හැකියාව පවතිනවා. තායිලන්තයට ද ගැටලු මතු වන බව සඳහන්. තිරිඟු පිටි මිල ඉහළ යාමට මේ තත්ත්වය ඉවහල් විය හැකියි. චීනයට හා කළු මුහුදු ආශ්‍රිත කලාපයට එල්නිනෝ උදාසීන මට්ටමක පැවතිය හැකි බවටයි අනාවැකි පළ ව තිබෙන්නේ. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය පෙන්වා දෙන්නේ 2026 අගෝස්තු වන විට එල්නිනෝ ක්‍රියාකාරී ලෙස වර්ධනය වීමේ සම්භාවිතාව 80%ක් පමණ විය හැකි බව. ඒ අනුව මේ තත්ත්වය හේතුවෙන් කෘෂිකර්මාන්තය, බලශක්ති සැපයුම, වෙළෙඳාම, ජල සම්පත සහ ජීවනෝපාය කෙරෙහි බලපෑම් එල්ල වීමේ හැකියාව පවතිනවා.

ගෝලීය තත්ත්වය එසේ වන විට එල්නිනෝ හේතුවෙන් ශ්‍රී ලංකාවට එල්ල විය හැකි බලපෑම පිළිබඳ අවධානය යොමු කිරීමේදී අනෙකුත් කාලගුණ දත්ත පිළිබඳ ව ද සැලකිලිමත් වීම වැදගත්. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසන්නේ 2026 ජූනි මාසයේ සිට සැප්තැම්බර් අතර කාලයේ දිවයිනේ බොහෝ ප්‍රදේශවලට දිගුකාලීන සාමාන්‍ය තත්ත්වයකට ආසන්න

වර්ෂාපතනයක් අපේක්ෂා කරන බව. වයඹ හා සබරගමුව පළාත්වල මෙන් ම මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්වල අපේක්ෂා කරන්නේ අඩු වර්ෂාපතනයක්. මේ අනාවැකි පළ කිරීමේදී මුහුදු මතුපිට උෂ්ණත්වය හා වායුගෝලීය සංසරණ රටා ගැන අවධානය යොමු කර තිබෙනවා. මේ අතර ඉන්දීය සාගර කලාපයේ ද්වී ධ්‍රැව තත්ත්වයක් ද පවතින අතර ඕස්ට්‍රේලියා කාලගුණ විද්‍යා කාර්යාංශය පෙන්වා දෙන ආකාරයට මේ තත්ත්වය ජූලි මාසය දක්වා පවතිනවා. මෙය ශ්‍රී ලංකාවේ මෝසම් වර්ෂාපතනයට බලපාන වැදගත් සාධකයක්. මෙහිදී සිදුවන්නේ ඉන්දීය සාගරයේ බටහිර හා නැගෙනහිර මුහුදු මතුපිට උෂ්ණත්වය වෙනස් වීම. ශ්‍රී ලංකාවේ ගංවතුර හෝ නියඟ හෝ ඇතිවීමට මෙය බලපෑම් කළ හැකියි. ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ පැසිෆික් සාගර කලාපයේ සිට කිලෝමීටර දස දහස් ගණනක් පමණ දුරකින්. එහෙත් සමකය ආසන්න කලාපයේ සුළං රටාවට මින් බලපෑම් එල්ලවන බව කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු පවසනවා. ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම බලපාන තත්ත්වයක් පවතින නිසා නිරිත දිශාවේ සිට පැමිණෙන සුළංවලට එල්නිනෝවෙන් බලපෑම් එල්ල විය හැකියි. ඒ අනුව මේ සුළං ප්‍රවාහය දුර්වල වන බවයි මලිත් ප්‍රනාන්දු පවසන්නේ. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට වර්ෂාව අඩු විය හැකියි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව ආශ්‍රිත ව පවතින විවිධ ඍතුවලට එල්ල වන බලපෑම අනුව මේ තත්ත්වය තීරණය වනවා. මෙහි පුරෝකථනය වන්නේ විශාල නියඟයක් ඇති විය නොහැකි බව. කෙසේ වෙතත් ඉදිරියේදී එල්නිනෝව ප්‍රබල වීම සඳහා 63%ක සම්භාවිතාවක් පවතින බව ඇමරිකා කාලගුණ අංශ සඳහන් කර තිබෙනවා.

අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවට පවතින්නේ සාපේක්ෂ ව වර්ෂාව අඩු කාලයක්. එය උෂ්ණත්වය වැඩි මාසයක්. මේ නිසා එල්නිනෝ තත්ත්වය හේතුවෙන් වර්ෂාව තවදුරටත් අඩු විය හැකියි. එය ගැටලුකාරී තත්ත්වයක්. අදහස් දක්වන කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු; "ඇති විය හැකි එල්නිනෝ තත්ත්වය හේතුවෙන් පානීය ජල ගැටලුවක් ද මතුවිය හැකියි. ජූලි මාසයේදී මෙවැනි ගැටලු බරපතළ ලෙස මතු නොවන්නට පුළුවන්. අගෝස්තු දක්වා වර්ෂාපතනයේ අඩුවීමක් පැවතිය හැකි අතර ම සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලයේ වර්ෂාව වැඩි විය හැකියි. ඒ අනුව ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වර්ෂාපතනයට වඩා වැඩි වර්ෂාවක් හට ගත හැකියි. මෙහි බලපෑම වසරක් වැනි කාලයක් දක්වා පැවතිය හැකියි. එල්නිනෝ පිළිබඳ දත්ත වාර්තා රැස් කිරීමෙන් පෙනී ගියේ ඉතා ප්‍රබල එල්නිනෝ 3ක් සහ ප්‍රබල එල්නිනෝ 6ක් වාර්තා වී තිබෙන බව. මෙවර එල්නිනෝව ද ප්‍රබල විය හැකි බවට මත පළ වී තිබෙනවා."

ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවකදී හෙළි වී තිබෙන්නේ මෙවර එල්නිනෝ තත්ත්වය වඩාත් සමීප විය හැකි වන්නේ 2016, 2017 වසරවල ඇති වූ තත්ත්වයට බව. ජල කළමනාකරණ සැලසුම ඊට අනුකූල ව සකස් කරන බවට මෙහිදී අදහස් පළ වී

> එල්නිනෝ (El Niño) ලෙස සැලකෙන්නේ පැසිෆික් සාගරයේ උෂ්ණත්වය සාමාන්‍ය මට්ටමට වඩා වැඩිවීම හේතුවෙන් ලෝකයේ කාලගුණ රටාවට බලපෑම් ඇති කරන දේශගුණික සංසිද්ධියක්. එනම් මේ කලාපයේ නිර්මාණය වන දක්ෂිණ දෝලනය ලෙසින් හඳුන්වන වායුගෝලීය සංසිද්ධියේ එක් අවස්ථාවක්. නිවර්තන පැසිෆික් සාගර කලාපයේ උණුසුම සාමාන්‍ය මට්ටමට වඩා වැඩිවීම හේතුවෙන් මේ තත්ත්වය ඇති වන අතර එහි බලපෑම නිසා සුළං රටාව වෙනසකට ලක් වෙනවා. මේ සංසිද්ධිය වසර 2-7 අතර කාලයකට වරක් ඇතිවිය හැකි බවයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසන්නේ.

තිබෙනවා. වගා කටයුතු සිදුකිරීමේදී නියමිත කාලයට මාස එකහමාරකට පමණ පෙර එය ආරම්භ කිරීම එහිදී ඉදිරිපත් වූ යෝජනාවක්. එල්නිනෝ තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට දරුණු බලපෑමක් එල්ලවීමේ අවදානම අඩු බව දේශගුණ විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ලීල් රන්දෙනි පවසනවා. ඉන්දීය සාගරයේ බටහිර ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ යාමෙන් ඇති වන දේශගුණ විපර්යාසයත් රට මැද පිහිටි කඳුකරයත් හේතුවෙන් ශ්‍රී ලංකාවට වැසි ලැබෙන බව ඔහු පෙන්වා දෙනවා. ඔහු පවසන ආකාරයට එල්නිනෝ තත්ත්වයෙන් බලපෑම් ඇති වුවහොත් එය සිදුවන්නේ 2027 වසරේ පෙබරවාරි මාසයෙන් පසුව. ඊසාන දිග මෝසම් වර්ෂාව සක්‍රිය වන කාලයේ එම බලපෑම ඇතිවීමේ හැකියාවක් පවතිනවා.

එල්නිනෝ තත්ත්වය මත ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව, පානීය ජලය හා බලශක්තිය යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ජාතික ආහාර සුරක්ෂිතතා කමිටුවේ කැඳවුම්කරු කපිල ජානක බණ්ඩාර පෙන්වා දෙනවා. එම බලපෑම් හඳුනා ගනිමින් ඒවාට විසඳුම් ලබා දීමේ මූලික ක්‍රියාමාර්ග මේ වන විට ගෙන තිබෙන්නේ ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අදාළ සම්බන්ධීකරණය ඇති ව. එල්නිනෝ යනු ජාත්‍යන්තර වශයෙන් බලපෑම් එල්ල කරන සංසිද්ධියක් නිසා එයට පෙර සූදානම වැදගත්. ඉන්දියාවෙන් බීලූනු වැනි ආහාර ද්‍රව්‍ය, ඕස්ට්‍රේලියාවෙන් පරිප්පු සහ පාකිස්තානයෙන් අර්ථාපල් වැනි දෑ ශ්‍රී ලංකාවට ගෙන්වන නිසා එම රටවලට බලපෑම් එල්ල වී ආහාර සම්පාදනයට ගැටලු මතුවුවහොත් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ආහාර සුරක්ෂිතතා කමිටුවේ අවධානය යොමු ව තිබෙනවා. ඒ අනුව ආරක්ෂිත ආහාර තොග පවත්වාගෙන යාම මෙහිදී මූලික වනවා. වී අලෙවි මණ්ඩලය වී තොග රැස් කිරීමට සැලසුම් සකස් කරමින් සිටින්නේ මේ තත්ත්වය සමාලෝචනය කරමින්. මෙහිදී ආහාර සැපයුම් හා පෝෂණය ඉතා වැදගත් වන බව කපිල ජානක බණ්ඩාර පෙන්වා දෙනවා. ආහාර නිෂ්පාදනය වැඩි කිරීම මෙන් ම මෙරටට ආහාර ගෙන්වීමේදී සහන මිල ගණන්වලට ඒවා ලබා දීමත් වැදගත්. ජල සම්පාදන ක්‍රියාවලිය ද මෙහිදී සලකා බැලිය යුතු කරුණක්. මෙහිදී පානීය ජලයට පළමු ප්‍රමුඛතාවත් කෘෂිකර්මාන්තයට දෙවැනි ප්‍රමුඛතාවත් ලබා දී තිබෙනවා. කොළඹ ඇතුළු නාගරික ප්‍රදේශවලට ජලය ලබාදීම පිළිබඳ ව ද යොමු ව තිබෙන්නේ විශේෂ අවධානයක්.

මෙවැනි ස්වාභාවික ආපදාවල බලපෑම ප්‍රබල වීමට මිනිස් ක්‍රියාකාරකම් ද හේතු වනවා. විශේෂයෙන් පරිසරයට සිදු කරන හානි සහ උෂ්ණත්වය ඉහළ යාම ද ඊට අයත්. එල්නිනෝ තත්ත්වයකින් ඇතිවන බලපෑමේ ස්වභාවය තීරණය වන්නේ එක් එක් රටවල පවතින ඍතු අනුව වුවත් බලපෑමට සූදානම් වීම අනිවාර්ය වන්නේ එහි ප්‍රතිවිපාක පිළිබඳ පුරෝකථන කළ නොහැකි නිසා.



තිරයේ වේලක්

වංගීස සුමනසේකර

විමුක්ති ජයසුන්දරගේ 'ස්පයින් ස්ටාර්ස්' චිත්‍රපටයේ විශේෂ දර්ශනයක් ජුනි 4 දින පැවැත්වුණා. තවමත් බොහෝ දෙනෙකු දැක නොමැති චිත්‍රපටයක් සම්බන්ධයෙන් විචාරයක් කිරීම තරමක් දුෂ්කර අභ්‍යාසයක් වුවත් මේ චිත්‍රපටය සම්බන්ධයෙන් කියවීම ප්‍රයෝජනවත් වන්නේ මෙය බොහෝ අර්ථවලින් විමුක්ති ජයසුන්දරගේ සිනමාවේ සන්ධිස්ථානයක් වන නිසා.

'ස්පයින් ස්ටාර්ස්' චිත්‍රපටයේ වැදගත් ලක්ෂණයක් වන්නේ එය මුළුමනින් අත්භූත පරිකල්පිත විශ්වයක පැවතීම. එය ආරම්භ වන්නේ විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටයක් ලෙස. එහිදී ඉංග්‍රීසි කතා කරන මනුෂ්‍ය නොවන බුද්ධිමත් ජීවියෙකු මනුෂ්‍ය කාන්තාවක් පාලනය කරනවා. චිත්‍රපටය ඇරඹෙන්නේ එම කාන්තාව ගුවන් යානයකින් හනුමාන් දූපත නම් අත්භූත රටකට පැමිණීමත් සමඟ. එය බොහෝ අර්ථවලින් ලංකාවට මෙන් ම ඉන්දියාවටද සමාන යැයි සිතිය හැකි පරිසරයක්. පසුව දැන ගන්නා පරිදි ඇයගේ සිරුරට ඉලෙක්ට්‍රොනික චිපයක් දමා එම මනුෂ්‍ය නොවන බුද්ධිමත් ජීවීන් ඇය ව පාලනය කරනවා. ඇය හරහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබා ගන්නවා. එය මර්දනකාරී සම්බන්ධයක්. ඔවුන් ඇය ව පීඩාවට පත් කරනවා.

ඇය යන අත්භූත දූපතේ වෛද්‍ය කණ්ඩායමක් ඇය ව ගුවන් තොටුපොළේදී පරීක්ෂා කර ඇය ව යොමු කරන්නේ සති දෙකක් අන් සමාජයෙන් ඉවත් කර තබන නිරෝධායන මධ්‍යස්ථානයකට. එම නිරෝධායන මධ්‍යස්ථානය අයත් ලෝකය මුළුමනින් ව්‍යාජ වූවක්. එහි තිබෙන්නේ අත්භූත බවක්. එය අපට ඒත්තු ගැන්වීමට අපහසු යැයි සිතෙන තරම් ව්‍යාජ වූවක්.

මා සිතන්නේ මෙය විමුක්තිගේ සිනමා සිතීමේ වැදගත් රහසක් හෙළි කරනා බව. එය මෙසේ තනි වාක්‍යයකට ගොනු කළ හැකියි. 'ඔහුගේ සිනමාවේ දේශපාලනය තිබෙන්නේ ප්‍රබන්ධයක් ලෙසයි.' මෙයට පෙර එය එතරම් හොඳින් හසු නොවන්නේ එහිදී ඔහු ඓතිහාසික සිදුවීම් සහ සමාජයේ මුණ ගැසෙන ආකාරයේ මිනිසුන් ඇසුරින් සිය කතාව ගොතන නිසා. එහෙත් එහිදී වුවත් ඒවායේ සැබෑ මිනිසුන් ලෙස අපට හමුවන්නේ සත්‍ය වශයෙන් ම සමාජයේ හමුවන ආකාරයේ චරිත ද යන්න බැරෑරුම් ලෙස ප්‍රශ්න වුණා. විමුක්තිගේ සිනමාවේ දේශපාලනය එහි බලෙන් එල්ලා ඇති තේමා කියා විවේචනයක් පැමිණියේ එබැවින්.

එහෙත් මෙය විමුක්තිගේ සිනමාවේ සැබෑ පසුබිම පිළිබඳ වැරදි අවබෝධයකින් ගොඩනැගෙන්නක්. ඔහු උත්සාහ කරන්නේ දේශපාලන ප්‍රශ්නයක් සිනමාත්මක ව සිතීමට නොව ඒ වෙනුවට දේශපාලනයෙන් ඉවත් ව යාමට. විමුක්තිගේ සිනමාව බොහෝ දෙනෙකු විවේචනය කරන විට මට එය ප්‍රිය වන්නේ මේ නිසා. ඔහුගේ සිනමාව හඳගමගේ හෝ ප්‍රසන්නගේ හෝ සිනමාව මෙන් දේශපාලනික වන්නක් නොවෙයි. එය විවෘත ව දාර්ශනික සිනමාවක්. මෙහි දේශපාලනය සෙවීම අර්ථ විරහිත වන්නේ මේ නිසා. තවදුරටත් විමුක්ති මේ තිබෙන්නේ සැබෑ ලංකාව හෝ සැබෑ ඉන්දියාව හෝ කියා කියන්නේ නැහැ. ඒ වෙනුවට අපට හමුවන්නේ ප්‍රබන්ධගත දේශපාලන යථාර්ථයක්.

එය ආරම්භයේදී විශ්වාස කිරීමට අපහසු තරම් විශ්වයක්. මෙහි විකට ස්වරූපයක් තිබෙනවා. එය බැරෑරුම් ලෙස සිතන්නට අපෙන් ඉල්ලා සිටින විශ්වයක් වුවත් එය විශ්වසනීය වන්නක් කියා අපට සිතෙන්නේ නැහැ. එහෙත් විමුක්තිගේ

සිනමාව දක්ෂ වන්නේ ඔහු ක්‍රමයෙන් මේ විශ්වය අපට විශ්වසනීය වන්නක් කරන නිසා. එය ප්‍රබන්ධගත වූවක් වුවත් එය විශ්වසනීයයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ විමුක්ති කතාන්දරයක් කියනවා මෙන් ම අමතර දෙයක් ද කිරීම.

ඔහු රූප ඇසුරින් අපට සිතන්නට බල කරනවා. කතාව කියවන්නේ ඉබ්බන්, යතුරු වැනි කුඩා වස්තුවල දෘෂ්ටිකෝණයෙන්. කතාන්දරයේ විශාල ලෝකය සමඟ මේ කුඩා වස්තුවල ලෝකය ද විමුක්ති එක ම අවධාරණයකින් පෙන්වනවා. චිත්‍රපටය ආරම්භ වන්නේ ඉබ්බෙකු සිය හිස කට්ටෙන් එළියට ගෙන ඇවිද යන 'බිහිසුණු' දර්ශනයෙන්. එය අපට පෙන්වන්නේ ස්වභාවධර්මයේ ඇති අත්භූත ජවයක්. චිත්‍රපටයේ එක් තැනක මල් පොහොට්ටු වේගයෙන් පිපී මල් බවට පරිවර්තනය වන දර්ශනයක් පෙන්වනවා. ඒ ඇසුරින් ඔහු මේ අත්භූත විශ්වයේ ඇති විස්මයයි අපට නිරාවරණය කරන්නේ.

එහෙත් එහිදී අපට නිරාවරණය වන්නේ අපගේ ම විශ්වය බව ද පැහැදිලි වෙනවා. මේ පුදුමය තිබෙන්නේ අප අවට. අපගේ යථාර්ථයේ. මෙය අපේ පැවැත්මේ ඇති අත්භූත බව වෙත අප ව රැගෙන යන්නේ මේ නිසා. කෘත්‍රිම වනවා කියා සිතෙන අත්භූත ලෝකයක හදිසියේ එහි ප්‍රධාන චරිතය සිය පියාගේ හෂ්මාවශේෂ දිගහරින දර්ශනය, එහිදී ඇය හඬා වැලපෙන ආකාරය හද කම්පා කරවනවා. විමුක්තිගේ සැබෑ සිතීම යොමු වන්නේ මේ සාංදෘෂ්ටික ගවේෂණය වෙත. එය මුළුමනින් බැඳී තිබෙන්නේ ඔහුගේ කතාවේ නොව එහි රූපමය තෝරා ගැනීම් මත.

මින් අදහස් වන්නේ විමුක්ති මෙයට ලබා දෙන දාර්ශනික විසඳුම සාර්ථක වන්නක් යන්න නොවෙයි. මෙහි ඇතැම් නළුවන් සහ නිළියන් විමුක්තිගේ පැරණි චිත්‍රපටවල බැරෑරුම් චරිත කර තිබෙනවා. සෞම්‍ය ලියනගේ සහ කෞශල්‍යා ප්‍රනාන්දු 'සුළඟ එනු පිණිස' චිත්‍රපටවල හමුවන්නේ ඉතා ස්වාභාවික හමුදා භටයකු සහ ඉතා සාමාන්‍ය ගැමි ස්ත්‍රියක ලෙස. එහෙත් මේ චිත්‍රපටයේදී එම නළු නිළි යුගලය හමුවන්නේ විමුක්තිගේ කතාන්දරයේ එන ප්‍රබන්ධ විශ්වයේ චරිත ලෙස. කෞශල්‍යා ප්‍රනාන්දු එහිදී හනුමාන් අදහන, ගුප්ත දේ කිරීමට හැකියාවක් ඇති ගැහැනියක්. සෞම්‍ය ලියනගේ එහිදී මිය ගිය මිනිසුන් සමඟ කතා කළ හැකි යන්ත්‍රයක් නිර්මාණය කර ඇති 'දාර්ශනිකයෙක්'. විමුක්තිගේ අවසන් දාර්ශනික ප්‍රකාශනය සඳහන් වන්නේ සෞම්‍යගේ දෙබසක් ලෙස.

එහෙත් මේ චරිත මෙහිදී හමුවන්නේ විශ්වසනීය ස්වාභාවික මිනිසුන් ලෙස නොව අත්භූත මිනිසුන් ලෙස. එම මිනිසුන් අයත් වන්නේ ද විමුක්තිගේ ප්‍රබන්ධ ලෝකයට. සෞම්‍ය ලියනගේ වෙත මිය ගිය මිනිසුන්ගේ පින්තූර රැගත් පිරිසක් පැමිණීමේ දර්ශනය මෙය හොඳින් පැහැදිලි කරනවා. බැලූ බැල්මට සිහි ගන්වන්නේ 88-89 කාලයේ සහ උතුරේ අතුරුදන්වූවන්ගේ මවුවරුන් සහ පියවරුන් කළ දේශපාලන ඉල්ලීම. එහෙත් මෙහි එවැනි දේශපාලනයක් නැහැ. මෙය තරමක් විකට ස්වරූපයකින් ඉදිරිපත් වන්නේ මේ නිසා. විමුක්තිගේ උනන්දුව එම අතුරුදන්වූවන්ගේ ප්‍රශ්නය පිළිබඳ දේශපාලන ප්‍රශ්නයක් මතු කිරීමට නොව ඒ වෙනුවට ඔහු උනන්දු වන්නේ මරණයෙන් පසු මළවුන් සහ ජීවත් වන්නවුන් අතර සම්බන්ධය නාටකීයකරණය කර එහි සංවේදී බව නිරාවරණය කර පෙන්වීමට. හදිසියේ එහි ප්‍රධාන චරිතය, සිය මිය ගිය පියා සමඟ කතා කිරීමේදී සංවේදී වන්නේ ඒ නිසා.

එම අර්ථයෙන් සෞම්‍ය මෙන් ම කෞශල්‍යා ද සිටින්නේ මේ අත්භූත යථාර්ථයේ. එහෙත් මේ අත්භූත විශ්වයේ ම මෙයට දාර්ශනික විසඳුමක් තිබෙනවා යැයි ද විමුක්ති ජයසුන්දර අපට පැහැදිලි ව ඉඟි කරනවා. විමුක්තිගේ දාර්ශනික විසඳුම අසාර්ථක යැයි මා සිතන්නේ නැහැ. එය ඔහුගේ කතාන්දරයේ අවසන් නිගමනය වන්නට පුළුවන්. එහිදී සෞම්‍ය ලියනගේ එහි ප්‍රධාන චරිතයට විශ්ව මාතාව නම් වූ ගුප්ත ස්ථානය පෙන්වනවා. එවිට මේ සියල්ල එකක් බවත් අප, මෙයින් වෙන් වූ පැවැත්මක් නොව සමස්තයේ කොටසක් බවත් අප තුළින් දිව්‍යමාන වන්නේ ද මේ විශ්ව මාතාව බවත් ඔහු පවසනවා. මෙය ඉතා ගැටලුකාරී ආකාරයේ සරල 'පෙරදිග වාදයක්' බව පැහැදිලියි.

එය වඩාත් හොඳින් පැහැදිලි වන්නේ මෙලෙස විශ්ව මාතාවගේ බලය අභ්‍යාස කිරීමෙන් මනුෂ්‍ය ලෝකයට පැමිණ ඇති පිටසක්වල ජීවීන්ගේ දියුණු තාක්ෂණය පරාජය කළ හැකි වන නිසා. චිත්‍රපටය අවසන් වන්නේ එහි ප්‍රධාන කාන්තා චරිතයත් කෞශල්‍යා ප්‍රනාන්දුගේ චරිතයත් ඇයගේ සංක්‍රාන්ති ලිංගික දරුවාත් එක් ව මී මැස්සන්ගේ ස්වරයට හඬ පතිත කර එක ම ස්වරයකින් හඬ නැගීමත් සමඟ. එහි අවසානයේ පිටසක්වල යානා පුපුරා යනවා. විශ්ව මාතාවගේ ශක්තිය එකක් ලෙස ගොඩනඟන ආධ්‍යාත්මික ශක්තියකින් එම යානා කුඩු කළ හැකියි. විමුක්ති ජයසුන්දර එම අර්ථයෙන් ප්‍රසන්න විතානගේ සහ අශෝක හඳගමට වඩා ජයන්ත චන්ද්‍රසිරිට සමීප වනවා කියා කිව හැකියි.

එහෙත් ජයන්තගේ නොමැති, විමුක්තිගේ ඇති ශක්තිමත් මානය වන්නේ මේ නිල කතාවට අමතර ව රූපමය සිතීමක් ද එහි තිබීම. ඒ නිසා විමුක්තිගේ සාංදෘෂ්ටික ප්‍රශ්න කිරීම් ඒවායේ දාර්ශනික සංකීර්ණත්වය ද අප වෙත ප්‍රක්ෂේපණය කරනවා. බිහිසුණු ඉබ්බන්, වේගයෙන් පිපෙන මල්, නොනවත්වා අතු සිසාරා යන සුළඟ, තිරය වසා පෙනෙන මිනිස් මුහුණුවල සමීප රූප එය අපට ප්‍රක්ෂේපණය කරනවා. ඒ ඇසුරින් විමුක්ති ජයසුන්දර අප ව හදිසියේ කම්පා කළ හැකියි. හදිසියේ අත්භූත ලෙස සෙලවෙන උයන් කොනක ඇති ගෝනියක් සේ විමුක්ති ජයසුන්දර අප ව සෙලවිය හැකියි. ඒ නිසා ම ඔහු සිය සිතීමේ දාර්ශනික බව ආරක්ෂා කර ගන්නවා.

ඔහුගේ කතාව අපට අඬගසන්නේ භාවනා කරන්නට. එහෙත් ඔහුගේ රූපමය සිතීම එයට වඩා වෙනත් විසඳුම් සෙවීමට ද සිත යොමු කරවනවා. ඔහු දක්ෂ වන්නේ කතාකරුවෙක් ලෙස නොව රූපමය සිතන්නෙක් ලෙස.



මාධ්‍ය වෘත්තිකභාවයේ හෙට දවස

ප්‍රියාන් ආර් විජේබණ්ඩාර

ප්‍රජනමාධ්‍යවේදය යනු නිවැරදි, සාධාරණ සහ වෛෂයික ආකාරයකින් ප්‍රවෘත්ති සහ තොරතුරු රැස් කිරීම, සත්‍යාපනය සහ මහජනතාවට වාර්තා කිරීමේ වෘත්තියයි. එහෙත් මෙහි 'වෘත්තිකභාවය' (Professionalism) පිළිගැනීම වෙනත් නීතිඥ, වෛද්‍ය, ඉංජිනේරු වැනි වෘත්තිකභාවය හා සසඳා බලන විට විවාදපන්න තත්ත්වයක පවතී. එයට හේතුව නම් වෙනත් වෘත්තිකභාවයක් සහිත වෘත්තීන් සේ ම මාධ්‍ය වෘත්තිය සමඟ ද ආචාරධර්ම පද්ධතියක් බැඳී පැවතීම හා සමාජයට වගවීම පැහැදිලි ව පෙනෙන්නට තිබුණ ද එකී ආචාරධර්ම පද්ධතියේ ශක්තිමත්භාවය හෝ වගවීමේ ක්‍රියාවලිය හෝ ප්‍රායෝගික ව අත්දකින්නට නොලැබීමයි. අනෙක් අතට සෙසු වෘත්තිකභාවයන් හා සලකා බලන විට අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ නිශ්චිත ප්‍රමිතියක් ද මෙහි දක්නට නොලැබේ. මෙම තත්ත්වය ලංකාවට ආවේණික සුවිශේෂ තත්ත්වයක් නොව ජාත්‍යන්තර වශයෙන් ද මෙවැනි පසුබිමක් දක්නට ලැබෙන නිසා ම විසඳුම් ප්‍රවණතා පිළිබඳ අවධානය ද ලෝකයේ ම නොඅඩුව දක්නට ලැබෙන බව කිව හැකි ය.

මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය තහවුරු කිරීම යනු හුදෙක් ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම පමණක් නොව, මාධ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි මහජන විශ්වාසය නැවත ගොඩනැඟීමේ අත්‍යවශ්‍ය පියවරකි. වෛද්‍ය, ඉංජිනේරු හෝ නීති ක්ෂේත්‍ර මෙන් මාධ්‍යවේදය ද විධිමත් වෘත්තීය රාමුවකට ඇතුළත් කිරීම පිළිබඳ කතිකාව වර්තමානයේ ඉතා වැදගත් වේ.

මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග සහ යෝජනා කළ 'වරලත් මාධ්‍ය ආයතනයක්' (Chartered Institute of Journalism) ස්ථාපනය කිරීමේ ප්‍රායෝගිකත්වය ශාස්ත්‍රීය ආකෘතියකින් මෙසේ විශ්ලේෂණය කළ හැකි ය.

මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- විධිමත් අධ්‍යාපනය සහ අඛණ්ඩ පුහුණුව (Education & Continuous Training): ක්ෂේත්‍රයට පිවිසෙන අයට මෙන් ම දැනට සිටින මාධ්‍යවේදීන්ට ද සන්නිවේදන න්‍යාය, මාධ්‍ය නීතිය, ගවේෂණාත්මක මාධ්‍යවේදය සහ නව ඩිජිටල් තාක්ෂණය පිළිබඳ අඛණ්ඩ වෘත්තීය පුහුණුවක් ලබාදීම.
- සාධාරණ වැටුප් සහ රැකියා සුරක්ෂිතතාව (Fair Remuneration & Job Security): ආර්ථික වශයෙන් පීඩාවට පත් මාධ්‍යවේදියා පහසුවෙන් දේශපාලන හෝ වාණිජ න්‍යායපත්‍රවලට හෝ නතු විය හැකි ය. එබැවින් වෘත්තීය මට්ටමේ වැටුප් තල සහ සුදුසු සේවා පරිසරයක් සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.
- ස්වාධීන මාධ්‍ය සභා (Independent Media Councils) ශක්තිමත් කිරීම: දේශපාලන අධිකාරියෙන් තොර, ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ස්වයං-නියාමන ආයතන ඔස්සේ පැමිණිලි විභාග කිරීම සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාම.
- තොරතුරු මූලාශ්‍ර සුරැකීමේ නීතිමය ආවරණය: මාධ්‍යවේදීන්ට තම වෘත්තීය රාජකාරිය බියෙන් හෝ සැකයෙන් හෝ තොර ව ඉටු කිරීමට අවශ්‍ය නීතිමය සහ ආරක්ෂිත වටපිටාව රජය තහවුරු කිරීම.

වරලත් මාධ්‍ය ආයතනයක් (Chartered Institute) ස්ථාපනය කිරීම

වෛද්‍යවරුන්ට (SLMC) හෝ වරලත් ගණකාධිකාරිවරුන්ට (CA) හෝ මෙන් මාධ්‍යවේදීන් සඳහා ද 'වරලත් ආයතනයක්' පිහිටුවීම පිළිබඳ අදහසෙහි වාසි මෙන් ම බරපතළ ප්‍රායෝගික අභියෝග ද පවතී.

පක්ෂ ව ඇති තර්ක (වාසි):

- ප්‍රමිතියක් ඇති වීම: මාධ්‍යවේදියෙකු ලෙස ලියාපදිංචි වීමට හෝ වෘත්තියේ නිරත වීමට හෝ නිශ්චිත අවම සුදුසුකම් සහ ආචාරධර්ම පද්ධතියක් අනිවාර්ය කළ හැකි ය.
- වෘත්තීය පිළිගැනීම: 'වරලත් මාධ්‍යවේදියා' යන නාමය ඔස්සේ සමාජය තුළ වෘත්තීය ගරුත්වයක් සහ ඉහළ පිළිගැනීමක් හිමි වේ.
- ස්වයං-විනාශකාරී භාවිත පාලනය වීම: ආචාරධර්ම කඩ කරන හෝ ව්‍යාජ පුවත් පතුරු වන හෝ සාමාජිකයන්ගේ වෘත්තීය බලපත්‍රය අහෝසි කිරීමේ බලය මෙම ආයතනයට පැවතිය හැකි ය.

විපක්ෂ ව ඇති තර්ක (අභියෝග සහ අවදානම්):

- මාධ්‍ය නිදහස සීමා වීම: වෛද්‍ය හෝ නීති හෝ වෘත්තියට වඩා, මාධ්‍යවේදය යනු මූලික මිනිස් අයිතිවාසිකමක් වන 'අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස' මත පදනම් වූවකි. ආයතනයක ලියාපදිංචිවූවන්ට පමණක් ලිවීමට හෝ වාර්තා කිරීමට හෝ ඉඩ දීමෙන් පුරවැසි මාධ්‍යවේදය (Citizen Journalism) සහ නිදහස් මත ප්‍රකාශනය සීමා විය හැකි ය.
- දේශපාලන මෙවලමක් වීමේ අවදානම: යම් හෙයකින් මෙම වරලත් ආයතනය පාලක පක්ෂයේ හෝ දේශපාලන අධිකාරියේ හෝ බලපෑමට නතු වුවහොත්, රජය විවේචනය කරන මාධ්‍යවේදීන්ගේ 'වරලත්භාවය' අහෝසි කර ඔවුන් නිහඬ කිරීමට මෙය මර්දනකාරී මෙවලමක් ලෙස භාවිත කළ හැකි ය.

වරලත් මාධ්‍ය ආයතනයක් ස්ථාපනය කිරීම මූලධර්මයක් ලෙස සුදුසු වුව ද එය ක්‍රියාත්මක කළ යුත්තේ රාජ්‍ය මැදිහත්වීම අවම කෙරෙන, සාපේක්ෂ වශයෙන් ස්වාධීන ආයතනයක් ලෙස

මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය' පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස වූ කෙටුම්පතක් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යවරයා විසින් 2026 ජූනි මස 05 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ තිබේ.

බැව් ක්ෂේත්‍රයේ වැඩි දෙනකුගේ අදහස ය. ඒ සඳහා බොහෝ දෙනකු විසින් වඩාත් ම ප්‍රායෝගික ආකෘතිය ලෙස යෝජනා කරනු ලබන්නේ නීතියෙන් බලපත්‍ර දෙන වරලත් ආයතනයකට වඩා ක්ෂේත්‍රයේ සියලු ම මාධ්‍ය සංවිධාන එකතුවෙන් පිහිටුවා ගන්නා, සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් ලබාගන්නා 'වෘත්තීය විශිෂ්ටතා කේන්ද්‍රයක්' (Center for Professional Excellence) ලෙස එය පවත්වාගෙන යාමයි. එවිට මාධ්‍ය නිදහසට හානියක් නොකර, මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මකභාවය සහ වගකීම ඉහළ නැංවිය හැකි ය. එහෙත් ලාංකේය සංදර්භයක මෙය ප්‍රායෝගික ව ඉටු කළ හැකි ද? යන්න විවාදපන්න ය.

මන්දයත් මාධ්‍ය සංවිධාන යනු සාමාජික ගාස්තු හෝ ස්වාධීන අරමුල්වලින් හෝ පවත්වාගෙන යන සංවිධාන, අයතනික ව්‍යුහ නොවේ. බොහෝ සංවිධාන විදෙස් රාජ්‍ය නොවන සංවිධානවල අරමුදල් හා ව්‍යාපෘති යෝජනා මත යැපෙන තත්ත්වයක් දක්නට ලැබේ. 'ස්වාධීනත්වය' යනු 'පාලක පැළැන්තියෙන්' ස්වාධීන වීම පමණක් නොව ඒවායේ ස්වාධීනත්වයට රාජ්‍ය නොවන සංවිධානවලින් හෝ වෙනත් විදේශ බලවේගවලින් හෝ ඒවායේ න්‍යායපත්‍රවලින් හෝ ස්වායත්තවීම අත්‍යවශ්‍ය ය. අවාසනාවට එවැනි සංවිධාන අවම වීමත් ලාංකේය මාධ්‍ය වෙළෙඳපොළ කුඩා වීම නිසා මාධ්‍ය හිමිකරුවන් වෙනත් විවිධ වෙළෙඳ ව්‍යාපාර හෝ දේශපාලන න්‍යායපත්‍ර හෝ මත කටයුතු කිරීම නිසාත් ආයතනික ස්වාධීනත්වය ද මාධ්‍ය සේවක ස්වාධීනත්වය ද බරපතළ ලෙස උල්ලංඝනය වන අවස්ථා දක්නට ලැබේ. මෙවැනි වාතාවරණයක 'මාධ්‍ය නිදහස' යනු 'මාධ්‍ය හිමිකරුවාගේ නිදහස' නොවන බව ද ලාංකේය සමාජයට වටහාදීම බරපතළ අභියෝගයක් ව පවතී.

කෙසේ වෙතත් මේ වනවිට මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය' පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස වූ කෙටුම්පතක් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යවරයා විසින් 2026 ජූනි මස 05 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ තිබේ. මේ පිළිබඳ යම් සාකච්ඡාවක් ඇති වී තිබීම සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය හදාරන මෙන් ම මෙම විෂය ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන සියලු දෙනාගේ ම අවධානයට ලක් ව තිබීම අතිශය වැදගත් ය. මන්දයත් වඩාත් ප්‍රායෝගික, වඩාත් සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කරගත හැක්කේ මෙවැනි කෙටුම්පතක් පුළුල් සංවාදයට ලක් කිරීමෙන් පමණි.

මෙම කෙටුම්පත වගන්ති 28කින් සහ කොටස් 4කින් සමන්විත වේ. පනත පැනවීමේ අරමුණ ලෙස දක්වා ඇත්තේ 'මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස" බවයි.

01 වන කොටස

වගන්ති අංක 2 සිට 4 දක්වා වේ. මෙම කොටස මඟින් පනතේ මුඛ්‍ය පරමාර්ථය වන 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම' පිළිබඳ ප්‍රතිපාදන දක්වා තිබේ.

02 වන කොටස-

වගන්ති අංක 5 සිට 15 දක්වා වේ. මෙම කොටස මඟින් ආයතනයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ ප්‍රතිපාදන දක්වා තිබේ.

03 වන කොටස-

වගන්ති අංක 16 සිට 17 දක්වා වේ. මෙම කොටස මඟින් 'ආයතනයේ අරමුදල' පිළිබඳ ව දක්වා තිබේ.

04 වන කොටස-

වගන්ති අංක 18 සිට 28 දක්වා වේ. මෙම කොටස මඟින් සමාන්‍ය විධිවිධාන දක්වා තිබේ. ඒ අනුව විනය පරීක්ෂණ පැවැත්වීම, රීති පැනවීම, නියෝග පැනවීම, අර්ථ නිරූපණ ආදිය එහි ඇතුළත් ය.

යෝජිත ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වනු ඇති බවත් මෙය සම්පූර්ණයෙන් ම සමාජිකත්වය මත රඳා පවත්නා ආයතනයක් බවත් රාජ්‍ය ආයතනයක් නොවන බවත් සඳහන් ය. එහෙත් දූෂණ විරෝධී පනත යටතේ උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ම විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු සහ පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු ආයතනයකි. සේවකයන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ වෙනත් අරමුදලකින් හෝ ගෙවන බවක් සඳහන් නොවේ. මෙම ආයතනයේ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකන බවක් හෝ මෙම ආයතනයට මූල්‍ය පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අදාළ වන බවක් හෝ සඳහන් නොවේ. ආයතනයේ අරමුදල් සඳහා රජයෙන් අරමුදල් සපයන බවක් ද සඳහන් නොවේ. ආරම්භක අවස්ථාවේදී හැර අමාත්‍යවරයාගේ බලපෑම සිදුවන්නේ රීති සහ නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීමේදී පමණි. ඒ අනුව මෙම ආයතනයේ නීතිමය ස්වරූපය පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත රාජ්‍ය ආයතනයක් සහ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත රාජ්‍ය නොවන සංවිධානයක් (ආයතනයක්) අතර මැද තත්ත්වයක පවතී. කෙසේ වෙතත් මෙය 'පනතක්' ලෙස වර්ධනය වීමේදී යම් යම් දේ ඇතුළත්වීමට හෝ යම් යම් දේ බැහැරවීමට හෝ ඉඩ ප්‍රස්ථා පවතින බව පමණක් සටහන් කළ යුතු වේ.

රෝම වික්‍රමය

වර්නන් ගුණසේකර

එක් සුවදායී රෝම සැඳෑවක '2026 රෝම ඩයමන්ඩ් ලීග්' තරග බිමේ ශ්‍රී ලංකා කොඩිය ලෙලවමින් රුමේෂ් තරංග පතිරගේ ඔහුගේ හෙල්ල මීටර් 92.62ක් දුරට විසි කළේ ඉතිහාසගත වෙමින්. ඒ හපන්කමත් සමඟ ඔහු ලෝක විශිෂ්ටයන්ගේ ඉහළ පෙළැන්තියට ප්‍රවිෂ්ටයක් ලබා ගත්තේ ලෝක ශ්‍රේණිගත කිරීම්වල අංක 3 දක්වා ඉහළට පිවිසෙමින්.

රෝම ඩයමන්ඩ් ලීගය විමතියට පත් කරමින් රුමේෂ් සටහන් කළ මේ දුර ප්‍රමාණය 2026 වසරේ මෙතෙක් වාර්තා වූ ලෝකයේ හොඳම දක්ෂතාව වනවා. පිරිමි හෙල්ල විසි කිරීමේ ලෝක වාර්තාව මීටර් 98.48ක් වන අතර එය තවමත් උසුලන්නේ චෙක් සමූහාණ්ඩුවේ යාන් ජෙලස්නි.

කළුතර ප්‍රදේශයෙන් එන 23 හැවිරිදි රුමේෂ්ගේ මේ රෝම වික්‍රමයෙන් ඔහු ව හොඳම දක්ෂතාව අතින් ලෝක ලැයිස්තුවේ එදා මෙදාතුර 08 වැනි ස්ථානයට ඔසවා තබනවා. ඔහු සටහන් කළ මේ දුර ප්‍රමාණය දැන් පාකිස්තාන ඔලිම්පික් ශූර අර්ෂාඩ් නදීම් 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදී වාර්තා කළ මීටර් 92.97ට පසුව ආසියාවේ දෙවැනියට හොඳම දක්ෂතාව වී තිබෙනවා.

අර්ෂාඩ් නදීම් හා ඉන්දියාවේ නීරාජ් චොප්රා යන ප්‍රතිවාදීන් සමඟ සසඳන විට රුමේෂ්ගේ මීටර් 92.62ට තවත් බොහෝ විශේෂත්ව එක්වනවා. හොඳම දක්ෂතාව අතින් රුමේෂ් 08 වැනි ස්ථානයේ පසුවෙද්දී නදීම් 06 වැනියට සිටියත් චොප්රා සිටින්නේ 26 වැනි ස්ථානයේ (මීටර් 90.23). මීට අමතර ව රුමේෂ්ගේ දක්ෂතාව නවීන යුගයේ හොඳම හෙල්ල විසි කිරීම්වල 21 වැනි ස්ථානයේ තිබෙනවා. මෙහිදී නදීම්ගේ හොඳම දක්ෂතාව 17 වැනි ස්ථානයට ද චොප්රාගේ හොඳම දක්ෂතාව 116 වැනි ස්ථානයට ද පත් ව තිබෙනවා.

රුමේෂ්ට ඉහළින් ලෝක ශ්‍රේණිගත කිරීම්වල අංක 01ට සිටින්නේ ජර්මනියේ ජූලියන් වෙබර් (මීටර් 91.51). ග්‍රෙනාඩාවේ ඇන්ඩර්සන් පීටර්ස් (මීටර් 89.53) අංක 02ට ශ්‍රේණිගත ව සිටිනවා.

ලෝකයේ හෙල්ල විසි කිරීමේ ඉහළම 20 දෙනා අතරේ ළාබාලතම ක්‍රීඩකයා වන රුමේෂ් අත්කරගෙන සිටින්නේ ශ්‍රී ලාංකික මලල ක්‍රීඩකයෙකු එදා මෙදාතුර ලබා ගත් ඉහළ ම ලෝක ශ්‍රේණිය.

හෙල්ල විසි කිරීම පිරිමි ඉසව්වේදී ආසියාතිකයෙකු මෙතෙක් විසි කර තිබෙන වැඩි ම දුර ප්‍රමාණ හතරෙන් නදීම් (මීටර් 92.97 - අගෝස්තු 2024) හා රුමේෂ් (මීටර් 92.62 - ජූනි 2026)ට පසුව සිටින්නේ තායිවානයේ චාඕ ට්සන් චෙං (මීටර් 91.36 - අගෝස්තු 2017). චොප්රා (මීටර් 90.23 - අගෝස්තු 2024) සිටින්නේ සිව් වැනියට.



වෙංගේ දුර ප්‍රමාණය එම වකවානුව හා ඔහුගේ හොඳම දක්ෂතාව අනුව බැහැරින් තිබුණත් නදීම් හා චොප්රා මේ ක්‍රීඩාවේ සැහෙන කලක් තිස්සේ දස්කම් පාමින් සිටිනවා. ලෝක හෙල්ල විසි කිරීමේ තරග බිම පසුගිය දශකයෙන් අඩක් ම මේ දෙදෙනා අයිති කරගෙන තිබෙනවා. නීරාජ් චොප්රාට ඔලිම්පික් රන් හා රිදී පදක්කම් ද ලෝක ශූරතාවලියේ රන් හා රිදී පදක්කම් ද ආසියානු රන් පදක්කම් දෙකක් හා පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උලෙළේ රන් පදක්කමක් ද තිබෙනවා. අර්ෂාඩ් නදීම් සතු ව ඔලිම්පික් රන් පදක්කමක්, ලෝක ශූරතා රිදී පදක්කමක්, ආසියානු ලෝකඩ පදක්කමක් හා පොදුරාජ්‍ය මණ්ඩල රන් පදක්කමක් තිබෙනවා. මීට කලින් යුරෝපීය කේන්ද්‍රගත හෙල්ල විසි කිරීමේ ලෝකය මේ අපූර්ව ක්‍රීඩකයන් දෙදෙනා ඉන්දියානු උපමහාද්වීපය දිසාවට හරවා ගත්තා.

එහෙත් දැන් ඔවුන්ගේ ද්විත්ව රංගනයට බරපතළ තර්ජනයක් එල්ල වී තිබෙන අතර එය පැමිණෙන්නේ ද ඒ උපමහාද්වීපයෙන් ම වීම විශේෂත්වයක්. පසුගිය වසර කිහිපයේ රුමේෂ්ගේ දියුණුව සිත්ගන්නා වූවක්. එයින් නදීම්ගේ සුපිරි මට්ටම දක්වා වූ වේගී නැඟීම පිළිඹිබු වනවා. 18 වැනි වියේදී ම මීටර් 80 සලකුණ පසු කරමින් හා එකල යොවුන් ලෝක වාර්තාවක් ව තිබූ මීටර් 86.48 වයස අවුරුදු 19දී බිඳ දමමින් (අවුරුදු 20න් පහළ ලෝක ශූරතාවලිය) චොප්රා ඔහු පටන් ගත් තැන් පටන් ම සුපිරි තත්ත්වයේ සිටියදී ඊට සාපේක්ෂ ව නදීම් හා රුමේෂ්ට සුපිරි මට්ටමට පිවිසීම සඳහා වැඩි කාලයක් ගත ව තිබෙනවා.

උදාහරණයක් වශයෙන්, චොප්රා ජයග්‍රහණය කළ අවුරුදු 20න් පහළ ලෝක ශූරතාවලියට නදීම් අවම වශයෙන් සහභාගිත්වයේ සුදුසුකමක් හෝ ලැබුවේ නැහැ. 2016 වසරේ පැවති එම තරගාවලියේ ලෝකඩ පදක්කම හිමිකර ගත්තේ වර්තමානයේ ලොව අංක 2ට ශ්‍රේණිගත ව සිටින ඇන්ඩර්සන් පීටර්ස්. රුමේෂ් ඔහු සහභාගි වූ 2022 වසරේ අවුරුදු 20න් පහළ ලෝක ශූරතාවලියේ අවසාන තරගයේදී මීටර් 69.98ක් පමණක් සටහන් කරමින් පත් වූයේ හත් වැනි ස්ථානයට. නදීම් ප්‍රථම වතාවට මීටර් 80ක් දුරට හෙල්ල විසි කළේ 2018 වසරේ. ඒ වන විට ඔහුගේ වයස වී තිබුණේ අවුරුදු 21ක්. එතැන් සිට ඔහු වේගයෙන් වර්ධනය වී තිබෙනවා.



රුමේෂ් තරංග පතිරගේ

රුමේෂ්ගේ හොඳම දක්ෂතා පහෙන් හතරක් ම වාර්තා වී තිබෙන්නේ 2026 වසරේ මාස තුනක පමණ කාලයේ. ඔහු අප්‍රේල් මාසයේදී මීටර් 89.28ක් ද මාර්තුවේ මීටර් 89.37ක් ද දැන් මීටර් 92.62ක් ද සටහන් කර තිබෙන්නේ ප්‍රශංසනීය ප්‍රගතියකින්.

රුමේෂ් පළමු වරට මීටර් 80 සලකුණ ජය ගත්තේ 2024 වසරේ. ඒ, වයස 21ක් ව තිබියදී කලින් හොඳම දක්ෂතාව ලෙස තිබූ මීටර් 76.45 සිට කෙළින් ම මීටර් 85.45ක් දුරට හෙල්ල පියාසර කරවමින්. ඊට දෙවසරකට පසුව ඔහු සිටින තත්ත්වය රෝම ඩයමන්ඩ් ලීගයේදී ප්‍රදර්ශනය වී තිබෙනවා

.

දෙදෙනාගේ සමාන බව තවත් ගැඹුරට විහිදෙනවා. නදීම් තරග වැදුණු මුල් වකවානුවේදී ඔහුට තරගාවලි සඳහා සහභාගි වීමට විශාල පිරිසකගේ මුදල් ආධාර අවශ්‍ය වුණා. ඉතා සීමිත පහසුකම්වලින් සෑහීමට පත් වීමට සිදුවුණා. මේ අතර රුමේෂ්ට ඔහුගේ පුහුණුව ප්‍රධාන වශයෙන් ඔහුගේ ගුවන් හමුදා වැටුපෙන් සහ ඔහු 2025 වසරේදී තරග බිමට කඩා වැදීමට පෙර රටේ තිබුණු එක ම සින්තටික් ධාවන පථයෙන් කළමනාකරණය කර ගැනීමට සිදු වුණා. පෙර වසරේ ඔහුගේ මීටර් 80ට වැඩි දුර ප්‍රමාණය වූ ඔහුවත් නොසිතූ මීටර් 85.45 දුර වාර්තා වුණේ ඔහු අනුන්ගෙන් ඉල්ලා ගත් හෙල්ලකින්. ඉන්පසුව පමණයි ඔහුට ඔහුගේ ම 'නෝඩික් වල්හාලා' නමැති සුපිරි තත්ත්වයේ හෙල්ලකින් පුහුණු වීමට හැකි ව තිබෙන්නේ.

හෙල්ල විසි කරන ශෛලිය අතින් රුමේෂ් වඩාත් සමාන වන්නේ නදීම්ට වඩා චොප්රාට. 2019 වසරේදී ශ්‍රී ලංකාව පුරා දියත් කෙරුණු සහජ කුසලතා සොයා යාමකදී පැයට කිලෝමීටර් 134ක වේගයක් සටහන් කරමින් වර්තමාන ශ්‍රී ලංකා ක්‍රීඩක එෂාන් මාලිංගට පිටුපසින් අවුරුදු 18න් පහළ අංශයේ දෙවැනියට වේගවත් ම කාලය වාර්තා කර, කලක් ප්‍රබල තරුණ වේග පන්දු යවන්නෙකු ව සිටි රුමේෂ්ගේ හෙල්ල විසි කරන දිවීමේ ස්වාභාවික රිද්මයක් ගැබ් ව තිබෙනවා.

රුමේෂ්ගේ හොඳම දක්ෂතා පහෙන් හතරක් ම වාර්තා වී තිබෙන්නේ 2026 වසරේ මාස තුනක පමණ කාලයේ. ඔහු අප්‍රේල් මාසයේදී මීටර් 89.28ක් ද මාර්තුවේ මීටර් 89.37ක් ද දැන් මීටර් 92.62ක් ද සටහන් කර තිබෙන්නේ ප්‍රශංසනීය ප්‍රගතියකින්.

අනෙක් දෙදෙනාගෙන් රුමේෂ් තරංගගේ කැපී පෙනෙන කාරණය වී තිබෙන්නේ ඔහු, ඔහුගේ ක්‍රීඩා දිවියේ මෙතරම් ඉක්මනට මීටර් 90 සීමාව පසු කිරීම. 2022 වසරේ පොදුරාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උලෙළේදී මීටර් 90.18ක් සටහන් කරද්දී නදීම්ගේ වයස අවුරුදු 25ක් ව තිබුණා. චොප්රා එය කළේ පසුගිය වසරේ පමණයි. ඒ, 28 වැනි වියේදී. ආසියානු වාර්තාවට වඩා රුමේෂ් රෝමයේදී සටහන් කළ දුර අඩු ව තිබෙන්නේ සෙන්ටිමීටර් 35කින් පමණයි.

නායකත්වයක දෘශ්‍ය ප්‍රකාශනය

රටක ශක්තිය ඇගේ මුහුදු සීමා ආරක්ෂා කරන නාවික බලයෙන් පමණක් නොව, ලෝකය සමඟ ඇය සම්බන්ධ කරන වරායෙන් ද මැන බලනවා. ශ්‍රී ලංකා නාවික හමුදාවට අලුතින් එක්වූ 'LN' සමුද්‍රවිජය නෞකාව නිල වශයෙන් සේවයට එක් කිරීමේ උත්සවයේදී ජනාධිපතිවරයා ගෞරව ආචාරය භාර ගන්නා මේ මොහොත, සාමාන්‍ය හමුදා උත්සවයක සටහනක් පමණක් වන්නේ නැහැ.

රූපයේ පසුබිමේ නැඟී සිටින කොළඹ වරායේ දැවැන්ත බහාලුම් දොඹකර සංකේතවත් කරන්නේ ශ්‍රී ලංකාවේ වෙළෙඳාම, ජාත්‍යන්තර සම්බන්ධතා සහ ආර්ථික පුනරුදය. රටේ ආරක්ෂාව, විනය සහ රාජ්‍ය ස්ථාවරත්වය ඉදිරිපසින් පෙනෙන නාවික සංගීත කණ්ඩායම සහ ගෞරව ආචාරය නිරූපණය කරනවා.

මේ ඡායාරූපයේ ජනාධිපතිවරයා සිටින්නේ ආරක්ෂාව සහ ආර්ථිකය අතර සම්බන්ධකයක් ලෙස. නූතන නායකත්වය යනු හමුදාවට අණ දීම පමණක් නොව රටක් ආර්ථික සුරක්ෂිතභාවය සහ ජාත්‍යන්තර විශ්වාසය වෙත යොමු කිරීම ද බව එය අපට මතක් කර දෙනවා.

මෙය නෞකාවක් සේවයට එක් කිරීමේ අවස්ථාවක් පමණක් නොව 'ආරක්ෂාව මත ගොඩනැඟෙන ආර්ථික අනාගතයකට රට යොමු කරන නායකත්වයක' දෘශ්‍ය ප්‍රකාශනයක්.

සටහන සහ ඡායාරූපය

අනුරුද්ධ ලොකුහපුආරච්චි



දෙසතිය පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-